# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1982/34 - 2016 සැප්තැම්බර් මස 01 වැනි බ්‍රහස්පතින්දා - 2016.09.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් හා විගණන ප්‍රමිති පනත

**42 (ඇ) උපවගන්තිය යටතේ කරනු ලබන පළකිරීම්**

ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනය (මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) වෙත පැවරී ඇති බලතල අනුව, 1995 අංක 15 දරන ශ්‍රී ලංකා ගිණුම් සහ විගණන ප්‍රමිති පනතේ අරමුණ සඳහා මේ සමඟ පළකර ඇති ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 16 කල්බදු, ආයතනය විසින් සම්මත කර ඇත. මෙම සංශෝධන වර්ෂ දෙදහස් දහනවයේ ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භ වන කාලපරිච්ඡේද ආවරණය කෙරෙන මූල්‍ය ප්‍රකාශන සඳහා බලාත්මක කළයුතුයි. පෙර ව්‍යවහාර කිරීමට ඉඩදෙයි.

ආයතනයේ පාලක සභාවේ අණ පරිදි,

අරුණ අල්විස්,
ලේකම්.

2016 සැප්තැම්බර් 01 දින,
කොළඹ 07,
මලලසේකර මාවත,
අංක 30 A,
ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරි ආයතනයේ දී ය.

# ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 16

## *කල්බදු*

**පටුන**


| | ඡේද |
|---|---|
| **හැඳින්වීම** | |
| **අරමුණ** .................................................................................... | **1** |
| **විෂය පථය** .................................................................................... | **3** |
| **බැහැරලීම් හඳුනාගැනීම** .................................................................. | **5** |
| **කල්බද්දක් හඳුනාගැනීම** .................................................................. | **9** |
| **ගිවිසුමක සංරචක වෙන්කර දැක්වීම** ................................................... | **12** |
| කල්බදු ගැනුම්කරු.................................................................................. | 13 |
| කල්බදු දීමනාකරු.................................................................................. | 17 |
| **කල්බදු වාරය**.................................................................................... | **18** |
| **කල්බදු ගැනුම්කරු**.............................................................................. | **22** |
| **හඳුනාගැනීම**.................................................................................... | **22** |
| **මැනීම**.................................................................................... | **22** |
| මුල්වරට මැනීම.................................................................................. | 23 |
| පසුකාලීනව මැනීම.................................................................................. | 29 |
| **ඉදිරිපත් කිරීම**.................................................................................... | **47** |
| **හෙළිදරවු කිරීම**.................................................................................... | **51** |
| **කල්බදු දීමනාකරු**.................................................................................... | **61** |
| **කල්බදු වර්ගීකරණය**.................................................................................... | **61** |
| **මූල්‍ය කල්බදු**.................................................................................... | **67** |
| හඳුනාගැනීම සහ මැනීම.................................................................................. | 67 |
| **මෙහෙයුම් කල්බදු**.................................................................................... | **81** |
| හඳුනාගැනීම සහ මැනීම .................................................................................. | 81 |
| ඉදිරිපත් කිරීම.................................................................................. | 88 |
| **හෙළිදරවු කිරීම**.................................................................................... | **89** |
| මූල්‍ය කල්බදු.................................................................................. | 93 |
| මෙහෙයුම් කල්බදු.................................................................................. | 95 |

**විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙනු........................................................................ 98**

**වත්කමක පැවරීම විකුණුමක්ද යන්න තක්සේරු කිරීම.......................................... 99**

වත්කම පැවරීම විකිණුමකි.............................................................................. 100

වත්කම පැවරීම විකුණුමක් නොවේ..................................................................... 103

**පරිශිෂ්ඨ**

අ. නිර්වචිත පද

ආ. ව්‍යවහාර කිරිමේ මඟ පෙන්වීම්

ඇ. බලපැවැත්වෙන දිනය සහ සංක්‍රාන්තිය

ඈ. වෙනත් ප්‍රමිතවලට සංශෝධන

# ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත - SLFRS 16

## *කල්බදු*

ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත SLFRS 16 - *කල්බදු*, 1 - 103 ඡේදවල සහ අ - ඈ දක්වා පරිශිෂ්ඨවල නියම කර ඇත. සියලුම ඡේදවලට සමාන වූ අධිකාරි බලයක් ඇත. ඡේදවල **තද පැහැයෙන්** දක්වා ඇත්තේ ප්‍රධාන මූලධර්මයයි. ප්‍රමිතිය තුළ පළමුවරට ප්‍රකාශ කර ඇති "අ"පරිශිෂ්ඨය තුළ නිර්වචිත පද *ඇල අකුරින්* දී තිබෙන අතර අනෙකුත් පද සඳහා වන නිර්වචන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත සඳහා වන පාරිභාෂිත ශබ්දමාලාවේ දක්වා තිබේ. SLFRS 16 හි අරමුණ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතයන්ට පූර්විකාව සහ මූල්‍ය වාර්තා පිළියෙළ කිරීම සහ ඉදිරිපත් කිරීම සඳහා වන ආකෘතිමය රාමුව සම්බන්ධ කොට කියවිය යුතුය. විශේෂිත මාර්ගෝපදේශයක් නොමැති විට, ගිණුම්කරණ ප්‍රතිපත්ති තෝරා ගැනීම සහ ව්‍යවහාර කිරීම සඳහා LKAS - 8 ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි පදනමක් සපයයි.

## අරමුණ

1. **කල්බදු හඳුනාගැනීම, මැනීම, ඉදිරිපත් කිරීම සහ හෙළිදරව් කිරීම සඳහා මූලධර්ම මෙම ප්‍රමිතියෙන් නියම කරයි. කල්බදු දීමනාකරු සහ කල්බදු ගැනුම්කරු ඔවුන්ගේ ගණුදෙනුවලට අදාළ තොරතුරු සාධාරණ ලෙස නිරූපණය වන බව සහතික කිරීම අරමුණ වේ. අස්තිත්වයක මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ මත තිබෙන කල්බදුවල බලපෑම මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට තක්සේරු කිරීම සඳහා මෙම තොරතුරු පදනමක් සපයයි.**

2. අස්තිත්වයක් මෙම ප්‍රමිතිය ව්‍යවහාර කරන විට ගිවිසුම්වල නියමයන් සහ කොන්දේසි සහ සියළුම අදාල කරුණු සහ සිදුවීම් සලකා බැලිය යුතු වේ. අස්තිත්වයක් මෙම ප්‍රමිතිය සමාන ලක්ෂණ සහ ඒ හා සමාන සිදුවීම් සහිත ගිවිසුම්වලට ඒකාකාරීව ව්‍යවහාර කළයුතු වේ.

## විෂය පථය

3. අස්තිත්වයක් පහත සඳහන් දෑ හැර උපකල්බද්දක ඇති වත්කම් පාවිච්චි කිරීමේ හිමිකමේ කල්බදු ඇතුලත්ව සියළුම කල්බදුවලට මෙම ප්‍රමිතිය ව්‍යවහාර කළයුතු වේ.

   (අ) ඛනිජ වර්ග, තෙල්, ස්වභාවික ගෑස් සහ ඒ හා සමාන යලි උත්පාදනය නොවන ආකාරයේ සම්පත් සඳහා වූ කල්බදු;

   (ආ) LKAS 41 - කල්බදු ගැනුම්කරුවෙක් තබා ගන්නා කෘෂිකර්මය විෂය පථය ඇතුලත් ජීව විද්‍යාත්මක වත්කම්වල කල්බදු;

   (ඇ) IFRIC 12 - සේවා සහන එකඟවීම් විෂය පථයට ඇතුලත් සේවා සහන එකඟවීම්;

   (ඈ) SLFRS 15 - ගණුදෙනුකරුවන් සමඟ ඇතිකරගත් ගිවිසුම්වල අයභාරය විෂයපථයට ඇතුලත් කල්බදු දීමනාකරුවෙක් ප්‍රදානය කරන ලද බුද්ධිමය දේපළවල බලපත්‍ර; සහ

   (ඉ) චලන රූප, චිත්‍රපට, වීඩියෝපටිගත කිරීම්, නාට්‍ය, අත්පිටපත්, ස්වාධිකාරය සහ ප්‍රකාශන අයිතීන් වැනි අයිතමයන් සඳහා LKAS 38 - අස්පෘශ්‍ය වත්කම් විෂය පථයට ඇතුලත් බලපත්‍ර ගිවිසුම් යටතේ කල්බදු ගැනුම්කරුවෙක් තබා ගන්නා අයිතීන්.

4. 3 (ඉ) ඡේදයේ විස්තර කර ඇති දෑ හැර, අස්පෘශ්‍ය වත්කම්වල කල්බදුවලට කල්බදු ගැනුම්කරුවෙක් මෙම ප්‍රමිතිය ව්‍යවහාර කිරීම කළහැකි නමුත් අත්‍යවශ්‍යම නොවේ.

## නිදහස් වීම් හඳුනාගැනීම (ආ 3 - ආ 8 ඡේද)

5. 22-49 ඡේදවල අවශ්‍යතාවයන් අනුව, පහත සඳහන් දෑ ව්‍යවහාර නොකිරීමට කල්බදු ගැනුම්කරුවෙකුට තෝරාගත හැකියි.

   (අ) කෙටිකාලීන කල්බදු; සහ

   (ආ) අඩු වටිනාකමකින් යුක්ත පදනම් වූ වත්කම් සඳහා කල්බදු (ඈ 3 - ආ 8 හි විස්තර කර ඇති පරිදි)

6. කෙටිකාලීන කල්බදු හෝ අඩුවටිනාකම සහිත වත්කම්වල කල්බදුවලට 22 සිට 49 දක්වා ඡේදවල අවශ්‍යතා ව්‍යවහාර නොකිරීමට කල්බදු ගැණුම්කරුවෙක් තෝරා ගනියි නම්, එම කල්බදු ආශ්‍රිතව ඇති කල්බදු ගෙවීම්, කල්බදු වාරය හරහා සරල මාර්ග ක්‍රමය මත හෝ වෙනත් ක්‍රමවත් ක්‍රමයට කල්බදු ගැනුම්කරු හඳුනා ගතයුතුයි. වෙනත් ක්‍රමවත් පදනමකින් කල්බදු ගැනුම්කරුගේ ප්‍රතිලාභ ලැබෙන ආකාරය වඩාත් හොඳින් නිරූපණය වන්නේ නම්, කල්බදු ගැනුම්කරු එම පදනම ව්‍යවහාර කළයුතු වේ.

7. (අ) කල්බදු සංශෝධනයක් තිබේ නම්; හෝ

(ආ) කල්බදු වාරයේ ඕනෑම වෙනසක් තිබේ නම් (උදාහරණ ලෙස කල්බදු ගැනුම්කරු කල්බදු වාරය නිර්ණය කිරීමේදී කලින් ඇතුලත් නොකළ විකල්පයක් ක්‍රියාත්මක කිරීම),

6 වැනි ඡේදය ප්‍රකාරව කෙටිකාලීන කල්බදු සඳහා කල්බදු ගැනුම්කරුවෙක් ගිණුම්ගත කරයි නම්, මෙම ප්‍රමිතියේ අරමුණු සඳහා එම කල්බද්ද අළුත් කල්බද්දක් ලෙස කල්බදු ගැනුම්කරු සැලකිය යුතු වේ.

8. පාවිච්චි කිරීමේ අයිතිය සම්බන්ධ කර ගන්නා පදනම් වූ වත්කමේ පන්තිය සඳහා කෙටිකාලීන කල්බදු තෝරාගැනීම සිදුකළ යුතු වේ. පදනම් වූ වත්කමේ පන්තියක් යනු එක හා සමාන ස්වභාවයේ සහ අස්තිත්වයක මෙහෙයුම් භාවිතයෙන් කාණ්ඩ කිරීමයි. අඩු වටිනාකම තිබෙන පදනම් වූ වත්කමේ කල්බදු සඳහා තෝරාගැනීම කල්බද්දෙන් කල්බද්ද පදනම මත සිදු කිරීමට පුළුවනි.

## කල්බද්දක් හඳුනාගැනීම (ආ9 - ආ 33 ඡේද)

**9. ගිවිසුමක ආරම්භයේදී, ගිවිසුම කල්බද්දකින් සමන්විත නැද්ද අස්තිත්වයක් තක්සේරු කළයුතු වේ. ප්‍රතිෂ්ඨාව සඳහා හුවමාරුවේදී කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමක් භාවිතා කිරීම පාලනය කිරීමට අයිතිය ගිවිසුමකින් පවරා දෙන්නේ නම්, ගිවිසුම කල්බද්දකින් සමන්විත වේ. ගිවිසුමක් කල්බද්දකින් සමන්විත දැයි තක්සේරු කිරීමට මඟ පෙන්වීම් ආ9 සිට ආ 31 දක්වා ඡේදවල නියම කරයි.**

10. හඳුනාගත් වත්කමක් පාවිච්චි කිරීමේ නියම කළ ප්‍රමාණය කාලපරිච්ඡේදයකින් විස්තර කිරීමට හැකිය. (උදාහරණයක් ලෙස උපකරණ අයිතමයක් නිෂ්පාදනයට භාවිතා කිරීමෙන් නිපදවන ඒකක ගණන).

11. ගිවිසුමක කොන්දේසි සහ නියමයන් වෙනස් වන්නේ නම් පමණක් ගිවිසුමක් කල් බද්දකින් සමන්විත යන්න අස්තිත්වයක් යළි තක්සේරු කළයුතු වේ.

## ගිවිසුමක සංරචක වෙන්කර දැක්වීම

12. ගිවිසුමක් කල්බද්දකින් සමන්විත වීම සඳහා, 15 වැනි ඡේදයේ ඇති ප්‍රායෝගික භාවිතය ව්‍යාවහාර කරන්නේ නම් හැර, අස්තිත්වයක් ගිවිසුම ඇතුළත ගිවිසුමේ කල්බදු නොවන සංරචකවලින් වෙනමම, කල්බද්දක් ලෙස ගිවිසුම ඇතුළත එක් එක් කල්බදු සංරචක සඳහා ගිණුම්ගත කළයුතු වේ. අස්තිත්වයක් ගිවිසුමක සංරචක වෙන් කර දැක්වීම සඳහා මඟ පෙන්වීම ආ 32 සිට ආ 33 දක්වා ඡේදවල නියම කරයි.

***කල්බදු ගැනුම්කරු***

13. කල්බදු සංරචකයකින් සහ එකක් හෝ ඊට වැඩි අමතර කල්බදු හෝ කල්බදු නොවන සංරචකවලින් සමන්විත ගිවිසුමක් සඳහා, කල්බදු සංරචකයේ සාපේක්ෂව වෙනස්ව පෙනෙන මිල සහ කල්බදු නොවන සංරචකවල වෙනස්ව පෙනෙන මිලෙහි එකතුව පදනම් කරගෙන , එක් එක් කල්බදු සංරචකවලට ගිවිසුමේ ප්‍රතිෂ්ඨාව කල්බදු ගැනුම්කරු බෙදා හැරිය යුතු වේ.

14. කල්බදු දීමනාකරුගේ මිල පදනම් කරගෙන කල්බදු සහ කල්බදු නොවන සංරචකවල සාපේක්ෂව වෙනස්ව පෙනෙන මිල නිශ්චය කළයුතු හෝ ඒ හා සමාන සැපයුම්කරු එම සංරචකය සඳහා හෝ ඒ හා සමාන සංරචකයකින් වෙනමම අස්තිත්වයකින් අය කරනු ලැබේ. නිරීක්ෂණය කරන ලද වෙනස්ව පෙනෙන මිල පහසුවෙන් ලබා ගත නොහැකි නම්, නිරීක්ෂණය කරන ලද තොරතුරු භාවිතය උපරිම කිරීමෙන්, කල්බදු ගැනුම්කරු වෙනස්ව පෙනෙන මිල ඇස්තමේන්තු කළයුතු වේ.

15 ප්‍රායෝගික භාවිතා කිරීමේදී, කල්බදු සංරචක තුලින් කල්බදු නොවන සංරචක වෙන්කර නොගැනීමට පදනම් වූ වත්කමේ පන්තිය මඟින් කල්බදු ගැනුම්කරුට තෝරාගත හැකි අතර, ඒ වෙනුවට එක් එක් කල්බදු සංරචක සඳහා සහ ඕනෑම ආශ්‍රිත කල්බදු නොවන සංරචක සඳහා තනි කල්බදු සංරචකයක් ලෙස ගිණුම්ගත කරයි. කල්බදු ගැනුම්කරුවෙක් SLFRS 9 - මූල්‍ය සාධන පත්‍රවල 4.3.3 ඡේදයේ නිර්ණායක සම්පූර්ණ වන නිහිත ව්‍යුත්පන්නවලට මෙම ප්‍රායෝගික භාවිතය ව්‍යවහාර නොකළයුතු වේ.

16. 15 ඡේදය ඇති ප්‍රායෝගික භාවිතය ව්‍යවහාර කිරීම හැර, කල්බදු ගැනුම්කරුවෙක් වෙනත් අදාලවන ප්‍රමිත ප්‍රකාරව කල්බදු නොවන සංරචක සඳහා ගිණුම්ගත කළයුතු වේ.

**කල්බදු දිමනාකරු**

17. කල්බදු සංරචකයක් සහ එකක් හෝ ඊට වැඩි අමතර කල්බදු හෝ කල්බදු නොවන සංරචකවලින් සමන්විත ගිවිසුමක් සඳහා, SLFRS 15 හි 73 සිට 90 ඡේද ප්‍රකාරව ගිවිසුමක ප්‍රතිෂ්ඨාව කල්බදු ගැනුම්කරුවෙක් බෙදාහැරිය යුතු වේ.

## කල්බදු වාරය (ආ 34 - ආ 41 ඡේද)

18. අස්තිත්වයක් කල්බද්දක අවලංගු කළ නොහැකි කාලපරිච්ඡේදය ලෙස කල්බදු වාරය පහත සඳහන් දෙකම සහිතව නිශ්චය කළයුතු වේ.

(අ) කල්බදු ගැනුම්කරු කල්බද්ද දීර්ඝ කිරීමේ විකල්පය ක්‍රියාත්මක කිරීමට තර්කානුකූලව නිශ්චිත නම් එම විකල්පය මඟින් ආවරණය වන කාලපරිච්ඡේද; සහ

(ආ) කල්බදු ගැනුම්කරු කල්බද්ද අවසන් කිරීමේ විකල්පය ක්‍රියාත්මක නොකිරීමට තර්කානුකූලව නිශ්චිත නම් එම විකල්පය මඟින් ආවරණය වන කාලපරිච්ඡේද.

19. කල්බද්දක් දීර්ඝ කිරීමට විකල්පයක් ක්‍රියාත්මක කිරීමට හෝ කල්බද්දක් අවසන් කිරීමට විකල්පයක් ක්‍රියාත්මක නොකිරීමට තර්කානුකූලව නිශ්චිත දැයි තක්සේරු කිරීමේදී, ආ 37 සිට ආ 40 දක්වා ඡේදවල විස්තර කර ඇති පරිදි, කල්බද්ද දීර්ඝ කිරීමට විකල්පය ක්‍රියාත්මක කිරීමට හෝ කල්බද්ද අවසන් කිරීමට විකල්පය ක්‍රියාත්මක නොකිරීමට, කල්බදු ගැනුම්කරු සඳහා ආර්ථික පෙළඹවීමක් ඇති කිරීමට සියළුම කරුණු සහ සිදුවීම් අස්තිත්වයක් සලකා බැලියයුතු වේ.

20. කල්බදු ගැනුම්කරුවෙක් විකල්පය දීර්ඝ කිරීමක් ක්‍රියාත්මක කිරීමට හෝ විකල්පය අවසන් කිරීමක් ක්‍රියාත්මක නොකිරීමට තර්කානුකූලව නිශ්චිත වේදැයි තත්වයෙහි සැලකියයුතු සිද්ධියක් සිදුවීම හෝ සැලකිය යුතු වෙනසක් සිදුවීම මත නැවත තක්සේරු කළයුතු වේ.

(අ) එය කල්බදු ගැනුම්කරුගේ පාලනය තුලින් බව. සහ

(ආ) එය කල්බදු වාරය නිශ්චය කිරීමේදී කලින් ඇතුලත් නොකළ විකල්පයක් ක්‍රියාත්මක කිරීම හෝ කල්බදුවාරය නිශ්චය කිරීමේදී කලින් ඇතුලත් කළ විකල්ප ක්‍රියාත්මක නොකිරීමට කල්බදු ගැනුම්කරු සාධාරණව නිශ්චිත වේදැයි බලපාන බව (ආ 41 ඡේදයේ විස්තර කළ පරිදි).

21. කල්බද්දක අවලංගු කළ නොහැකි කාලපරිච්ඡේදය තුල වෙනසක් තිබේ නම්, අස්තිත්වයක් කල්බදු වාරය වෙනස් කලයුතු වේ. උදාහරණ ලෙස පහත සඳහන් ඒවා තුලින් කල්බද්ද අවලංගු කළ නොහැකි කාලපරිච්ඡේදය සංශෝධනය වේ.

(අ) අස්තිත්වයේ කල්බදු වාරය නිශ්චය කිරීමේදී කලින් ඇතුලත් නොකළ විකල්පයක් බදු ගැනුම්කරු ක්‍රියාත්මක කිරීම.

(ආ) අස්තිත්වයේ කල්බදු වාරය නිශ්චය කිරීමේදී කලින් ඇතුලත් කළ විකල්පයක් බදුගැනුම්කරු ක්‍රියාත්මක නොකිරීම.

(ඇ) අස්තිත්වයේ කල්බදු වාරය නිශ්චය කිරීමේදී කලින් ඇතුලත් නොකළ විකල්පයක් ක්‍රියාත්මක කිරීමට කල්බදු ගැනුම්කරු ගිවිසුම්මය බැඳීමක් ඇතිකරන සිද්ධියක් සිදුවීම; හෝ

(ඈ) අස්තිත්වයේ කල්බදු වාරය නිශ්චය කිරීමේදී කලින් ඇතුලත් කළ විකල්පයක් ක්‍රියාත්මක කිරීම තුලින් කල්බදු ගැනුම්කරු ගිවිසුම්මය වළක්වන සිද්ධියක් සිදුවීම.

## කල්බදු ගැනුම්කරු

### හඳුනාගැනීම

**22. ආරම්භ කළ දිනට, කල්බදු ගැනුම්කරුවෙක් වත්කම පාවිච්චි කිරිමේ හිමිකමක් සහ කල්බදු වගකීම හඳුනාගැනීම කළයුතුවේ.**

### මැනීම

**මුල්වරට මැනීම**

*වත්කම පාවිච්චි කිරිමේ හිමිකම මුල්වරට මැනීම*

**23. ආරම්භ කළ දිනට බදු ගැනුම්කරුවෙක් වත්කම පාවිච්චි කිරිමේ හිමිකම පිරිවැයට මැනිය යුතු වේ.**

24. වත්කම පාවිච්චි කිරිමේ හිමිකමේ පිරිවැය පහත සඳහන් ඒවායින් සමන්විත වේ.

(අ) 26 වැනි ඡේදයේ විස්තර කර පරිදි කල්බදු වගකීම මුල්වරට මැනීමේ වටිනාකම;

(ආ) ඕනෑම ලැබූ කල්බදු දිරිදීමනා අඩු කර ආරම්භක දිනට හෝ ඊට පෙර සිදුකළ ඕනෑම කල්බදු ගෙවීම්;

(ඇ) බදු ගැනුම්කරු විසින් දැරූ ඕනෑම මූලික සෘජු පිරිවැය; සහ

(ඈ) තොග නිපදවීමට දැරූ පිරිවැය හැර, කල්බද්දේ කොන්දේසි සහ නියමයන් මඟින් අවශ්‍ය තත්වයන්ට පදනම් වූ වත්කම පිහිටුවීමට හෝ ප්‍රතිෂ්ඨාපනය කරන ප්‍රතිෂ්ඨාපනය කිරීමේ ස්ථානය, පදනම් වූ වත්කම කොටස් වශයෙන් ගැලවීමට හෝ ඉවත් කිරීමට බදු ගැනුම්කරුවෙක් විසින් දැරීමට නියමිත පිරිවැයේ ඇස්තමේන්තුවක්. කල්බදු ගැනුම්කරු එම පිරිවැය සඳහා බැඳීම, ආරම්භක දිනයේදී හෝ පදනම් වූ *වත්කම නියමිත* කාලපරිච්ඡේදයක් තුළදී භාවිතා කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අත්විදී.

25. වත්කම පාවිච්චි කිරිමේ හිමිකමේ පිරිවැයේ කොටසක් වශයෙන් එම පිරිවැය බැඳීමකට දරන විට, එම වත්කමේ පිරිවැයේ කොටසක් ලෙස 24(ඈ) ඡේදයේ විස්තර කළ පිරිවැය, බදු ගැනුම්කරුවෙක් හඳුනාගත යුතු වේ. විශේෂිත වූ කාලපරිච්ඡේදයක් තුල තොග නිෂ්පාදනය කිරීමට භාවිතාකළ වත්කම පාවිච්චි කිරිමේ හිමිකම තුලින් ප්‍රතිඵලයක් ලෙස, එම කාලපරිච්ඡේදය තුල දැරූ පිරිවැය LKAS 2 - *තොග* අනුව බදුගැනුම්කරුවෙක් ව්‍යවහාර කරයි. මෙම ප්‍රමිතිය හෝ LKAS 2 ප්‍රකාරව ගිණුම්ගතකළ එම පිරිවැය සඳහා බැඳීම හඳුනාගන්නා අතර LKAS 37- *ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්* ප්‍රකාරව මැනීම කරයි.

*කල්බදු වගකීම මුල්වරට මැනීම*

**26. කල්බදු වාරය ආරම්භ කළ දිනට, නොගෙවූ කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකමට කල්බදු ගැනුම්කරුවෙක් විසින් කල්බදු වගකීම මැනිය යුතු වේ. *කල්බද්දේ ව්‍යංග පොලි අනුපාතිකය* පහසුවෙන් නිශ්චය කළ හැකි නම්, එම පොලී අනුපාතිකය භාවිතයෙන් කල්බදු ගෙවීම් වට්ටම් යුතු වේ. එම පොලී අනුපාතිකය පහසුවෙන් නිශ්චය කළ නොහැකි නම්, කල්බදුගැනුම්කරු, *කල්බදු ගැනුම්කරුගේ වර්ධක ණය අනුපාතිකය* භාවිතා කළයුතු වේ.**

27. කල්බදු වාරය ආරම්භ කළ දිනට, එම දිනට නොගෙවූ කල්බදු වාරය තුළදී පාදක වත්කම පාවිච්චි කිරීමේ හිමිකම සඳහා ගෙවීම් කල්බදු වගකීම මැනීමේදී ඇතුළත් කළ පහත සඳහන් ගෙවීම්වලින් සමන්විත වේ.

(අ) ඕනෑම ලැබිය යුතු කල්බදු දිරි දීමනා අඩු කර *ස්ථාවර ගෙවීම්* (ආ 42 ඡේදයේ විස්තර කර ඇති පරිදි ප්‍රධාන ස්ථාවර ගෙවීම් ඇතුළත්ව);

(ආ) කල්බද්ද ආරම්භක දිනට දර්ශකයක් හෝ අනුපාතිකය භාවිතයෙන් මුලින්ම මනින ලද දර්ශකයක් හෝ අනුපාතිකයක් මත රඳා පවතින *විචල්‍ය කල්බදු ගෙවීම්* (28 ඡේදයේ විස්තර කර ඇති පරිදි);

(ඇ) *අවශේෂ වටිනාකම සහතික කිරීම්* යටතේ කල්බදු ගැනුම්කරු විසින් ගෙවීමට අපේක්ෂා කරන ප්‍රමාණය;

(ඈ) කල්බදු ගැනුම්කරු මිලදී ගැනීමේ විකල්පය ක්‍රියාත්මක කිරීමට සාධාරණ පමණින් නිශ්චිත නම් එම විකල්පය ක්‍රියාත්මක කිරීමේ මිල (ආ37 - ආ40 ඡේදවල විස්තර කළ තක්සේරු කළ සලකා බලන සාධක); සහ

(ඉ) කල්බදු වාරය, කල්බද්ද අවසන් කිරීමට විකල්පය කල්බදු ගැනුම්කරු ක්‍රියාත්මක කිරීම පිළිබිඹු කරයි නම්, කල්බද්ද අවසන් කිරීම සඳහා දඩ ගෙවීම්.

28. 27 (ආ) ඡේදයේ විස්තර කර ඇති දර්ශකයක් හෝ අනුපාතිකයක් මත රඳා පවතින විචල්‍ය කල්බදු ගෙවීම් උදාහරණ ලෙස, පාරිභෝගික මිල දර්ශකය සමග සම්බන්ධ වන ගෙවීම්, නිශ්චිත පොලී අනුපාතිකයක් (එනම් LIBOR වැනි) හා සම්බන්ධ වන ගෙවීම් හෝ වෙළඳපොළ කුලී අනුපාතික වෙනස්වීම පිළිබිඹු කිරීමට වෙනස් කරන ගෙවීම්.

**පසුකාලීන මැනීම**

*වත්කම පාවිච්චි කිරීමේ හිමිකම පසුකාලීනව මැනීම*

**29. කල්බදු වාරය ආරම්භකළ දිනට පසු කල්බදු ගැනුම්කරු පිරිවැය ආකෘතිය ව්‍යවහාර කිරීමෙන් වත්කම පාවිච්චි කිරීමේ හිමිකම මැනිය යුතු අතර එසේ නොමැති නම් 34 සහ 35 ඡේදවල විස්තර කර ඇති මැනීමේ ආකෘති වලින් එකක් ව්‍යවහාර කරයි.**

**පිරිවැය ආකෘතිය**

30. පිරිවැය ආකෘතිය භාවිතා කිරීමට, කල්බදු ගැනුම්කරුවෙක් වත්කම පාවිච්චි කිරීමේ හිමිකම පිරිවැයට පහත පරිදි මැනිය යුතු වේ.

(අ) ඕනෑම සමුච්චිත ක්‍ෂය සහ සමුච්චිත හානිකරණ අලාභ අඩු කිරීමෙන්; සහ

(ආ) 36(ඇ) ඡේදයේ විශේෂයෙන් නියම කරන ලද කල්බදු වගකීමේ ඕනෑම නැවත මැනීමක් සඳහා ගැලපීමෙන්.

31. කල්බදු ගැනුම්කරුවෙක් 32 ඡේදයේ නියමයන්ට යටත්ව, වත්කම පාවිච්චි කිරීමේ හිමිකම ක්‍ෂය කිරීම, LKAS 16 - *දේපළ, පිරියත, උපකරණ* හි නියමයන් ක්‍ෂය කිරීමට ව්‍යවහාර කළයුතු වේ.

32. කල්බදු වාරය අවසානයේ, කල්බදු ගැනුම්කරුට පදනම් වූ වත්කමේ හිමිකම පැවරේ නම් හෝ කල්බදු ගැනුම්කරු මිලදීගැනීමේ විකල්පයක් ක්‍රියාත්මක කරන බව වත්කම පාවිච්චි කිරීමේ හිමිකමේ පිරිවැයෙන් පිළිබිඹු වේ නම්, කල්බදු ගැනුම්කරු විසින් අදාල වත්කමේ *ප්‍රයෝජනවත් ආයු කාලය* පටන් ගත් දින සිට අවසානය දක්වා පදනම් වූ වත්කම පාවිච්චි කිරීමේ හිමිකම ක්‍ෂය කරයි. එසේ නොමැති නම් කල්බදු ගැනුම්කරු වත්කම පාවිච්චි කිරීමේ හිමිකම පටන් ගත් දින සිට පදනම් වූ වත්කමේ ප්‍රයෝජනවත් ජීවිත කාලය අවසානය දක්වා හෝ කල්බදු වාරය අවසානය යන දෙකෙන් අඩු කාලය තුල ක්‍ෂය කළයුතු වේ.

33. කල්බදු ගැනුම්කරුවෙක් වත්කම පාවිච්චි කිරීමේ හිමිකම හානිකරණය වූවාදැයි නිශ්චිත කිරීමට සහ හඳුනාගත් ඕනෑම හානිකරණ අලාභ ගිණුම්ගත කිරීමට LKAS 36 - වත්කම් හානිකරණය ව්‍යහාර කළයුතු වේ.

**වෙනත් මැනීමේ ආකෘති**

34. කල්බදු ගැනුම්කරුවෙක් ආයෝජන දේපළ වලට LKAS 40- *ආයෝජන දේපළ* ප්‍රකාරව සාධාරණ වටිනාකම් ආකෘතිය භාවිතා කරයිනම්, LKAS 40 හි ආයෝජන දේපළ වල නිර්වචනය සම්පූර්ණ වන වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම්වලටද සාධාරණ වටිනාකම් ආකෘතිය කල්බදු ගැනුම්කරු ව්‍යහාර කළයුතු වේ.

35. කල්බදු ගැනුම්කරුවෙක් LKAS 16 හි ප්‍රත්‍යගණන ආකෘතිය ව්‍යවහාර කරන ලද දේපළ, පිරියත සහ උපකරණ පන්තියකට වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම් සම්බන්ධ නම්, කල්බදු ගැනුම්කරු දේපළ පිරියත සහ උපකරණ පන්තියට සම්බන්ධ සියලුම වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම්වලට ප්‍රත්‍යගණන ආකෘතිය ව්‍යවහාර කිරීමට තෝරා ගනු ලැබේ.

**කල්බදු වගකීමේ පසුකාලීන මැනිම**

**36. කල්බද්ද ආරම්භකළ දිනට පසුව, පහත සඳහන් ඒවා තුළින් කල්බදු ගැනුම්කරුවෙන් කල්බදු වගකීම මැනිය යුතු වේ.**

**(අ) කල්බදු වගකිම මත පොළිය පිළිබිඹු කිරීමට ධාරණ අගය වැඩි කිරීමෙන්;**

**(ආ) සිදු කළ කල්බදු ගෙවීම් පිළිබිඹු කිරීමට ධාරණ අගය අඩු කිරීමෙන්; සහ**

**(ඇ) ඕනෑම නැවත තක්සේරුවක් හෝ 39 සිට 46 දක්වා ඡේදවල විශේෂයෙන් සඳහන් කළ කල්බදු සංශෝධන පිළිබිඹු කිරීමට හෝ සංශෝධන කළ ප්‍රධාන වශයෙන් වන ස්ථාවර ගෙවීම් (ආ 42 ඡේදය බලන්න) පිළිබිඹු කිරීමට ධාරණ අගය නැවත මැනීමෙන්.**

37. කල්බදු වාරයක එක් එක් කාලපරිච්ඡේදය තුල කල්බදු වගකීම මත පොළිය, කල්බදු වගකීමේ ඉතිරි වී ඇති ශේෂය මත නියත ආවර්තන පොලී අනුපාතිකයක් නිපදවන ප්‍රමාණය වේ. ආවර්තන පොලී අනුපාතිකය යනු 26 ඡේදයේ විස්තර කරන ලද වට්ටම් අනුපාතිකය හෝ අදාල වේ නම් 41 ඡේදය, 43 ඡේදය හෝ 45 (ඇ) ඡේදයේ විස්තර කරන ලද සංශෝධනය කළ වට්ටම් අනුපාතිකයයි.

38. කල්බද්ද ආරම්භකළ දිනට පසු, වෙනත් අදාල වන ප්‍රමිත ව්‍යවහාරයෙන් වෙනත් වත්කමක ධාරණ අගය තුල ඇතුලත් කර ඇති පිරිවැය හැර කල්බදු ගැනුම්කරුවෙක් පහත සඳහන් දෙකම ලාභය හෝ අලාභය තුල හඳුනාගත යුතු වේ.

(අ) කල්බදු වගකීමේ පොලිය; සහ

(ආ) විචල්‍ය කල්බදු ගෙවීම් සිදුකරන මුදා හරින සිද්ධියේ හෝ කොන්දේසියේ කාලපරිච්ඡේද තුල කල්බදු වගකීම මැනීමට ඇතුලත් නොකරන ලද විචල්‍ය කල්බදු ගෙවීම්.

**කල්බදු වගකීමේ නැවත තක්සේරුව**

39. කල්බද්ද ආරම්භකළ දිනට පසු, කල්බදු ගැනුම්කරුවෙකු කල්බදු ගෙවීම්වල වෙනස්කම් පිළිඹිබු කිරීමට කල්බදු වගකීම නැවත මැනීම 40 - 43 ඡේද ප්‍රකාරව ව්‍යවහාර කළයුතු වේ. කල්බදු ගැනුම්කරුවෙක් වත්කම පාවිච්චි කිරීමේ හිමිකමට ගැලපීමක් ලෙස කල්බදු වගකීමේ නැවත මැනීමේ අගය හඳුනාගත යුතු වේ. කෙසේ නමුත් වත්කම පාවිච්චි කිරීමේ හිමිකමේ ධාරණ අගය බින්දුවට අඩුවන්නේ නම් සහ කල්බදු වගකීමේ මැනීම තුල තවදුරටත් අඩුවීමක් තිබේ නම්, කල්බදු ගැනුම්කරුවෙක් ලාභය හෝ අලාභ තුල නැවත මැනීමෙන් ඉතිරිව ඇති ප්‍රමාණය හඳුනාගත යුතු වේ.

40. කල්බදු ගැනුම්කරුවෙක් සංශෝධිත වට්ටම් අනුපාතිකයක් භාවිතයෙන් සංශෝධිත කල්බදු ගෙවීම් වට්ටම් කිරීමෙන් කල්බදු වගකීම පහත සඳහන් දෙකෙන් එකකින් නැවත මැනිය යුතු වේ.

(අ) 20 සිට 21 දක්වා ඡේදවල විස්තර කර ඇති පරිදි කල්බදු වාරයේ වෙනසක් තිබේ නම්, කල්බදු ගැනුම්කරුවෙක් සංශෝධිත කල්බදු වාරය මත පදනම්ව සංශෝධිත කල්බදු ගෙවීම් නිශ්චය කළයුතු වේ; නැතහොත්

(ආ) මිලදී ගැනීමේ විකල්පයක් සම්බන්ධයෙන් 20 සිට 21 දක්වා ඡේදවල විස්තර කර ඇති සිද්ධි සහ සිදුවීම් සලකා බලමින් තක්සේරු කරන ලද පදනම් වූ වත්කම මිලදී ගැනීමට විකල්පයක තක්සේරුවේ වෙනස්වීමක් තිබේනම්, කල්බදු ගැනුම්කරුවෙක් මිලදී ගැනීමේ විකල්පය යටතේ ගෙවිය යුතු ප්‍රමාණයේ වෙනස පිළිබිඹු කිරීමට සංශෝධිත කල්බදු ගෙවීම් නිශ්චය කළයුතු වේ.

41. 40 වැනි ඡේදය ප්‍රකාරව, ව්‍යංග පොලී අනුපාතිකය පහසුවෙන් නිශ්චය කළ හැකි නම් ඉතිරි කල්බදුවාරය සඳහා කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකය හෝ ව්‍යංග පොලී අනුපාතිකය පහසුවෙන් නිශ්චය කළ නොහැකි නම්, නැවත තක්සේරු කරන දිනට කල්බදු ගැනුම්කරුගේ වර්ධක ණය අනුපාතිකය, සංශෝධිත වට්ටම් අනුපාතිකය ලෙස නිශ්චය කළයුතු වේ.

42. කල්බදු ගැනුම්කරුගේ වට්ටම කළ සංශෝධිත කල්බදු ගෙවීම් මගින් කල්බදු වගකීම පහත සඳහන් දෙකෙන් එකකට නැවත මැනිය යුතු වේ;

(අ) අවශේෂ වටිනාකම සහතික කිරීමක් යටතේ ගෙවීමට අපේක්ෂිත ප්‍රමාණයේ වෙනසක් තිබේ නම්, කල්බදු ගැනුම්කරුවෙක් අවශේෂ වටිනාකම සහතිකවීම යටතේ ගෙවීමට අපේක්ෂිත ප්‍රමාණය වෙනස්වීම පිළිබිඹු කිරීමට සංශෝධිත කල්බදු ගෙවීම් නිශ්චය කළයුතු වේ; නැතහොත්

(ආ) උදාහරණ ලෙස වෙළෙඳපොල කුලී සමාලෝචනයක් අනුගමනය කරමින් වෙළෙඳපොල කුලී අනුපාත වෙනස්කම් පිළිබිඹු කිරීමට වෙනස්කමක් ඇතුළුව කල්බදු ගෙවීම් නිශ්චය කිරීමට භාවිතා කළ දර්ශකයක හෝ අනුපාතිකයක වෙනසක් ප්‍රතිඵලයක් තුලින් අනාගත කල්බදු ගෙවීම්වල වෙනසක් තිබේනම්, කල්බදු ගැනුම්කරු මුදල් ප්‍රවාහවල වෙනසක් තිබෙන විට පමණක් ,එම සංශෝධිත කල්බදු ගෙවීම් පිළිබිඹු කිරීමට කල්බදු වගකීම නැවත මැනිය යුතු වේ. (එනම් ගැලපීම කල්බදු ගෙවීම්වලට බලපෑම සිදුකරන විට) කල්බදු ගැනුම්කරුවෙක් ඉතිරිවන කල්බදු වාරය සඳහා සංශෝධිත ගිවිසුම්මය ගෙවීම් පදනම් කරගෙන සංශෝධිත කල්බදු ගෙවීම් නිශ්චය කළයුතු වේ.

43. 42 ඡේදය ප්‍රකාරව, පාවෙන පොලී අනුපාත වෙනස් වීමක ප්‍රතිඵල තුලින් කල්බදු ගෙවීම් වෙනස් නම් මිස, කල්බදු ගැනුම්කරුවෙක් නොවෙනස් වට්ටම් අනුපාතිකයක් භාවිතා කළයුතු වේ. එවැනි අවස්ථාවක, කල්බදු ගැනුම්කරු පොලී අනුපාතිකයේ වෙනස්කම් පිළිබිඹු කරන සංශෝධිත වට්ටම් අනුපාතිකයක් භාවිතා කළයුතු වේ.

*කල්බදු සංශෝධන*

44. පහත සඳහන් දෙකම තිබේ නම්, කල්බදු ගැනුම්කරුවෙක් කල්බදු සංශෝධනයක් සඳහා වෙනමම කල්බද්දක් ලෙස ගිණුම්ගත කළයුතු වේ.

(අ) පදනම් වූ වත්කම් එකක් හෝ ඊට වැඩියෙන් භාවිතා කිරීමට අයිතිය එකතු කිරීමෙන් කල්බද්දේ විෂය පථය; සංශෝධනයෙන් වැඩි වේ නම්; සහ

(ආ) විශේෂිත වූ ගිවිසුමේ සිදුවීම් පිළිබිඹු කිරීමට වෙනස්ව පෙනෙන මිලකට ඕනෑම යෝග්‍ය ගැලපීම් සහ විෂය පථයේ වැඩි කිරීම සඳහා වෙනස්ව පෙනෙන මිල සමග සුදුසු ප්‍රමාණයක් මගින් කල්බද්ද සඳහා ප්‍රතිෂ්ඨාව වැඩි කරන්නේ නම්.

45. *කල්බදු සංශෝධනය ක්‍රියාත්මක වන දිනට*, වෙනම කල්බද්දක් ලෙස ගිණුම්ගත නොකරන කල්බදු සංශෝධනයක් සඳහා, කල්බදු ගැනුම්කරුවෙක් පහත සඳහන් දෑ කළයුතු වේ.

(අ) 13 - 16 ඡේද ප්‍රකාරව සංශෝධිත ගිවිසුම තුල ප්‍රතිෂ්ඨාව බෙදා හැරීම.

(ආ) 18 - 19 ඡේද ප්‍රකාරව සංශෝධිත කල්බද්දේ කල්බදු වාරය නිශ්චය කිරීම.

(ඇ) සංශෝධිත වට්ටම් අනුපාතිකයක් භාවිතයෙන් වට්ටම් කළ සංශෝධිත කල්බදු ගෙවීම් මගින් කල්බදු වගකීම නැවත මැනීම. කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකය පහසුවෙන් නිශ්චය කළ හැකි නම්, ඉතිරි කල්බදු වාරය සඳහා කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකය හෝ කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකය පහසුවෙන් නිශ්චය කළ නොහැකි නම්, සංශෝධිතය ක්‍රියාත්මක වන දිනට බදුගැනුම්කරුගේ වර්ධක ණය අනුපාතිකය, සංශෝධිත වට්ටම් අනුපාතිකය ලෙස නිශ්චය කරයි.

46. වෙනමම කල්බද්දක් ලෙස ගිණුම්ගත නොකරන කල්බදු සංශෝධනයක් සඳහා, කල්බදු වගකීමේ නැවත මැනීම සඳහා පහත සඳහන් ආකාරයට බදුගැනුම්කරු ගිණුම්ගත කළයුතු වේ.

(අ) කල්බද්දේ විෂය පථය අඩු කරන කල්බදු සංශෝධන සඳහා කල්බද්දේ කොටසක් හෝ සම්පූර්ණයෙන් අවසන් කිරීම පිළිබිඹු කිරීමට වත්කම පාවිච්චි කිරීමේ හිමිකමේ ධාරණ අගය අඩු කිරීමෙන්, කල්බදු ගැනුම්කරු කල්බද්දේ කොටසක් හෝ සම්පූර්ණ අවසන් කිරීමට අදාල වන ඕනෑම ප්‍රති ලාභයක් හෝ පාඩුවක්, ලාභාලාභ ප්‍රකාශනයේ හඳුනාගත යුතු වේ.

(අ) සියළුම අනෙකුත් කල්බදු සංශෝධන සඳහා වත්කම පාවිච්චි කිරීමේ හිමිකමට අනුරූපී ගැලපීමක් සිදුකිරීම.

## ඉදිරිපත් කිරීම

47. කල්බදු ගැනුම්කරුවෙක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත්කිරීම හෝ සටහන්වල හෙළිදරවු කිරීම කළයුතුවේ.

(අ) අනෙකුත් වත්කම් වලින් වෙන්කර වත්කම පාවිච්චි කිරීමේ හිමිකම. කල්බදු ගැනුම්කරුවෙක්, වත්කම පාවිච්චි කිරීමේ හිමිකම වෙන්ව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් නොකරන්නේ නම්, බදුගැනුම්කරු;

(i) පදනම් වූ වත්කම ඔවුනට අයිතිව ඇත්නම් එකම පේලියේ අයිතම සමග වත්කම පාවිච්චි කිරීමේ හිමිකම ඇතුලත් කර අනුරූපී අදාල වත්කම සමග ඉදිරිපත් කරනු ලබයි; සහ

(ii) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ පේලි අයිතමවල ඇතුලත් කරන එම වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම හෙළිදරවු කරනු ලබයි.

(ආ) කල්බදු වගකීම් වෙනත් වගකීම් වලින් වෙන්ව. කල්බදු ගැනුම්කරු කල්බදු වගකීම් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙන්ව ඉදිරිපත් නොකරන්නේ නම්, කල්බදු ගැනුම්කරු පේලි අයිතමවල ඇතුලත් කර ඇති එම වගකීම් හෙළිදරවු කිරීම කළයුතු වේ.

48. ආයෝජන දේපළ වශයෙන් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ඉදිරිපත් කළයුතු ආයෝජන දේපළ වල නිර්වචනය සම්පූර්ණ වන වත්කම පාවිච්චි කිරීමේ හිමිකමට, 47(අ) ඡේදයේ අවශ්‍යතාවය ව්‍යවහාර කරනු නොලබයි.

49. ලාභාලාභ ප්‍රකාශනයේ හෝ වෙනත් විස්තීරණ ආදායම් ප්‍රකාශනයේ, බදු ගැනුම්කරුවෙක් වත්කම පාවිච්චි කිරීමේ හිමිකම සඳහා අයකල ක්ෂයවීම්, කල්බදු වගකීමේ පොලී වියදමෙන් වෙන්ව ඉදිරිපත් කළයුතු වේ. LKAS 1 *මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීමේ* 82 (ආ) ඡේදයට අනුව ලාභාලාභ ප්‍රකාශනයේ සහ වෙනත් විස්තීරණ ආදායම තුල මූල්‍ය පිරිවැයේ සංරචකයක් වන කල්බදු වගකීම මත පොලී වියදම වෙනමම ඉදිරිපත් කිරීමට අවශ්‍ය වේ.

50. මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල, කල්බදු ගැනුම්කරුවෙක් පහත වර්ගීකරණය කළයුතු වේ.

(අ) මූල්‍ය ක්‍රියාකාරකම් තුල කල්බදු වගකීමේ ප්‍රාග්ධන කොටස සඳහා මුදල් ගෙවීම;

(ආ) ගෙවූ පොලිය සඳහා LKAS 7 - *මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ* අවශ්‍යතා ප්‍රකාරව කල්බදු වගකීමේ පොලිය කොටස සඳහා මුදල් ගෙවීම; සහ

(ඇ) කෙටිකාලීන කල්බදු ගෙවීම්, අඩුවටිනාකම් සහිත වත්කම්වල කල්බදු සඳහා ගෙවීම් සහ කල්බදු වගකීම් මැනීමේදී මෙහෙයුම් ක්‍රියාකාරකම් තුල ඇතුලත් නොකල විචල්‍ය කල්බදු ගෙවීම්.

## හෙළිදරව් කිරීම්

**51. හෙළිදරව් කිරීමේ අරමුණ වන්නේ කල්බදු ගැනුම්කරුගේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යසාධනය සහ මුදල් ප්‍රවාහ වල තිබෙන කල්බදුවල බලපෑම තක්සේරු කිරීමට මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට පදනමක් සපයන මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ, ලාභාලාභ ප්‍රකාශනයේ සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය තුල සැපයූ තොරතුරු සමඟ සටහන් වල කල්බදු ගැනුම්කරුවන් සඳහා හෙළිදරව් කිරීමයි. මෙම අරමුණ ඉෂ්ටකර ගන්නේ කෙසේදැයි නියමයන් 52 සිට 60 දක්වා ඡේදවල විශේෂයෙන් සඳහන් කරයි.**

52. බදු ගැනුම්කරුවෙක් තනි සටහනක් ලෙස හෝ එහි මූල්‍ය ප්‍රකාශනවල වෙනමම කොටසක කල්බදු පිළිබඳ තොරතුරු හෙළිදරව් කළයුතු වේ. කෙසේනමුත් කල්බදු ගැනුම්කරුවෙක් කල්බදු පිළිබඳ හරස් යොමුවක තනි සටහනක හෝ වෙනම කොටසක ඇතුලත් කර ඇති තොරතුරු මූල්‍ය ප්‍රකාශනවල වෙනයම් තැනක දැනටමත් ඉදිරිපත්කර තිබේ නම්, තොරතුරු දෙවරක් ඇතුලත් කිරීම අවශ්‍ය නොවේ.

53. කල්බදු ගැනුම්කරුවෙක් වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා පහත සඳහන් අගයන් හෙළිදරවු කිරීම කළයුතු වේ.

(අ) පදනම් වූ වත්කමේ පන්තිය අනුව වත්කම පාවිච්චි කිරීමේ හිමිකම සඳහා ක්ෂය අයකිරීම;

(ආ) කල්බදු වගකීම මත පොලී වියදම;

(ඇ) 6 වැනි ඡේදය ප්‍රකාරව, ගිණුම් ගත කළ කෙටිකාලීන කල්බදුවලට සම්බන්ධ වියදම්. මෙම වියදමේ එක මාසයක හෝ ඊට අඩු කල්බදුවාරය සහිත කල්බදු වලට සම්බන්ධ වියදම් ඇතුලත් කිරීම අවශ්‍ය නොවේ;

(ඈ) 6 වැනි ඡේදය ප්‍රකාරව ගිණුම්ගත කළ අඩුවටිනාකම් වත්කම්වල කල්බදුවලට සම්බන්ධ වියදම. මෙම වියදම 53(ඇ) ඡේදයේ ඇතුලත් කළ අඩු වටිනාකම් සහිත වත්කම්වල කෙටිකාලීන කල්බදුවලට සම්බන්ධ වියදම ඇතුලත් නොකළ යුතුවේ;

(ඉ) කල්බදු වගකීම මැනීම තුල ඇතුලත් නොකළ විචල්‍ය කල්බදු ගෙවීම්වලට සම්බන්ධ වියදම;

(ඊ) වත්කම පාවිච්චි කිරීමේ හිමිකම උපකල්බදු කිරීමෙන් ආදායම;

(උ) කල්බදු සඳහා මුළු මුදල් පිටතට යෑම්;

(ඌ) වත්කම පාවිච්චි කිරීමේ හිමිකමට එකතුවීම්;

(එ) විකුණා සහ ප්‍රතිකල්බදුකරණ ගණුදෙනුවලින් පැනනගින ලාභ හෝ පාඩු; සහ

(ඒ) පදනම් වූ වත්කමේ පන්තිය මගින් වාර්තාකරන කාලපරිච්ඡේදය අවසානයට වත්කම පාවිච්චි කිරීමේ හිමිකමේ ධාරණ අගය.

54. වෙනත් ක්‍රමයකින් යෝග්‍යනම් හැර, කල්බදු ගැනුම්කරුවෙක් 53 ඡේදයේ විශේෂයෙන් සඳහන් කර ඇති වගුවක ආකාරයක හෙළිදරවු කිරීම සැපයිය යුතුවේ. කල්බදු ගැනුම්කරුවෙක් වාර්තාකරණ කාලපරිච්ඡේදය තුල වෙනත් වත්කමක ධාරණ අගය තුල ඇතුලත් කර ඇති පිරිවැය, හෙළිදරවු කළ අගයන්හි ඇතුලත් කළයුතු වේ.

55. 53 (ඇ) ඡේදය ප්‍රකාරව සම්බන්ධවන හෙළිදරවු කළ කෙටිකාලීන කල්බදු වියදම්, කෙටිකාලීන කල්බදු වල කළඹයට අසමානවන, කෙටිකාලීන කල්බදුවල කළඹය වාර්තාකරණ කාලපරිච්ඡේදයේ අවසන් දිනට එකඟ වේ නම්, බදු

ගැනුම්කරුවෙක් 6 වැනි ඡේදය ප්‍රකාරව ගිණුම්ගත කළ කෙටිකාලීන කල්බදු සඳහා කල්බදු එකඟ වීමේ ප්‍රමාණය හෙළිදරවු කිරීම කළයුතු වේ.

56. වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම, ආයෝජන දේපළවල නිර්වචනය සම්පූර්ණ වේ නම්, බදු ගැනුම්කරුවෙක් LKAS 40 හි හෙළිදරවු කිරීමේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කළයුතු වේ. එම අවස්ථාවේදී, බදු ගැනුම්කරු වත්කම්වල හිමිකම භාවිතය සඳහා 53(අ), (ඊ),(ඌ) හෝ (ඒ) යන ඡේදවල හෙළිදරවු කිරීම් සැපයීමට අවශ්‍ය නොවේ.

57. බදු ගැනුම්කරුවෙක් LKAS 16 ප්‍රකාරව ප්‍රත්‍යගණිත අගයට, වත්කම පාවිච්චි කිරීමේ හිමිකම මනිනු ලබන්නේ නම්, එම වත්කම් සඳහා බදු ගැනුම්කරු LKAS 16 හි 77 ඡේදයන් නියම කළ තොරතුරු හෙළිදරවු කිරීම කළයුතු වේ.

58. බදු ගැනුම්කරුවෙක් අනෙකුත් මූල්‍ය වගකීම්වල කල්පිරීමේ විශ්ලේෂණයෙන් වෙනමම, SLFRS 7 - *මූල්‍ය සාධන පත්‍ර හෙළිදරවු කිරීම්වල* 39 සහ ආ11 ඡේද ප්‍රකාරව කල්බදු වගකීම්වල කල්පිරීමේ විශ්ලේෂණය හෙළිදරවු කළයුතු වේ.

59. 53-58 ඡේදවල හෙළදරවු කිරීමේ අවශ්‍යතාවලට අමතරව, බදු ගැනුම්කරුවෙකු 51 වැනි ඡේදයේ (48(ආ) ඡේදයේ විස්තර කර ඇති පරිදි) හෙළිදරවු කිරීමේ අරමුණ සම්පූර්ණ කිරීමට අවශ්‍ය එහි කල්බදු ක්‍රියාකාරකම් පිළිබඳ අමතර ප්‍රමාණාත්මක සහ ගුණාත්මක තොරතුරු හෙළිදරවු කිරීම කළයුතු වේ. මෙම අමතර තොරතුරු මූල්‍ය ප්‍රකාශන තක්සේරු කිරීමට පරිශීලකයින්ට උදවු වන තොරතුරුවලට සීමා නොවී ඇතුලත් කළ හැකිය.

(අ) බදු ගැනුම්කරුගේ කල්බදු ක්‍රියාකාරකම්වල ස්වභාවය;

(ආ) කල්බදු වගකීම්වල මැනීම් තුල පිළිබිඹු නොවන බදු ගැනුම්කරුට භව්‍යමය අනාවරණය කරන අනාගත මුදල් ප්‍රවාහ. මෙම අනාවරණවීම් පහත සඳහන් ඒවායේ පැනනැගීම් ඇතුලත් වේ.

i. විචල්‍ය කල්බදු ගෙවීම් (ආ49 ඡේදයේ විස්තර කළ);

ii. දීර්ඝ කිරීමේ විකල්පයන් සහ අවසන් කිරීමේ විකල්පයන් (ආ50 ඡේදයේ විස්තර කළ);

iii. අවශේෂ වටිනාකම සහතික කිරීම් (ආ51 ඡේදයේ විස්තර කළ); සහ

iv. කල්බදු ගැනුම්කරු බැඳීමකට යටත් වන තවමත් ආරම්භ නොකළ කල්බදු.

(ඇ) කල්බදු මගින් සීමාකිරීම් හෝ පැනවූ ප්‍රඥප්ති; සහ

(ඈ) විකුණා සහ ප්‍රතිකල්බදුකරණ ගණුදෙනු (ආ 52 ඡේදයේ විස්තර කළ පරිදි).

60. 6 වැනි ඡේදය ප්‍රකාරව අඩු වටිනාකම් වත්කම් වල කල්බදු හෝ කෙටිකාලීන කල්බදු සඳහා බදු ගැනුම්කරුවෙක් ගිණුම්ගත කර එම කරුණ හෙළිදරවු කළයුතු වේ.

## කල්බදු දීමනාකරු

### කල්බදු වර්ගීකරණය (ආ53 - ආ58 ඡේද)

**61. කල්බදු දීමනාකරු එක් එක් කල්බද්ද *මෙහෙයුම් කල්බද්දක් නැතහොත් මූල්‍ය කල්බද්දක්*දැයි වර්ග කළයුතු වේ.**

**62. පදනම් වූ වත්කමේ අයිතිය මත ඇති වන්නා වූ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම පාහේ පවරා දෙනු ලබන්නේ නම් එම කල්බද්ද මූල්‍ය කල්බද්දක් ලෙස වර්ග කරයි. පදනම් වූ වත්කමේ අයිතිය මත ඇති වන්නා වූ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම පාහේ පවරා දෙනු නොලබන්නේ නම් එම කල්බද්ද මෙහෙයුම් කල්බද්දක් ලෙස වර්ග කරයි.**

63. කල්බද්දක් මූල්‍ය කල්බද්දක්ද නැතහොත් මෙහෙයුම් කල්බද්දක්ද යන්න රඳා පවතින්නේ ගිවිසුමේ ස්වභාවයට වඩා ගණුදෙනුවේ යථාර්ථය මතයි. කල්බද්දක් සාමාන්‍යයෙන් මූල්‍ය කල්බද්දක් ලෙස වර්ග කිරීමට තනිව හෝ සංයෝජනය ලෙස ගත්කල තුඩුදෙන අවස්ථාවලට උදාහරණ;

(අ) කල්බදු වාරය අවසානයේ පදනම් වූ වත්කමේ අයිතිය කල්බදු ගැනුම්කරු වෙත පැවරීම;

(ආ) විකල්පය ක්‍රියාත්මක කළ හැකි දිනයේ පවතින *සාධාරණ වටිනාකමට* වඩා ප්‍රමාණවත් තරම් අඩුවේ යැයි අපේක්ෂිත මිලකට පදනම් වූ වත්කම මිලදී ගැනීමේ විකල්පයක් බදු ගැනුම්කරුට පැවතීම හා *කල්බද්දක් ආරම්භයේ* දී එම විකල්පය ක්‍රියාත්මක කරනු ඇතැයි සාධාරණ ලෙස නිශ්චිත වීම;

(ඇ) අයිතිය පැවරෙන්නේ නැති වුවද, කල්බදුවාරය, පදනම් වූ වත්කමේ ආර්ථික ජීවිත කාලයෙන් විශාල කොටසක් සඳහා වීම;

(ඈ) කල්බද්ද ආරම්භයේදී, අවම කල්බදු ගෙවීම්වල වර්තමාන වටිනාකම අඩු වශයෙන් පදනම් වූ වත්කමේ සාධාරණ වටිනාකමට මුළුමනින්ම පාහේ සමාන වීම; සහ

(ඉ) පදනම් වූ වත්කම විශාල වෙනස් කිරීමකින් තොරව භාවිතා කළ හැක්කේ කල්බදු ගැනුම්කරුට පමණක් වන තරම් විශේෂිත ස්වභාවයක ඒවා වීම.

64. තනි තනිව හෝ සංයෝජනයෙන් කල්බද්දක් මූල්‍ය කල්බද්දක් ලෙස වර්ග කිරීමට තුඩුදෙන අවස්ථා;

අ) බදු ගැනුම්කරුට කල්බද්ද අවලංගු කළ හැකි නම්, අවලංගු කිරීම හා ආශ්‍රිත බදු දීමනාකරුගේ අලාභ බදු ගැනුම්කරු විසින් දැරීම;

ආ) අවශේෂයේ සාධාරණ වටිනානම උච්චාවචනය වීමෙන් ඇතිවන ප්‍රතිලාභ හෝ අලාභ බදු ගැනුම්කරුට උපචිත වීම (උදාහරණයක් ලෙස කල්බද්ද අවසානයේ විකුණුම් මුදල් බොහොමයක්, කුලී ආපසු ලැබීම් වලට සමාන වන ආකාරයෙන්); සහ

(ඇ) වෙළඳපොල කුලියට වඩා බොහෝ සෙයින් අඩු කුලියකට කල්බද්ද ද්විතියික කාලච්ඡේදයක් සඳහා දිගටම පවත්වා ගැනීමට බදු ගැනුම්කරුට හැකියාවක් තිබීම.

65. 63 සහ 64 ඡේදවල වූ උදාහරණ සහ හැඟවීම් සැමවිටම තීරණාත්මක ඒවා නොවේ. පදනම් වූ වත්කමේ අයිතියට අදාල සියලුම අවදානම් හා ප්‍රතිලාභ සැලකිය යුතු තරම් පවරනු නොලබන බව වෙනත් ලක්ෂණයන්ගෙන් පැහැදිලි වන්නේ නම්, එම කල්බද්ද මෙහෙයුම් කල්බද්දක් ලෙස වර්ග කෙරේ. උදාහරණ ලෙස, කල්බද්ද අවසනයේ දී පදනම් වූ වත්කමේ අයිතිය එවකට පැවති සාධාරණ වටිනාකමට සමාන විචල්‍ය ගෙවීමක් සඳහා අයිතිය පැවරීම වැනි සිද්ධියක් හෝ විචල්‍ය කල්බදු ගෙවීමක් ඇත්නම්, එහි ප්‍රතිඵලයක් ලෙස බදු දීමනාකරු විසින් සැලකිය යුතු තරම් සියළුම අවදානම් හා ප්‍රතිලාභ පවරනු නොලබයි.

66. කල්බදු වර්ගීකරණය කල්බද්ද ආරම්භයේදී කරනු ලබන අතර එය නැවත තක්සේරු කරන්නේ කල්බදු සංශෝධනයක් තිබේනම් පමණි. ඇස්තිමේන්තුවල වෙනස්වීම් (උදාහරණ ලෙස කල්බදු වත්කමේ ආර්ථික ජීවිත කාලයේ හෝ අවශේෂ වටිනාකමෙහි ඇස්තමේන්තුවල වෙනස්වීම්) හෝ පවත්නා තත්වයන්හි වෙනස්වීම් (උදාහරණ ලෙස කල්බදු ගැනුම්කරු විසින් ගෙවීම් පැහැර හැරීම), ගිණුම්කරණ අරමුණ සඳහා කල්බද්දෙහි අළුත් වර්ගීකරණයකට තුඩු නොදෙයි.

## මූල්‍ය කල්බදු

### හඳුනාගැනීම සහ මැනීම

**67. කල්බදුවාරය ආරම්භයේදී මූල්‍ය කල්බදු යටතේ තබා ගන්නා වත්කම් එහි මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනා ගන්නා අතර *කල්බද්දේ ශුද්ධ ආයෝජනයට* සමාන අගයක් ලැබිය යුතු මුදල් ලෙස ඉදිරිපත් කරයි.**

*මුල්වරට මැනීම*

68. කල්බදු දීමනාකරු කල්බද්දේ ශුද්ධ ආයෝජනය මැනීමට කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකය යොදා ගත යුතුවේ. උපකල්බදුවලදී, උපකල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකය නිශ්චය කළ නොහැකි නම් අතරමැදි කල්බදු දීමනාකරු, උපකල්බද්දේ ශුද්ධ ආයෝජනය මැනීමට ප්‍රධාන කල්බද්ද සඳහා යොදාගත් වට්ටම් අනුපාතිකය (උපකල්බද්ද ආශ්‍රිතව ඕනෑම මූලික සෘජු පිරිවැය සඳහා ගලපන ලද) යොදා ගත හැකිය.

69. නිෂ්පාදන හෝ බෙදාහරින්නෙකු වූ කල්බදු දීමනාකරු විසින් දැරූ පිරිවැය හැර කල්බද්දේ සෘජු ආයෝජනය මුල්වරට මැනීමේදී මූලික සෘජු පිරිවැය ඇතුලත් කරන ලද අතර කල්බදු වාරය තුලදී හඳුනාගත් ආදායමේ ප්‍රමාණය අඩුකරයි. කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකය නිර්වචනය කළ ආකාරයටම කල්බද්දේ ශුද්ධ ආයෝජනය තුල ස්වයංක්‍රීයව සෘජු පිරිවැය ඇතුලත් කරන අතර ඒවා වෙනමම එකතු කිරීමට අවශ්‍ය නොවේ.

**කල්බද්දේ ශුද්ධ ආයෝජනය තුල ඇතුලත් වන කල්බදු ගෙවීම් මුල් වරට මැනීම**

70. කල්බද්ද ආරම්භක දිනට, එම දිනට නොලැබූ, කල්බදු වාරය තුල පදනම් වූ වත්කම පාවිච්චි කිරිමේ හිමිකම සඳහා පහත සඳහන් ගෙවීම් කල්බද්දේ ශුද්ධ ආයෝජන මැනීමේදී ඇතුලත් වන කල්බදු ගෙවීම්වල සමන්විත වේ.

(අ) ඕනෑම ගෙවිය යුතු කල්බදු දිරි දීමනා අඩු කර ස්ථාවර ගෙවීම් (ආ42 ඡේදයේ විස්තර කරන ප්‍රධාන වශයෙන් වන ස්ථාවර ගෙවීම්) ;

(ආ) ආරම්භක දිනට දර්ශකයක් හෝ අනුපාතිකයක් භාවිතයෙන් මූලිකව මනිනු ලැබූ දර්ශකයක් හෝ අනුපාතිකයක් මත රඳා පවතින විචල්‍ය කල්බදු ගෙවීම්;

(ඇ) කල්බදු ගැනුම්කරුවෙක් විසින් සහතික වීම් යටතේ බැඳියාව නිදහස් කිරීමට ඇති මූල්‍යමය හැකියාව, කල්බදු ගැනුම්කරුවෙක් සම්බන්ධවන පාර්ශවයක් හෝ කල්බදු දීමනාකරුට සම්බන්ධ නොවන තෙවැනි පාර්ශයක් විසින් කල්බදු දීමනාකරුට සපයන ලද ඕනෑම අවශේෂ වටිනාකම සහතික වීම්;

(ඈ) කල්බදු ගැනුම්කරු මිලදී ගැනීමේ විකල්පය ක්‍රියාත්මක කිරීම සාධාරණ ලෙස නිශ්චිත නම්, එම විකල්පය ක්‍රියාත්මක වන මිල;

(ඉ) කල්බද්ද අවසන් කිරීමට කල්බදු ගැනුම්කරු ක්‍රියාත්මක කරන විකල්පයක් කල්බදු වාරයේ පිළිබිඹු වේ නම්, කල්බද්ද අවසන් කිරීම සඳහා ගෙවන දඩ.

**නිෂ්පාදක හෝ බෙදාහරින්නෙකු වන කල්බදු දීමනාකරු**

71. කල්බදු වාරය ආරම්භක දිනයේදී නිෂ්පාදක හෝ බෙදාහරින්නා වූ බදු දීමනාකරුවෙක් එක් එක් මූල්‍ය කල්බදු සඳහා පහත සඳහන් දෑ හඳුනාගත යුතුවේ.

(අ) අයභාරය වන්නේ අදාල වත්කමේ සාධාරණ වටිනාකමයි නැතහොත් ඊට අඩුනම්, වෙළඳපොල පොළී අනුපාතිකය භාවිතයෙන් වට්ටම් කළ කල්බදු දීමනාකරුට උපචිත වන අවම කල්බදු ගෙවීම්වල වර්තමාන අගය;

(ආ) විකුණුම් පිරිවැය වන්නේ අදාල වත්කමේ පිරිවැය හෝ ධාරණ අගයයි, ඊට වෙනස්නම් සහතික නොකළ අවශේෂ වටිනාකම අඩුකල පසු පදනම් වූ වත්කමේ ධාරණ අගය; සහ

(ඇ) විකුණුම් ලාභය හෝ පාඩුව (අයභාරය සහ විකුණුම් පිරිවැය අතර වෙනස), SLFRS 15 ව්‍යවහාර කිරිමෙන් සම්පූර්ණ විකුණුම් සඳහා වන එහි ප්‍රතිපත්ති ප්‍රකාරව, නිෂ්පාදක හෝ බෙදාහරින්නෙකු වූ බදු දීමනාකරු කල්බද්ද ආරම්භකළ දිනට විකුණුම් ලාභය හෝ අලාභය SLFRS 15 ට අනුව විස්තර කර ඇති පරිදි අදාල වත්කම කල්බදු දීමනාකරුට පැවරිය හැකිදැයි නොසලකා හඳුනාගත යුතුවේ.

72. නිෂ්පාදකයින් හෝ බෙදාහරින්නන් වත්කමක් මිලදී ගන්නවාද නැතහොත් කල්බදු කරනවාද යන තේරීම නිතරම පාරිභෝගිකයින්ට පිරිනමයි. අදාල පරිමා හෝ වෙළෙඳ වට්ටම් පිළිබිඹු කරන සාමාන්‍ය විකුණුම් මිලට කල්බදු දෙනු ලබන වත්කමේ විකුණුම් මිලට මුළුමනින්ම විකිණීමේ ප්‍රතිඵලයෙන් ලැබෙන ලාභය හෝ අලාභයට සමාන වූ ලාභය හෝ අලාභය, නිෂ්පාදක හෝ බෙදා හරින්නා වූ කල්බදු දීමනාකරු විසින් වත්කමක් මූල්‍ය කල්බද්දට දීමේදී ඇතිකර ගනී.

73. නිෂ්පාදක හෝ බෙදාහරින්නෙකු වන කල්බදු දීමනාකරුවන් සමහර අවස්ථාවලදී ගණුදෙනුකරුවන් ආකර්ශනය කර ගැනීමට කෘතිම ලෙස පහල පොළී අනුපාතිකයක් නියම කරයි. ආරම්භක දිනට කල්බදු දීමනාකරු ගණුදෙනුවේ මුළු ආදායමින් වැඩි කොටසක් හඳුනාගැනීමෙන් එවැනි අනුපාතිකයක් භාවිතා කිරීමේ ප්‍රතිඵල ගෙනදේ. කෘතිම ලෙස අඩු පොළී අනුපාතික දක්වා තිබේ නම් නිෂ්පාදන හෝ බෙදාහරින්නෙකු වන කල්බදු දීමනාකරු වෙළෙඳපොල පොළී අනුපාතියක් අයකර තිබුණේ නම්, එම මුදලට විකුණුම් ලාභය සීමා කළයුතුයි.

74. මූල්‍ය කල්බද්දක් ලබාගැනීමේ, නිෂ්පාදන හෝ බෙදාහරින්නෙකු වන කල්බදු දීමනාකරු විසින් දැරූ පිරිවැය ප්‍රධාන වශයෙන් නිෂ්පාදන හෝ බෙදාහරින්නකුගේ විකුණුම් ලාභය ඉපයීමට සම්බන්ධ වන නිසා කල්බදු වාරය ආරම්භක දිනට වියදමක් ලෙස හඳුනාගත යුතුවේ. මූල්‍ය කල්බද්දක් ලබා ගැනීම සම්බන්ධයෙන් නිෂ්පාදන හෝ බෙදාහරින්නෙකු වන කල්බදු දීමනාකරු විසින් දැරූ පිරිවැය මූලික සෘජු පිරිවැය නිර්වචනයෙන් ඉවත් වන අතර, එසේම කල්බද්දේ ශුද්ධ ආයෝජනයෙන්ද ඉවත් වේ.

*පසුකාලීන මැනීම*

**75. කල්බදු දීමනාකරුවෙක් ඔහුගේ කල්බද්දේ ශුද්ධ ආයෝජනය මත නියත ආවර්ථක ප්‍රතිලාභ අනුපාතිකයක් පිළිබිඹු වන රටාවක් මත පදනම් වී කල්බදු වාරය පුරාම මූල්‍ය ආදායම හඳුනාගත යුතුවේ.**

76. කල්බදු දීමනාකරුවෙක් කල්බදු වාරය පුරා ක්‍රමවත් හා සුදුසු පදනමක් මත මූල්‍ය ආදායම බෙදා වෙන් කිරීම අරමුණු කරයි. කල්බදු දීමනාකරුවෙක් කල්බදු ගෙවීම්වල මුල් මුදල සහ *නොඉපයූ මූල්‍ය ආදායම* යන දෙකම අඩු කිරීමට කාලපරිච්ඡේදයට අදාල කල්බද්දේ දළ ආයෝජනයට එරෙහිව ව්‍යවහාර කළයුතුයි.

77. කල්බදු දීමනාකරුවෙක් කල්බද්දේ ශුද්ධ ආයෝජනයට SLFRS 9 අවශ්‍යතා හඳුනා නොගැනීම සහ හානිකරණය සඳහා ව්‍යවහාර කළයුතුයි. කල්බද්දක දළ ආයෝජනය ගණනය කිරීමේදී කල්බදු දීමනාකරුවෙක් ඇස්තමේන්තු කළ භාවිතා කළ සහතික නොකළ අවශේෂ වටිනාකම් ක්‍රමවත්ව සමාලෝචනය කළයුතුයි. ඇස්තමේන්තුගත සහතික නොකළ අවශේෂ වටිනාකමේ අඩුවීමක් තිබේ නම්, කල්බදු වාරය පුරා කල්බදු දීමනාකරු ආදායම බෙදාහැරීම සංශෝධනය කළ යුතු අතර උපචිතව ඇති අගයන් සම්බන්ධයෙන් කවර හෝ අඩුවීමක් වහාම හඳුනා ගත යුතුයි.

78. SLFRS 5 - *විකිණීම සඳහා තබා ගෙන ඇති ජංගම නොවන වත්කම් සහ අසංතතික මෙහෙයුම්* ප්‍රකාරව විකිණීම සඳහා තබාගෙන ඇති ලෙස වර්ගීකරණය කර ඇති මූල්‍ය කල්බද්දයක් යටතේ වත්කමක් (හෝ විකිණීම සඳහා තබාගෙන ඇති සේ වර්ගීකරණය කර බැහැර කිරීමේ කාණ්ඩය තුල) එම SLFRS අනුව ගිණුම්ගත කළයුතුයි.

**කල්බදු සංශෝධන**

79. කල්බදු දීමනාකරුවෙක් මූල්‍ය කල්බද්දක සංශෝධයක් සඳහා වෙනමම කල්බද්දක් ලෙස පහත සඳහන් දෙකම සිදුවේනම් ගිණුම්ගත කළයුතුයි.

(අ) අදාල වත්කම් එකක් හෝ ඊට වැඩියෙන් පාවිච්චි කිරීමට හිමිකම වැඩි කිරීමෙන්, සංශෝධනය කල්බද්දේ විෂය පථය වැඩි කිරීම; සහ

(ආ) විශේෂිත ගිවිසුමේ සිදුවීම් පිළිබිඹු කිරීමට වෙනස්ව ඇති මිලකට කරන ඕනෑම යෝග්‍ය ගැලපීම් සහ වෙනස්ව ඇති මිල සමග විෂය පථය වැඩි කිරීම සඳහා සුදුසු අගයක් මගින් කල්බද්ද සඳහා වන ප්‍රතිෂ්ඨාව වැඩි කිරීම.

80. වෙනමම කල්බද්දක් ලෙස ගිණුම්ගත නොකරන මූල්‍ය කල්බද්දක සංශෝධයක් සඳහා කල්බදු දීමනාකරු පහත පරිදි සංශෝධන ගිණුම්ගත කළයුතුයි.

(අ) මෙහෙයුම් කල්බද්දක් ලෙස වර්ග කර තිබෙන කල්බද්දකට නම් ආරම්භක දිනට බලපෑම් සංශෝධනය තිබුණි නම්, කල්බදු දීමනාකරුඃ

i. සංශෝධනය ක්‍රියාත්මක වූ දින සිට අළුත් කල්බද්දක් ලෙස කල්බදු සංශෝධනය ගිණුම්ගත කළයුතුයි.

ii. කල්බදු සංශෝධන ක්‍රියාත්මක වන දිනට පෙර වහාම කල්බද්දේ ශුද්ධ ආයෝජනය ලෙස අදාල වත්කමේ ධාරණ අගය මැනිය යුතු වේ.

(ආ) එසේ නොමැති නම්, කල්බදු දීමනාකරු SLFRS 9 අවශ්‍යතාවයන් ව්‍යවහාර කළයුතුයි.

## මෙහෙයුම් කල්බදු

**හඳුනාගැනීම සහ මැනීම**

**81. කල්බදු දීමනාකරුවෙක් මෙහෙයුම් කල්බදු වල කල්බදු ගෙවීම් අදායම ලෙස සරලමාර්ග පදනම හෝ වෙනත් ක්‍රමවත් පදනමක් මත හඳුනාගනී. අදාල වත්කම භාවිතයෙන් ලබාගත හැකි ප්‍රතිලාභ හීනවන රටාව මත හොඳින් නියෝජනය වන වෙනත් ක්‍රමවත් පදනමක් ඇත්නම් කල්බදු දීමනාකරු එම ක්‍රමවත් පදනම ව්‍යවහාර කළයුතුයි.**

82. කල්බදු දීමනාකරුවෙක් කල්බදු ආදායම ඉපයීමේදී දැරූ ක්ෂය ඇතුළු පිරිවැය වියදමක් ලෙස හඳුනාගත යුතුවේ.

83. කල්බදු දීමනාකරුවෙක් මෙහෙයුම් කල්බද්දක් ලබා ගැනීමේදී දැරූ මූලික සෘජු පිරිවැය අදාල වත්කමේ ධාරණ අගයට එකතු කළයුතු අතර එම පිරිවැය කල්බදු ආදායම සම්බන්ධයෙන් වන පදනමට සමානව කල්බදු වාරය පුරා වියදමක් ලෙස හඳුනාගත යුතුයි.

84. මෙහෙයුම් කල්බදු වලට යටත් වන අදාල වත්කමේ ක්‍ෂය සඳහා වන ක්‍ෂය ප්‍රතිපත්තිය කල්බදු දීමනාකරුගේ ඒ සමාන වත්කම් සඳහා වූ සාමාන්‍ය ක්‍ෂය ප්‍රතිපත්තිය හා ඒකාකාරී පදනමක් මත විය යුතුය. කල්බදු දීමනාකරු ක්‍ෂය වීම LKAS 16 සහ LKAS 38 ප්‍රකාරව ගණනය කළයුතු වේ.

85 මෙහෙයුම් කල්බද්දට යටත් වන අදාල වත්කම හානිකරන වූවා දැයි සහ ඕනෑම හඳුනාගත් හානිකරන අලාභ ගිණුම්ගත කිරීම නිශ්චය කිරීමට කල්බදු දීමනාකරු LKAS 36 ව්‍යාවහාර කළයුතුයි.

86. නිෂ්පාදන හෝ බෙදාහරින්නෙකු වන කල්බදු දීමනාකරු මෙහෙයුම් කල්බද්දට එළඹීමේදී ඇතිවන ඕනෑම විකුණුම් ලාභයක් එහි විකිණීමකට සමාන නොවන නිසා හඳුනා නොගනී.

*කල්බදු සංශෝධන*

87. අළුත් කල්බද්දක් සඳහා මුල් කල්බද්දට සම්බන්ධව කල්බදු ගෙවීම්වල කොටසක් වශයෙන් ඕනෑම උපචිත හෝ කලින් ගෙවූ කල්බදු ගෙවීම් සලකා බලමින් සංශෝධන ක්‍රියාත්මක කළ දින සිට අළුත් කල්බද්දක් ලෙස මෙහෙයුම් කල්බද්දට සංශෝධන සඳහා කල්බදු දීමනාකරු ගිණුම්ගත කළයුතුයි.

## ඉදිරිපත් කිරීම

88. කල්බදු දීමනාකරු පදනම් වූ වත්කමේ ස්වභාවය අනුව මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ මෙහෙයුම් කල්බදුවලට යටත්ව එම වත්කම ඉදිරිපත් කළයුතුයි.

## හෙළිදරවු කිරීම

**89. හෙළිදරවු කිරීමේ අරමුණ වන්නේ කල්බදු දීමනාකරු සඳහා බදු දීමනාකරුගේ මූල්‍ය තත්ත්වය, මූල්‍ය කාර්යයසාධනය සහ මුදල් ප්‍රවාහ මත තිබෙන කල්බදුවල බලපෑම තක්සේරු කිරීමට මුල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට පදනමක් දීමට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය, ලාභාලාභ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සපයන තොරතුරු සමග සටහන් වල හෙළිදරවු කිරීමයි. මෙම අරමුණ සම්පූර්ණ කර ගන්නේ කෙසේදැයි අවශ්‍යතාවයන් 90-97 ඡේදවල විශේෂයෙන් නියම කරයි.**

90. කල්බදු දීමනාකරු වාර්තාකරණ කාලපරිච්ඡේදය සඳහා පහත සඳහන් අගයන් හෙළිදරවු කළයුතුයි.

(අ) මූල්‍ය කල්බදු සඳහාඃ

i. විකුණුම් ලාභය හෝ අලාභය;

ii. කල්බද්දේ ශුද්ධ ආයෝජනය මත මූල්‍ය ආදායම;

iii. කල්බද්දේ ශුද්ධ ආයෝජන මැනීම තුල ඇතුලත් නොවූ විචල්‍ය කල්බදු ගෙවීම්වලට සම්බන්ධ ආදායම.

(ආ) මෙහෙයුම් කල්බදු සඳහා කල්බදු ආදායම, දර්ශකයක් හෝ අනුපාතිකයක් මත රදා නොපවතින විචල්‍ය කල්බදු ගෙවීම් වලට සම්බන්ධ ආදායම වෙනමම හෙළිදරවු කිරීමෙන්.

91. කල්බදු දීමනාකරු වෙනත් ආකෘතියක් වඩාත් යෝග්‍ය වන්නේ නම් මිස, 90 ඡේදයෙන් විශේෂයෙන් නියම කළ හෙළිදරවු කිරීම්, වගුවක ආකාරයෙන් සැපයිය යුතු වේ.

92. කල්බදු දීමනාකරු 89 ඡේදයේ හෙළිදරව් කිරීමේ අරමුණ සම්පූර්ණ වීමට අවශ්‍ය කල්බදු ක්‍රියාකාරකම් පිළිබඳව ප්‍රමාණාත්මක සහ ගුණාත්මක අතිරේක තොරතුරු හෙළිදරවු කිරීම කළයුතුවේ. මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට තක්සේරු කිරීමට උදවු වෙන තොරතුරු වලට සීමා නොවී මෙම අමතර තොරතුරුවලට ඇතුලත් වන දෑඃ

(අ) කල්බදු දීමනාකරුගේ කල්බදු ක්‍රියාකාරකම්වල ස්වභාවය; සහ

(අ) අදාල වත්කමේ රදවා ගන්නා ඕනෑම හිමිකම් සමඟ ආශ්‍රිත අවදානම කල්බදු දීමනාකරු කලමණාකරණය කරන්නේ කෙසේද යන්න. විශේෂයෙන්ම කල්බදු දීමනාකරු අවදානම අඩු කරන ආකාරය වැනි ඕනෑම උපාය මාර්ගයක් ඇතුලත්ව, අදාලවත්මේ රඳවා ගන්නා හිමිකම සඳහා එහි අවදානම අඩුකර ගැනීමට කළමනාකරණ උපායමාර්ග හෙළිදරවු කළයුතුවේ. එවැනි උපායවලට උදාහරණ ලෙස නැවත මිලදී ගැනීමේ ගිවිසුම්, අවශේෂ වටිනාකම සහතික කිරීම් හෝ විශේෂයෙන් නියම කළ සීමාවලට වඩා වැඩියෙන් භාවිතා කිරීම සඳහා විචල්‍ය කල්බදු ගෙවීම් ඇතුලත් කළ හැකිය.

### මූල්‍ය කල්බදු

93. කල්බදු දීමනාකරු, මූල්‍ය කල්බදුවල ශුද්ධ ආයෝජනයේ ධාරණ අගයෙහි සැලකිය යුතු වෙනස්වීම් වල ප්‍රමාණාත්මක සහ ගුණාත්මක විස්තරයක් සැපයිය යුතු වේ.

94. කල්බදු දීමනාකරුවෙක් එක් එක් මුල් අවුරුදු පහ සඳහා අවමයක් සහ ඉතිරි අවුරුදුවල මුළු ප්‍රමාණය සඳහා වාර්ෂික පදනමක් මත ලැබිය යුතු වට්ටම් නොකළ කල්බදු ගෙවීම් පෙන්වමින්, ලැබිය යුතු කල්බදු ගෙවීම්වල කල්පිරුණු විශ්ලේෂණයක් හෙළිදරවු කළයුතු වේ. කල්බදු දීමනාකරුවෙක් කල්බද්දේ ශුද්ධ ආයෝජනයට වට්ටම් නොකල කල්බදු ගෙවීම් සැසඳීමක් කළයුතු වේ. ලැබිය යුතු කල්බදු ගෙවීම්වලට සම්බන්ධ නොඉපයූ මූල්‍ය ආදායම සහ ඕනෑම වට්ටම් කළ සහතික නොකළ අවශේෂ වටිනාකම සැසඳුමෙන් හඳුනාගත යුතු වේ.

### මෙහෙයුම් කල්බදු

95. මෙහෙයුම් කල්බද්දකට යටත් වන දේපළ, පිරියත සහ උපකරණ අයිතම සඳහා කල්බදු දීමනාකරුවෙක් LKAS 16 හෙලිදරවු කිරීමේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කළයුතු වේ. LKAS 16 හි හෙළිදරවු කිරීමේ අවශ්‍යතා ව්‍යවහාර කිරීමේදී, මෙහෙයුම් කල්බදු වලට යටත් වන වත්කම් සහ මෙහෙයුම් කල්බදු වලට යටත් නොවන වත්කම්, දේපළ, පිරියත සහ උපකරණවල එක් එක් පන්තිය, කල්බදු දීමනාකරු එකතු නොකළ යුතුවේ. ඒ අනුව, කල්බදු දීමනාකරුවෙක් මෙහෙයුම් කල්බදුවලට යටත්වන (අදාල වත්කමේ පන්තිය විසින්) වත්කම් සඳහා අයිතිව ඇති සහ කල්බදු දීමනාකරු භාවිතා කරන වත්කම් වලින් වෙන්ව LKAS 16 හි හෙළිදරවු කිරීමේ අවශ්‍යතා සැපයිය යුතු වේ.

96. කල්බදු දීමනාකරු මෙහෙයුම් කල්බදවලට යටත්වන වත්කම් සඳහා LKAS 36, LKAS 38, LKAS 40 සහ LKAS 41 හි හෙළිදරවු කිරීමේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කළයුතු වේ.

97. එක් එක් අවුරුදු පහේ අවමය සහ ඉතිරිව ඇති වර්ෂවල ප්‍රමාණයේ එකතුව පදනම්ව වාර්ෂික පදනම මත ලැබිය යුතු වට්ටම් නොකළ කල්බදු ගෙවීම් පෙන්වමින් කල්බදු ගෙවීම් කල්පිරීමේ විශ්ලේෂණයක් කල්බදු දීමනාකරු හෙළිදරවු කළයුතු වේ.

## විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙනු

98. අස්තිත්වයක් (විකුණුම්කරු – බදු ගැනුම්කරු) වත්කමක් වෙනත් අස්තිත්වයකට (මිලදී ගන්නා – බදු දීමනාකරු) පවරා එම වත්කම නැවත මිලදී ගන්නා බදුදීමනාකරුගෙන් කල්බදු ගනීනම් නම් විකුණුම්කරු – බදු ගැනුම්කරු සහ මිලදීගන්නා – බදු දීමනාකරු යන දෙන්නාම ගිවිසුම පැවරීම සහ කල්බද්ද සඳහා 99–103 ඡේද ප්‍රකාරව ගිණුම්ගත කළයුතු වේ.

### වත්කම පැවරීම විකිණීමක් ද යන්න තක්සේරු කිරීම.

99. අස්තිත්වයක් වත්කමක් පැවරීම වත්කමේ විකිණීමක් ලෙස ගිණුම්ගත කරනවාද යන්න නිශ්චය කිරීමට, SLFRS 15හි ඉටුකිරීමේ බැඳීමක් සම්පූර්ණ වූ විට, නිශ්චය කිරීම සඳහා අවශ්‍යතාවයන් ව්‍යවහාර කළයුතු වේ.

### වත්කම පැවරීම විකිණීමකි

100. වත්කමක් පැවරීම එම වත්කම විකිණීමක් ලෙස ගිණුම්ගත කිරීමට, SLFRS 15හි අවශ්‍යතාවයන් විකුණුකරු - කල්බදු ගැනුම්කරු විසින් සම්පූර්ණ කරයි නම්:

(අ) විකුණුම්කරු - බදු ගැනුම්කරු විසින් පාවිච්චියට රඳවාගත් අයිතියට සම්බන්ධ වත්කමේ කලින් ධාරණ අගයේ සමානුපාතිකයට, ප්‍රතිකල්බදුකරණයෙන් පැන නගින වත්කම පාවිච්චි කිරීමේ හිමිකම, විකුණුම්කරු - කල්බදු ගැනුම්කරු මැනිය යුතු වේ. ඒ අනුව මිලදී ගන්නා - බදු දීමනාකරුට පැවරූ හිමිකම් වලට අදාල යම් ප්‍රතිලාභ හෝ අලාභ ප්‍රමාණය පමණක් විකුණුම්කරු - කල්බදු ගැනුම්කරු හඳුනාගත යුතුය.

(ආ) වත්කම මිලදී ගැනීම සඳහා අදාලවන ප්‍රමිත ව්‍යවහාරයෙන් සහ කල්බද්ද සඳහා මෙම ප්‍රමිතියේ ගිණුම්කරණ අවශ්‍යතා ව්‍යවහාරයෙන්, මිලදී ගන්නා - බදු දීමනාකරු ගිණුම්ගත කළයුතු වේ.

101. වත්කමක් විකිණීම සඳහා ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය, වත්කමේ සාධාරණ අගයට සමාන නොවන්නේ නම් හෝ කල්බද්ද සඳහා වන ගෙවීම් වෙළෙඳපොල අනුපාතිකවලට නොවේ නම්, අස්තිත්වයක් විකිණීමෙන් ලැබුණු මුදල සාධාරණ අගයට මැනීමට පහත සඳහන් ගැලපීම් කළයුතු වේ.

(අ) කල්බදු ගෙවීම්වල කලින් ගෙවීමක් ලෙස ඕනෑම වෙළඳපොල කොන්දේසිවලට අඩුවීම් ගිණුම්ගත කළයුතු වේ.

(ආ) ඕනෑම වෙළෙඳපොල නියමයන් වැඩියෙන් දෑ, මිලදී ගන්නා – බදු දීමනාකරු විසින් විකුණුම්කරුට – බදු ගැනුම්කරුට සපයන ලද අමතර මූල්‍යයක් ලෙස ගිණුම්ගත කළයුතු වේ.

102. අස්තිත්වය 101 ඡේදයෙන් නියම කළ ඕනෑම විභව ගැලපීමක් වඩා පහසුවෙන් නිශ්චය කිරිමේ පදනමක් මත පහත ආකාරයට මැනිය යුතු වේ.

(අ) විකිණීම සඳහා ප්‍රතිෂ්ඨාවේ සාධාරණ අගය සහ වත්කමේ සාධාරණ අගය අතර වෙනස; සහ

(ආ) කල්බද්ද සඳහා ගිවිසුම්මය ගෙවීම්වල වර්තමාන අගය සහ වෙළෙඳපොල අනුපාතිකයට කල්බද්ද සඳහා ගෙවීම්වල වර්තමාන අගය අතර වෙනස.

**වත්කම පැවරීම විකිණීමක් නොවේ**

103. විකුණුම්කරු – බදු ගැනුම්කරු විසින් වත්කමක් පැවරීම වත්කම විකිණීමක් ලෙස ගිණුම්ගත කළයුතු SFLRS 15 හි අවශ්‍යතාවයන් සම්පූර්ණ නොවෙන්නේ නම්;

(අ) විකුණුම්කරු – බදු ගැනුම්කරු පැවරූ වත්කම හඳුනාගැනීමට දිගටම කළයුතු අතර විකුණුම් මුදලට සමාන මූල්‍ය වගකීමක් හඳුනාගත යුතු වේ. එය SLFRS -9 ප්‍රකාරව මූල්‍ය වත්කම සඳහා ගිණුම්ගත කළයුතු වේ.

(ආ) මිලදී ගන්නා – බදු දීමනාකරු පැවරූ වත්කම හඳුනානොගත යුතු අතර විකුණුම් මුදලට සමාන මූල්‍ය වත්කමක් හඳුනාගත යුතු වේ. එය SLFRS 9 ප්‍රකාරව මූල්‍ය වත්කම සඳහා ගිණුම්ගත කළයුතු වේ.

## අ පරිශිෂ්ඨය

## නිර්වචිත පද

*මෙම පරිශිෂ්ඨය මෙම ප්‍රමිතියේ අත්‍යවශ්‍ය කොටසකි.*

**කල්බද්දක ආරම්භක දිනය (ආරම්භක දිනය)** — **කල්බදු ගැනුම්කරු** විසින් **පදනම් වූ වත්කම** පාවිච්චි කිරීම සඳහා **කල්බදු දීමනාකරුවෙක්** දෙනු ලබන දිනයයි.

**ආර්ථික ජීවිත කාලය** — භාවිතා කරන්නන් එක් අයකු හෝ වැඩි දෙනෙකු විසින් වත්කමක් ආර්ථිකමය වශයෙන් භාවිතා කරනු ඇතැයි අපේක්ෂිත කාලපරිච්ඡේදය හෝ භාවිතා කරන්නන් එක් අයකු හෝ ඊට වැඩි දෙනෙකු විසින් වත්කමෙන් ලබා ගැනීමට අපේක්ෂිත නිෂ්පාදනය හෝ ඒ හා සමාන ඒකක ගණන වේ.

**සංශෝධනය බල පැවැත්වෙන දිනය** — පාර්ශවයන් දෙකම **කල්බදු සංශෝධනයකට** එකඟ වූ දිනයයි.

**සාධාරණ අගය** — මෙම ප්‍රමිතියේ **කල්බදු දීමනාකරුගේ** ගිණුම්කරණ අවශ්‍යතාවල අරමුණු සඳහා, දැනුම හා කැමැත්ත ඇති පාර්ශවයන් අතර අතේ දුරින් වූ ගණුදෙනුවකදී වත්කම හුවමාරු කළ හැකි වගකීමක් බේරුම් කළහැකි වටිනාකම වේ.

**මූල්‍ය කල්බද්ද** — **පදනම් වූ වත්කමක** අයිතිය මත ඇතිවන්නා වූ අවදානම් හා ප්‍රතිලාභ සියල්ලම පාහේ පවරා දෙනු ලබන **කල්බද්දකි.**

**ස්ථාවර ගෙවීම්** — **කල්බදු වාරය** තුලදී **පදනම් වූ වත්කම පාවිච්චි කිරීමේ හිමිකම** සඳහා **කල්බදු ගැනුම්කරුවෙක්** විසින් **කල්බදු දීමනාකරුට** සිදු කරන **විචල්‍ය කල්බදු ගෙවීම්** හැර ගෙවීම් වේ.

**කල්බද්දේ දළ ආයෝජනය** — පහත දෑවල සමාහාරය

(අ) **මූල්‍ය කල්බද්දක්** යටතේ **කල්බදු දීමනාකරුට** ලැබිය යුතු **කල්බදු ගෙවීම්** සහ

(ආ) කල්බදුදීමනාකරුට උපචිත වන ඕනෑම **සහතික නොකළ අවශේෂ වටිනාකම**

**කල්බද්දක ආරම්භක දිනය (ආරම්භක දිනය)** — කල්බදු ගිවිසුමේ දිනය සහ **කල්බද්දක** මූලික කොන්දේසි සහ නියමයන්ට පාර්ශවයන් බැඳීමක් ඇති කරගන්නා දිනය යන දෙකෙන් කලින් දිනය වේ.

**ආරම්භක සෘජු පිරිවැය** — **මූල්‍ය කල්බද්දක්** සම්බන්ධයෙන් නිෂ්පාදනකයෙකු හෝ බෙදාහරින්නෙකු වන **කල්බදු දීමනාකරු** දැරූ පිරිවැය හැර කල්බද්දක් ලබාගෙන නොතිබුනේ නම් **කල්බද්දක්** ලබා ගැනීමේදී දැරීමට නොහැකි වූ වර්ධක පිරිවැය වේ.

**කල්බද්දෙහි ව්‍යංග පොලී අනුපාතිකය** — (අ) **කල්බදු ගෙවීම්** සහ (ආ) පහත සඳහන් ඒවායේ එකතුවට සමාන වන **සහතික නොකළ අවශේෂ වටිනාකම** i **පදනම් වූ වත්කමේ සාධාරණ අගය** සහ ii **කල්බදු දීමනාකරුගේ** ඕනෑම **ආරම්භක සෘජු පිරිවැය** යන ඒවායින් පොලී අනුපාතිකයට හේතුවන වර්තමාන අගයයි.

**කල්බද්ද** — ප්‍රතිශ්ඨාවක් සඳහා හුවමාරුවන කාලපරිච්ඡේදයක් සඳහා වත්කමක් පාවිච්චි කිරීමේ හිමිකම (**පදනම් වූ වත්කම** ) ගිවිසුමකින් හෝ ගිවිසුමක කොටසකින් පවරා දීමකි.

**කල්බදු දීමනා** — **කල්බදු දීමනාකරු** විසින් කල්බද්දක් ආශ්‍රිතව **කල්බදු ගැනුම්කරුට** සිදුකරන ගෙවීම් හෝ කල්බදු ගැනුම්කරුගේ පිරිවැයේ කල්බදු දීමනාකරු විසින් කරන ප්‍රතිපූරණය හෝ කල්පිත.

**කල්බදු සංශෝධන** — කල්බද්දේ මුල් නියමයන් හා කොන්දේසිවල කොටසක් නොවන කල්බද්ද සඳහා වන ප්‍රතිෂ්ඨාවක් හෝ **කල්බද්දේ** විෂය පථයේ වෙනසක්

(උදාහරණ ලෙස **පදනම් වූ වත්කම්** එකක් හෝ ඊට වැඩියෙන් පාවිච්චි කිරීමේ හිමිකම එකතු කිරීම හෝ අවසන් කිරීම නැතහොත් ගිවිසුම්මය **කල්බදු වාරය** දීර්ඝ කිරීම හෝ කෙටිකිරීම)

**කල්බදු ගෙවීම්**

**කල්බදු වාරය** තුලදී **පදනම් වූ වත්කමක්** පාවිච්චි කිරීමේ හිමිකමට සම්බන්ධ **කල්බදු දීමනාකරුට කල්බදු ගැනුම්කරු** විසින් සිදු කරන පහත සඳහන් ගෙවීම් වලින් සමන්විත වේ.

(අ) ඕනෑම **කල්බදු දිරිදීමනා** අඩු කළ **ස්ථාවර ගෙවීම්** (ප්‍රධාන ස්ථාවර ගෙවීම් ඇතුලත්ව);

(ආ) අනුපාතිකයක් හෝ දර්ශකයක් මත රඳා පවතින **විචල්‍ය කල්බදු ගෙවීම්;**

(ඇ) කල්බදු ගැනුම්කරු මිලදී ගැනීමේ විකල්පයක් ක්‍රියාත්මක කිරීමට සාධාරණව නිශ්චිත නම් එම විකල්පය ක්‍රියාත්මක වන මිල;

(ඈ) **කල්බද්ද** අවසන් කිරීමට කල්බදු ගැනුම්කරු විකල්පය ක්‍රියාත්මක කිරීම කල්බදු වාරයෙන් පිළිබිඹු වේ නම් කල්බද්ද අවසන් කිරීමට දඩ ගෙවීම්;

කල්බදු ගැනුම්කරුවෙක් සඳහා, අවශේෂ වටිනාකම සහතිකවීම් යටතේ කල්බදු ගැනුම්කරුවෙක් විසින් ගෙවීමට බලාපොරොත්තු වන වටිනාකම්ද කල්බදු ගෙවීම්වල ඇතුලත්වේ. කල්බදු ගැනුම්කරු කල්බදු සංරචකයක් සමඟ කල්බදු නොවන සංරචකයක් එකට සම්බන්ධ කර තනි කල්බදු සංරචකයක් ලෙස ගිණුම්ගත කිරීමට තෝරාගත හොත් හැර ගිවිසුමක කල්බදු නොවන සංරචකවලට බෙදාවෙන් කළ ගෙවීම් කල්බදු ගෙවීම් තුල ඇතුලත් නොවේ.

කල්බදු දීමනාකරුවෙක් සඳහා සහතික කිරීම් යටතේ බැඳීම් නිදහස් කිරීමේ මූල්‍ය හැකියාව කල්බදු දීමනාකරුට සම්බන්ධ නොවන තෙවන පාර්ශ්වයක් හෝ කල්බදු ගැනුම්කරුට සම්බන්ධ පාර්ශවයක්. කල්බදු ගැනුම්කරු විසින් කල්බදු දීමනාකරුට සපයන ඕනෑම අවශේෂ වටිනාකම සහතික වීම්ද කල්බදු ගෙවීම්වල ඇතුලත් වේ. කල්බදු නොවන සංරචකවලට වෙන්කළ ගෙවීම්, කල්බදු ගෙවීම්වල ඇතුලත් නොවේ.

**කල්බදු වාරය**

(අ) කල්බදු ගැනුම්කරුවෙක් විසින් විකල්පයක් ක්‍රියාත්මක කිරීම සාධාරණ නිශ්චිත නම් කල්බද්ද දීර්ඝ කිරීමට විකල්පයෙන් ආවරණය වන කාලපරිච්ඡේද; සහ

(ආ) කල්බදු ගැනුම්කරුවෙක් එම විකල්පය ක්‍රියාත්මක නොකිරීමට සාධාරණ ලෙස නිශ්චිත නම් කල්බද්ද අවසන් කිරීමට විකල්පයක් මගින් ආවරණය වන කාලපරිච්ඡේද,

යන දෙකම මගින් අදාල වත්කම පාවිච්චිකිරිමට හිමිකම කල්බදු ගැනුම්කරුට තිබෙන අවලංගු කළ නොහැකි කාලපරිච්ඡේදයයි.

**කල්බදු ගැනුම්කරු**

ප්‍රතිෂ්ඨාවක් සඳහා හුවමාරුවන කාලපරිච්ඡේදය සඳහා පදනම් වූ වත්කමක් පාවිච්චියට හිමිකම ලබාගන්නා අස්තිත්වය.

**කල්බදු ගැනුම්කරුගේ වර්ධක ණය අනුපාතිය**

සමාන නියමයන් තුල සහ සමාන ආරක්ෂක ඇපයක් සහිතව කල්බද්දක් මත ණය ගෙවීමට සමාන ආර්ථික පරිසරයක් තුල **වත්කම පාවිච්චි කිරීමේ හිමිකමට** සමාන වටිනාකමක් ලබා දීමට අරමුදල් ලබා ගැනීමේදී ණය ගෙවීමට **බදුගැනුම්කරු** විසින් දැරිය යුතු පොලී අනුපාතිකයයි.

**කල්බදු දීමනාකරු**

ප්‍රතිෂ්ඨාපනයක් සඳහා හුවමාරු වන කාලපරිච්ඡේදයක් සඳහා **පදනම් වූ වත්කම** පාවිච්චියට හිමිකම සපයා දෙන අස්තිත්වයකි.

**කල්බද්දේ ශුද්ධ ආයෝජනය**

**කල්බද්දේ ව්‍යංග පොලී අනුපාතිකයට** වට්ටම් කළ **කල්බද්දේ දළ ආයෝජනයයි.**

| | |
|---|---|
| **මෙහෙයුම් කල් බදු** | **පදනම් වූ වත්කමක** හිමිකමට සම්බන්ධ අවදානම් සහ ප්‍රතිලාභ සියල්ලම පාහේ පවරා දෙනු නොලබන **කල්බද්දකි.** |
| **විකල්ප කල්බදු ගෙවීම්** | **කල්බදුවාරයේ** ඇතුලත් නොවන කල්බද්දක් අවසන් කිරීමට හෝ දීර්ඝ කිරීමට විකල්පයක් ආවරණය වන කාලපරිච්ඡේද තුල **පදනම් වූ වත්කමක්** පාවිච්චියට හිමිකම සඳහා **කල්බදු දීමනාකරුට කල්බදු ගැනුම්කරු** විසින් සිදුකරන ගෙවීම් වේ. |
| **පාවිච්චි කරන කාලය** | ගණුදෙනුකරුවෙක් සමග ගිවිසුමකින් ඉටුකරන වත්කමක් භාවිතා කරන මුළු කාලපරිච්ඡේදය වේ. |
| **අවශේෂ වටිනාකම සහතික කිරීම** | අඩුම තරමින් නිශ්චිත අගයකට **කල්බද්දක්** අවසානයේ **පදනම් වූ වත්කමේ වටිනාකම** (වටිනාකමින් කොටසක් හෝ) කල්බදු දීමනාකරුට සම්බන්ධ නොවන පාර්ශවයක් විසින් **කල්බදු දීමනාකරුට** සිදුකරන සහතිකවීමකි. |
| **වත්කම පාවිච්චි කිරීමේ හිමිකම** | **කල්බදුවාරය** සඳහා **පදනම් වූ වත්කමක්** පාවිච්චියට **කල්බදු ගැනුම්කරුගේ** හිමිකමක් නිරූපනය කරන වත්කමකි. |
| **කෙටිකාලීන කල්බදු** | **කල්බද්දක් ආරම්භක දිනයට**, **කල්බදුවාරය** මාස 12 ක් හෝ ඊට අඩුවෙන් තිබෙන කල්බද්දකි. මිලදී ගැනීමේ විකල්පයක් සමන්විත කල්බද්දක් කෙටිකාලීන කල්බද්දක් නොවේ . |
| **උපකල්බද්ද** | කල්බදු ගැනුම්කරු සහ ප්‍රධාන කල්බදු දීමනාකරු අතර කල්බද්දේ (ප්‍රධාන කල්බද්ද) බලපෑම එලෙසම තිබෙන සහ තෙවැනි පාර්ශවයකට **කල්බදු ගැනුම්කරුවෙක්** (අතරමැදි කල්බදු දීමනාකරු) **පදනම් වූ වත්කමක්** නැවත **කල්බදු දීමේ** ගණුදෙනුවකි. **කල්බදු ගැනුම්කරුවෙකුට කල්බදු දීමනාකරු** විසින් වත්කමක් කල්බද්දට යටත්ව වත්කම පාවිච්චි කිරීමේ හිමිකම සපයා දීමකි. |
| **නොඉපයූ මූල්‍ය ආදායම** | (අ) **කල්බද්දේ දළ ආයෝජනය** සහ<br>(ආ) **කල්බද්දේ ශුද්ධ ආයෝජනය**<br>අතර වෙනසයි. |
| **සහතික නොකල අවශේෂ වටිනාකම** | **පදනම් වූ වත්කමේ** අවශේෂ වටිනාකමේ කොටස **කල්බදු දීමනාකරු** විසින් උපලබ්ධිවීම. කල්බදු දීමනාකරු විසින් තහවුරු නොකිරීමෙන් හෝ කල්බදු දීමනාකරු සම්බන්ධ පාර්ශවයක් විසින් තනිකරම සහතික වීම. |
| **විචල්‍ය කල්බදු ගෙවීම්** | කාලයේ ගමන් මග හැර ආරම්භක දිනට පසු සිදුවන කරුණු සහ සිද්ධිවල වෙනස්වීම් නිසා වෙනස්වන කල්බදු වාරය තුලදී **පදනම් වූ වත්කමේ** පාවිච්චි කිරීමේ හිමිකම සඳහා **කල්බදු දීමනාකරුට කල්බදු ගැනුම්කරු** විසින් සිදුකරනු ලබන ගෙවීම්වල කොටසකි. |

## වෙනත් ප්‍රමිතිවල නිර්වචිත පද සහ සමාන තේරුම සමග මෙම ප්‍රමිතියේ භාවිත කිරීම්

| | |
|---|---|
| **ගිවිසුම** | පාර්ශව දෙකක් හෝ ඊට වැඩියෙන් අතරේ වලංගු වන යුතුකම් සහ බැඳීම් ඇතිකරන එකඟවීමකි. |
| **ප්‍රයෝජනවත් ජීවිත කාලය** | අස්තිත්වයක් විසින් වත්කම තුලින් ලබා ගැනීම අපේක්ෂිත නිෂ්පාදන ඒකක ගණන හෝ ඒ හා සමාන ඒකක හෝ අස්තිත්වයක් විසින් භාවිතා කිරීමට අපේක්ෂිත වත්කමේ කාලසීමාව වේ. |

## ආ පරිශිෂ්ඨය

## ව්‍යවහාර කිරීමේ මඟ පෙන්වීම්

*මෙම පරිශිෂ්ඨය මෙම ප්‍රමිතියේ කොටසක් වේ. 1 සිට 103 දක්වා ඡේදවල ව්‍යවහාර කිරීම් විස්තර කරන අතර ප්‍රමිතියේ අනෙක් කොටස් මෙන් සමාන අධිකාරිත්වයක් ඇත.*

### කළඹ ව්‍යවහාර කිරීම

ආ1. තනි කල්බද්දක් සඳහා ගිණුම්කරණය මෙම ප්‍රමිතියේ විශේෂයෙන් සඳහන් කරයි. කෙසේ නමුත් ප්‍රායෝගික භාවිතයේදී, අස්තිත්වයක් කල්බදු කළඹ තුළ තනි තනි කල්බදු වලට මෙම ප්‍රමිතිය ව්‍යවහාර කිරීමෙන් ප්‍රමාණාත්මක වෙනස් නොවන කළඹවලට මෙම ප්‍රමිතිය ව්‍යවහාර කිරීමෙන් මූල්‍ය ප්‍රකශන මත බලපෑම සාධාරණව අපේක්ෂාකරයි නම්, සමාන ලක්ෂණ සහිත කල්බදු කළඹයකට මෙම ප්‍රමිතිය ව්‍යවහාර කළ හැකිය. කළඹයක් සඳහා ගිණුම්කරණය කරන්නේ නම්, අස්තිත්වයක් කළඹයේ ප්‍රමාණය සහ සංයුතිය පිළිබිඹු වන ඇස්තමේන්තු සහ උපකල්පන භාවිතා කළයුතු වේ.

### ගිවිසුම්වල සංයෝජන

ආ2. මෙම ප්‍රමිතිය ව්‍යවහාර කිරීමෙන්, අස්තිත්වයක් එක සමාන ප්‍රතිපාර්ශවයක් සමඟ (හෝ ප්‍රතිපාර්ශවයේ සම්බන්ධිත පාර්ශව) එකම වේලාවක හෝ ආසන්නයේ දී හෝ දෙකක් හෝ ඊට වැඩි ගිවිසුම් වලට එළඹුණු ගිවිසුම් සම්බන්ධ කළහැකි අතර පහත සඳහන් නිර්ණායක එකක් හෝ ඊට වැඩියෙන් සම්පූර්ණ වන්නේ නම් තනි ගිවිසුමක් ලෙස ගිවිසුම් සඳහා ගිණුම්ගත කරයි.

(අ) ගිවිසුම් එකට සලකා බැලීමකින් තොරව තේරුම් ගැනීමට නොහැකි සමස්ත වාණිජමය අරමුණ සමඟ පැකේජයක් වශයෙන් ගිවිසුම් සාකච්ඡා කිරිම;

(ආ) අනෙකුත් ගිවිසුම්වල මිල හෝ කාර්යසාධන මත රඳාපවතිමින් එක් ගිවිසුමක් තුලින් ගෙවීමට නියමිත ප්‍රතිෂ්ඨාවේ වටිනාකම; හෝ

(ඇ) ආ 32 ඡේදයේ විස්තර කර ඇති පරිදි තනි කල්බදු සංරචකයක් මගින් (එක් එක් ගිවිසුමකින් පවරා දෙනු ලබන පදනම් වූ වත්කම පාවිච්චියට සමහර හිමිකම් හෝ) ගිවිසුම් වලින් පවරාදෙනු ලබන අදාල වත්කම පාවිච්චි කිරීමේ හිමිකම්.

### නිදහස්වීම් හඳුනාගැනීම : අඩු වටිනාකම් වලින් යුක්ත පදනම් වූ වත්කම සඳහා කල්බදු (5-8 ඡේද)

ආ3. ආ7 ඡේදයෙන් විශේෂයෙන් සඳහන් දෑ හැර, අඩු වටිනාකමින් යුක්ත පදනම් වූ වත්කමේ කල්බදු සඳහා ගිණුම්ගත කිරීමට මෙම ප්‍රමිතියේ 6 වැනි ඡේදය ව්‍යවහාර කිරීමට ඉඩ දෙයි. කල්බදු කළ වත්කමේ ජීවකාලය නොසලකා අදාල වත්කම අළුත් වන විට වත්කමේ වටිනාකම පදනම් කරගෙන කල්බදු ගැනුම්කරුවෙක් එම වත්කමේ වටිනාකම අගය කළයුතු වේ.

ආ4. අදාල වත්කම අඩු වටිනාකමින් යුක්ත දැයි තක්සේරු කිරීම නිරපේක්ෂ පදනමක් මත ඉටුකරයි. කල්බදු ගැනුම්කරුවෙකුට මෙම කල්බදු ප්‍රමාණාත්මක ද නැද්ද නොසලකා, 6 වැනි ඡේදයේ ගිණුම්කරණය කිරීම සඳහා, අඩු වටිනාකම් වත්කම්වල කල්බදු සුදුසුකම් ලබයි. කල්බද්දේ ප්‍රමාණය, ස්වභාවය හෝ සිද්ධි තක්සේරුවට බලනොපායි. ඒ අනුව, අදාල වත්කම අඩු වටිනාකම් සහිත වත්කමක්දැයි පිළිබඳ සමාන නිගමනයන්ට ළගාවීමට, වෙනස් වූ කල්බදු ගැනුම්කරුවන්ගෙන් බලාපොරොත්තු වේ.

ආ5. පහත සඳහන් දෑ පමණක් නම්, පදනම් වූ වත්කමක් අඩු වටිනාකමින් යුක්ත විය හැකිය.

(අ) කල්බදු ගැනුම්කරුට පදනම්වූ වත්කම පමණක් හෝ පහසුවෙන් ලබාගත හැකි අනෙකුත් සම්පත් සමඟ පාවිච්චියෙන් කල්බදු ගැනුම්කරුට ප්‍රතිලාභ ලබාගත හැකිය; සහ

(ආ) පදනම් වූ වත්කම අනෙකුත් වත්කම සමඟ වැඩිවශයෙන් රඳා නොපවතින හෝ වැඩි වශයෙන් එකට සම්බන්ධ නොවේ.

ආ6. වත්කමේ ස්වභාවය අළුත් වන විට වත්කම නියත ලෙස අඩු වටිනාකමින් නොවෙන්නේ නම් අඩුවටිනාකම් සහිත වත්කමක කල්බද්දක් ලෙස පදනම් වූ වත්කමේ කල්බද්ද සුදුසුකම් නොලබයි. උදාහරණ ලෙස අළුත් මෝටර් රථ නියත ලෙස අඩු වටිනාකමින් යුක්ත නොවන නිසා මෝටර් රථ කල්බදු අඩු වටිනාකම් වත්කම් වල කල්බදු ලෙස සුදුසුකම් නොලබයි.

ආ7. කල්බදු ගැනුම්කරුවෙක් වත්කමක් උපකල්බදු කරයි නම් හෝ වත්කමක් උපකල්බදු කිරීමට අපේක්ෂා කරයි නම්, ප්‍රධාන කල්බද්ද අඩු වටිනාකම් වත්කමක කල්බද්දක් ලෙස සුදුසුකම් නොලබයි.

ආ8. අඩුවටිනාකම සහිත පදනම් වූ වත්කම් වලට උදාහරණ ලෙස අතෙහි ගෙනයන පරිගණක, පෞද්ගලික පරිගණක, කාර්යාල ලීබඩු වල කුඩා අයිතම සහ දුරකථන ඇතුලත් කළ හැකිය.

## කල්බද්දක් හඳුනාගැනීම (9-11 ඡේද)

ආ9. කාලපරිච්ඡේදයක් සඳහා හඳුනාගත් වත්කමේ පාවිච්චිය පාලනය කිරීමට හිමිකම ගිවිසුමකින් පැවරේදැයි තක්සේරු කිරීමට (ආ13 -ඇ20 ඡේද බලන්න) *පාවිච්චි කරන කාලපරිච්ඡේදය* පුරාම ගණුදෙණුකරුවන්ට පහත සඳහන් කරුණු දෙකම තිබේදැයි අස්තිත්වයක් තක්සේරු කළයුතු වේ.

(අ) හඳුනාගත් වත්කම පාවිච්චියෙන් බොහෝදුරට සියලුම ආර්ථික ප්‍රතිලාභ සියල්ලම ලබාගැනීමට අයිතිය (ආ21-ආ 23 ඡේදවල විස්තර කර ඇති පරිදි); සහ

(ආ) හඳුනාගත් වත්කම පාවිච්චියට මග පෙන්වන අයිතිය (ආ 24 -ආ 30 ඡේදවල විස්තර කර ඇති පරිදි).

ආ10. ගණුදෙණුකරුවෙකුට ගිවිසුමේ නියමයන් වලින් කොටසක් පමණක් සඳහා හඳුනාගත් වත්කමේ පාවිච්චිය පාලනය කිරීමට අයිතිය තිබේ නම්, ගිවිසුම් වාරයේ කොටසක් සඳහා වන කල්බද්දකින් ගිවිසුම් සමන්විත වේ.

ආ11. SLFRS 11 හි නිර්වචන කළ ආකාරයක, බද්ධ එකඟවීමක් හෝ බද්ධ එකඟවීමක් වෙනුවෙන් භාණ්ඩ හෝ සේවා ලැබීමට ගිවිසුමකට එළඹිය හැකිය. මෙම අවස්ථාවේදී, ගිවිසුමක ගණුදෙනුකරුවෙක් ලෙස බද්ධ එකඟවීම සලකනු ලැබේ. ඒ අනුව ගිවිසුමක් කල්බද්දකින් සමන්විත ද යන්න තක්සේරු කිරීමේදී, අස්තිත්වයක් පාවිච්චි කරන කාලපරිච්ඡේදය පුරා හඳුනාගත් වත්කම භාවිතය පාලනය කිරීමට අයිතියක් බද්ධ එකඟවීමක තිබේද යන්න තක්සේරු කළයුතු වේ.

ආ12. අස්තිත්වයක් එක් එක් විභව වෙන් වූ සංරචකයක් සඳහා ගිවිසුමක් කල්බද්දකින් සමන්විත ද යන්න තක්සේරු කළයුතු වේ. වෙන් වූ කල්බදු සංරචක මත මඟපෙන්වීම් සඳහා ආ32 ඡේදයට යොමු වන්න.

**හඳුනාගත් වත්කම**

ආ13. සවිස්තර ලෙස විශේෂයෙන් නියම කළ ගිවිසුමක් මගින් වත්කමක් නියම ලෙස හඳුනාගනී. කෙසේ නමුත් ගණුදෙනුකරු විසින් භාවිතය සඳහා දී තිබෙන වත්කම විශේෂයෙන් නියම කළ කාලයකට ගම්‍ය වත්කමක්දැයි හඳුනාගැනීමට පුළුවනි.

*සැලකියයුතු හිළවූකරන අයිතීන්*

ආ14. වත්කමක් විශේෂයෙන් නියම කරන ලද්දේ නම් වුවත්, පාවිච්චි කරන කාලපරිච්ඡේදය පුරාම වත්කම හිලවු කිරීමට සැලකියයුතු අයිතියක් සැපයුම්කරුට තිබේනම්, හඳුනාගත් වත්කම පාවිච්චි කිරීමේ හිමිකම ගණුදෙනුකරුට නොමැත. පහත සඳහන් කොන්දේසි දෙකම පවතී නම් පමණක්, වත්කම හිළවු කිරීමේ සැපයුම්කරුගේ අයිතිය තහවුරු වේ.

(අ) පාවිච්චි කරන කාලපරිච්ඡදය පුරාම විකල්ප වත්කම් හිලවු කිරීමට ප්‍රායෝගික හැකියාව සැපයුම්කරුට තිබීම (උදාහරණ ලෙස, සැපයුම්කරුට ගණුදෙනුකරු වත්කම හිළව්කිරිම වැළැක්විය නොහැකිවීම සහ සැපැයුම්කරුට විකල්ප වත්කම් පහසුවෙන් තිබීම හෝ සාධාරණ කාලපරිච්ඡේදයක් තුල සැපයුම්කරුවෙක් විසින් ලබාගතහැකි වීම); සහ

(ආ) වත්කම හිළවු කිරීමට එහි හිමිකම ක්‍රියාත්මක කිරීමෙන් සැපැයුම්කරුට ආර්ථිකමය වාසි ඇතිවීම (එනම් වත්කම හිලවු කිරීම ආශ්‍රිත ආර්ථික ප්‍රතිලාභ, වත්කම හිළවුකිරීම ආශ්‍රිත පිරිවැය ඉක්මයෑම අපේක්ෂා කිරීම).

ආ15. විශේෂිත දිනයක් හෝ විශේෂිත සිද්ධියක් සිදුවන දිනය හෝ ඊට පසු පමණක් වත්කම හිලවුකිරීමට අයිතියක් හෝ බැඳීමක් සැපයුම්කරුට තිබේ නම්, පාවිච්චි කරන කාලපරිච්ඡේදය පුරා විකල්ප වතකම හිලවු කිරීමට ප්‍රායෝගික හැකියාවක් සැපයුම්කරුට නොතිබෙන නිසා සැපයුම්කරුගේ හිලවුකිරීමේ අයිතිය තහවුරු නොවේ.

ආ16. ගිවිසුම ආරම්භක දිනට සිද්ධි සහ සිදුවීම් පදනම් කරගෙන සැපයුම්කරුගේ හිලවුකිරීමේ අයිතිය තහවුරු වේද යන්න අස්තිත්වයක් අගය කිරීම, සහ ගිවිසුම ආරම්භක දිනට අනාගත සිද්ධිවල සලකාබැලීම් බැහැර කරන්නේද

යන්න, සිදුවිය හැකි ලෙස නොසලකයි. ගිවිසුමේ ආරම්භයේදී අනාගත සිද්ධි සිදුවිය හැකි ලෙස නොසලකන සහ එසේ අගය කිරීමෙන් ඉවත් කළයුතු බව පහත උදාහරණවල ඇතුලත් වේ.

(අ) වත්කම පාවිච්චිය සඳහා වෙළෙඳපොල අනුපාතිකයට වඩා වැඩියෙන් ගෙවීමට අනාගත ගණුදෙනුකරුවෙකුගේ එකඟවීමක්;

(ආ) ගිවිසුම ආරම්භයේදී සැලකිය යුතු ලෙස සංවර්ධනය නොකරන ලද අළුත් තාක්‍ෂණ හඳුන්වා දීම;

(ඇ) වත්කමේ ගණුදෙනුකරුගේ පාවිච්චිය හෝ වත්කමේ කාර්යසාධනය සහ ගිවිසුමේ ආරම්භයේ වියහැකි භාවිතය සලකන හෝ කාර්යසාධන අතර සැලකිය යුතු වෙනසක්; සහ

(ඈ) පාවිච්චි කරන කාලපරිච්ඡේදය තුලදී වත්කමේ වෙළෙඳපොල මිල සහ ගිවිසුම ආරම්භයේ වියහැකි ලෙස සලකන වෙළෙඳපොල මිල අතර සැලකිය යුතු වෙනසක.

ආ17. වත්කම පිහිටවූයේ ගණුදෙනුකරුගේ පරිශ්‍රයේ හෝ වෙනත් තැනක නම්, හිළවුකිරීමට ආශ්‍රිත පිරිවැය සාමාන්‍යයෙන් සැපයුම්කරුගේ පරිශ්‍රයේ පිහිටීමට වඩා වැඩි අතර එම නිසා වත්කම හිලවු කිරීම ආශ්‍රිත ප්‍රතිලාභ බොහෝවිට ඉක්මවිය හැකිය.

ආ18. වත්කම නියම ලෙස ක්‍රියා නොකරන්නේ නම් හෝ පවතින තාක්‍ෂණික වැඩිදියුණු කිරීම් ඇතිවී තිබේ නම්, අළුත්වැඩියා සහ නඩත්තු සඳහා සැපයුම්කරුගේ අයිතීන් සහ බැදීම් හිලවුකිරීමට හඳුනාගත් වත්කමක් පාවිච්චි කිරීමට හිමිකම තිබීමෙන් ගණුදෙනුකරු වැළැක්විය නොහැකිය.

ආ19. සැපයුම්කරුට තහවුරු කරන හිලවුකිරීමේ අයිතියක් තිබේදැයි ගණුදෙනුකරුට පහසුවෙන් නිශ්චය කළ නොහැකි නම්, ගණුදෙනුකරු ඕනෑම හිළවුකිරීම් අයිතිය තහවුරු නොවන බව අනුමාන කළයුතු වේ.

*වත්කම්වල කොටස්*

ආ20 වත්කම පැහැදිලි ලෙස භෞතික වශයෙන් තිබේ නම්, වත්කමක ධාරිතාවේ කොටසක් (උදාහරණ ලෙස ගොඩනැඩගිල්ලක බිම) හඳුනාගත හැකි වත්කමකි. වත්කමේ පාවිච්චියෙන් ආර්ථික ප්‍රතිලාභ සියල්ලම ලබා ගැනීමට අයිතිය සමග ගණුදෙනුකරුට සැපයීමට සහ එය වත්කමේ සියලුම ධාරිතාවයපාහේ නිරූපණය වන්නේ නම් හැර වත්කමක ධාරිතාවයක හෝ වෙනත් කොටසක් පැහැදිලි ලෙස භෞතිකව නොතිබේනම් (උදාහරණ ලෙස ෆයිබර් ඔප්ටික් කම්බියක කොටසක්) එය හඳුනාගත් වත්කමක් නොවේ.

## පාවිච්චියෙන් ආර්ථික ප්‍රතිලාභ ලබාගැනීමට හිමිකම

ආ21 හඳුනාගත් වත්කමක පාවිච්චිය පාලනය කිරීමට, ගණුදෙනුකරුවෙකුට පාවිච්චි කරන කාලපරිච්ඡේදය පුරා වත්කමේ පාවිච්චියෙන් සියලුම ආර්ථික ප්‍රතිලාභ පාහේ ලබා ගැනීමට අයිතිය තිබීම අවශ්‍ය වේ (උදාහරණ ලෙස එම කාලපරිච්ඡේදය පුරා වත්කම පාවිච්චිය සම්පූර්ණයෙන් තිබීම). ගණුදෙනුකරුවෙක් වත්කම පාවිච්චියෙන්, තබා ගැනීමෙන්, උපකල්බදු කිරීමෙන් වැනි විවිධ ක්‍රම මගින් සෘජුව හෝ සෘජු නොවන ලෙස වත්කම පාවිච්චි කිරීමෙන් ආර්ථික ප්‍රතිලාභ ලබා ගත හැකිය. ප්‍රධාන නිපයුම සහ අතුරු නිෂ්පාදන (එම අයිතමවලින් ජනිතවන විභව මුදල් ප්‍රවාහද ඇතුලත්ව) සහ තෙවැනි පාර්ශවයක් සමඟ වානිජමය ගණුදෙනුවක් තුලින් වත්කම පාවිච්චියෙන් උපලබ්ධිවන අනෙකුත් ආර්ථික ප්‍රතිලාභ, වත්කම පාවිච්චි කිරීමෙන් ආර්ථික ප්‍රතිලාභ තුල ඇතුලත් වේ.

ආ22 වත්කම පාවිච්චියෙන් සියලුම ආර්ථික ප්‍රතිලාභ පාහේ ලබා ගැනීමට හිමිකම තක්සේරු කරන විට, අස්තිත්වයක් වත්කම පාවිච්චි කිරීමට ගණුදෙනුකරුගේ හිමිකමේ විෂය පථය නිර්වචනය කරන ලද වත්කමේ පාවිච්චිය තුලින් ප්‍රතිඵල දෙන ආර්ථික ප්‍රතිලාභ සැලකිය යුතු වේ. (ආ 30 ඡේදය බලන්න.)

*උදාහරණ*

(අ) පාවිච්චි කරන කාලපරිච්ඡේදය තුලදී මෝටර් රථයක් භාවිතා කිරීම විශේෂිත වූ ප්‍රදේශයකට පමණක් ගිවිසුමකින් සීමා කරන්නේ නම්, අස්තිත්වයක් එම ප්‍රදේශය තුල පමණක් මෝටර් රථය භාවිතා කිරීමෙන් ලැබෙන ආර්ථික වාසි පමණක් සලකා බැලිය යුතු වේ.

(ආ) පාවිච්චි කරන කාලපරිච්ඡේදය තුලදී ගණුදෙනුකරුට මෝටර් රථයක් ධාවනය කළ හැක්කේ යම් විශේෂිත සැතපුම් ප්‍රමාණයට පමණක් බව ගිවිසුමකින් විශේෂයෙන් සඳහන් කරන්නේ නම්, අස්තිත්වයක් එම සීමාකළ සැතපුම් ප්‍රමාණය සඳහා මෝටර් රථය භාවිතයෙන් ලැබෙන ආර්ථික ප්‍රතිලාභ පමණක් සලකා බැලිය යුතු වේ.

ආ23 ප්‍රතිෂ්ඨාවක් ලෙස වත්කම පාවිච්චියෙන් පැනනගින මුදල් ප්‍රවාහවල කොටසක් සැපයුම්කරුවෙකුට හෝ වෙනත් පාර්ශවයකට ගෙවීමට ගණුදෙනුකරුට ගිවිසුමකින් නියමකර ඇත්නම්, ප්‍රතිෂ්ඨාවක් ලෙස ගෙවූ එම මුදල් ප්‍රවාහ වත්කමේ පාවිච්චියෙන් ගණුදෙනුකරු ලබාගන්නා ආර්ථික වාසිවල කොටසක් ලෙස සැලකිය යුතු වේ. උදාහරණ ලෙස, සිල්ලර ස්ථානය පාවිච්චි කිරීම වෙනුවෙන් ප්‍රතිෂ්ඨාවක් ලෙස විකුනුම් වලින් ප්‍රතිශතයක් සැපයුම්කරුට, ගණුදෙනුකරු ගෙවීමට නියමිත නම්, එම අවශ්‍යතාවයෙන් සිල්ලර ස්ථානය පාවිච්චි කිරීමෙන් ලැබෙන සියලුම ආර්ථික ප්‍රතිලාභ පාහේ ලබාගැනීමට අයිතිය තිබීමෙන් ගණුදෙනුකරු වැළැක්විය නොහැකිවේ. මෙය විකුණුම් වලින් ජනනය වන මුදල් ප්‍රවාහ නිසා, සිල්ලර ස්ථානය පාවිච්චි කිරීමට හිමිකම සඳහා ප්‍රතිෂ්ඨාවක් ලෙස සැපයුම්කරුට ගෙවන කොටසද ගණුදෙනුකරු ලබා ගන්නා ආර්ථික ප්‍රතිලාභ ලෙස සලකා බැලිය යුතු වේ.

## භාවිතයට මඟ පෙන්වීමේ හිමිකම

ආ24 පහත සඳහන් එකක් පමණක් ඇත්නම්, පාවිච්චි කරන කාලපරිච්ඡේදය පුරා හඳුනාගත් වත්කම පාවිච්චියට මඟ පෙන්වීමට, ගණුදෙනුකරුට හිමිකමක් තිබේ.

(අ) පාවිච්චි කරන කාලපරිච්ඡේදය පුරාම වත්කම භාවිතා කරන්නේ කෙසේද? කුමන අරමුණකටද යන්න මඟ පෙන්වීමට ගණුදෙනුකරුට අයිතිය තිබේ. (ආ25 - ඇ30 ඡේද වල විස්තර කර ඇති පරිදි) ;නැතහොත්

(ආ) වත්කම පාවිච්චි කරන්නේ කෙසේද? කුමන අරමුණකට යන්න පිළිබඳ අදාල තීරණ කලින් නිශ්චය කිරීම සහ

i. වත්කම ක්‍රියාකිරීමේ උපදෙස් සැපයුම්කරුට වෙනස් කිරීමක් නොමැතිව, පාවිච්චි කරන කාලපරිච්ඡේදය පුරාම වත්කම ක්‍රියා කිරීමට ගණුදෙනුකරුට හිමිකම තිබීම ( හෝ නිශ්චය කළ ආකාරයකට වත්කම ක්‍රියා කිරීමට අනෙකුත් අයට මඟ පෙන්වීමට ); හෝ

ii. ගණුදෙනුකරු පාවිච්චි කරන කාලපරිච්ඡේදය පුරාම වත්කම පාවිච්චි කරන්නේ කෙසේද? කුමන අරමුණකට යන්න නිශ්චය කරන ආකාරය ගණුදෙනුකරු, වත්කම සැලසුම් කර තිබීම (වත්කමේ විශේෂිත කොටස් හෝ)

*වත්කම පාවිච්චි කරන්නේ කෙසේද කුමන අරමුණකටද*

ආ25 කාලපරිච්ඡේදය පුරාම වත්කම පාවිච්චි කරන්නේ කෙසේද සහ කුමන අරමුණකටද එය වෙනස් කිරීමට පුළුවන් ගිවිසුමකින් නිර්වචනය කළ එහි පාවිච්චි කිරීමේ හිමිකම විෂය පථයට ඇතුලත් නම්, වත්කම පාවිච්චි කරන්නේ කෙසේද කුමන අරමුණකටද මඟ පෙන්වීමට ගණුදෙනුවකට හිමිකම තිබේ. මෙම තක්සේරුව කිරීමේදී අස්තිත්වයක් පාවිච්චි කරන කාලපරිච්ඡේදය පුරාම වත්කම පාවිච්චි කරන්නේ කෙසේද සහ කුමන අරමුණක් සඳහා වෙනස් කරන්නේදැයි වඩා වැදගත් වන තීරණ ගැනීමේ අයිතින් සලකා බලයි. පාවිච්චියෙන් හට ගන්නා ලද ආර්ථික ප්‍රතිලාභ බලපෑම් කරන විට, තීරණ ගැනීමේ අයිතීන් අදාල වේ. වත්කමේ ස්වභාවය සහ ගිවිසුමක නියමයන් සහ කොන්දේසි මත රුදෙමින්, වඩා අදාලවන තීරණ ගැනීමේ අයිතීන් වෙනස් ගිවිසුම් සඳහා වෙනස්වීමට විය හැක.

ආ26 පාවිච්චි කරන ගණුදෙනුකරුගේ හිමිකමේ නිර්වචිත විෂය පථය තුල ඇතුලත් වත්කම පාවිච්චි කරන්නේ කෙසේද කුමන අරමුණකටද යන්න වෙනස් කිරීමට හිමිකම පිරිනැමීම සිදුවීම් මත රඳා පවතිමින් තීරණ ගැනීමේ අයිතීන්වලට උදාහරණ පහතින් ඇතුලත් වේ.

(අ) වත්කමක් මගින් නිෂ්පාදනය කරන නිමවුමේ වර්ගය වෙනස්කිරීමට හිමිකම (උදාහරණ ලෙස භාණ්ඩ ප්‍රවාහයට නාවික කන්ටේනර් භාවිතා කරන්නේද යන්න තීරණය කිරීමට හෝ ගබඩා කිරීමට හෝ සිල්ලර ස්ථානයකින් විකුණන භාණ්ඩවල මිශ්‍රය මත තීරණ ගැනීමට);

(ආ) නිමවුම නිෂ්පාදන කරන්නේ කවදාද යන්න වෙනස් කිරීමට හිමිකම (උදාහරණ ලෙස යන්ත්‍ර අයිතමයක්ද නැතහොත් විදුලිබල යන්ත්‍රාගාරයක් භාවිතා කරන්නේ කවදාද යන්න තීරණ කිරීමට);

(ඇ) නිමවුම නිෂ්පාදන කරන්නේ කොහේදැයි යන්න වෙනස් කිරීමට හිමිකම (උදාහරණ ලෙස ගමනාන්තය ට්‍රක් රථයකින්, නැවකින්ද යන්න තීරණය කිරීමට හෝ උපකරණ අයිතමයක් භාවිතා කරන්නේ කොහේදැයි තීරණය කිරීමට); සහ

(ඈ) නිමවුම නිෂ්පාදනය කරනවාද සහ එම නිමවුමේ ප්‍රමාණය වෙනස් කිරීමට හිමිකම (උදාහරණ ලෙස විදුලි යන්ත්‍රාගාරයකින් බලශක්තිය නිෂ්පාදනය කරනවාද සහ එම යන්ත්‍රාගාරයෙන් කොපමණ බල ශක්ති ප්‍රමාණයක් නිෂ්පාදන කරනවාද යන්න තීරණය කිරීමට).

ආ27 කෙසේද සහ කුමන අරමුණකට වත්කම භාවිතා කරන්නේද වෙනස් කිරීමට හිමිකම ලබා නොදීමට තීරණ ගැනීමේ හිමිකමට උදාහරණ ලෙස වත්කම ක්‍රියාත්මක කිරීමේ සහ නඩත්තු සීමා කිරීම් හිමිකමවල ඇතුලත් වීම. එම හිමිකම් ගණුදෙනුකරු හෝ සැපයුම්කරු තබා ගැනීමට පුළුවනි. වත්කමක් ක්‍රියාකිරීමේ සහ නඩත්තු කිරීමේ හිමිකම් නිතරම වත්කමේ කාර්‍යක්‍ෂම පාවිච්චියට අත්‍යාවශ්‍යවන අතර කෙසේද වත්කම පාවිච්චි කරන්නේ සහ කුමන අරමුණකටද පිළිබඳ තීරණ මත නිතරම රඳාපවතින අතර කෙසේද සහ කුමන අරමුණකට වත්කම පාවිච්චි කරන්නේදැයි මඟ පෙන්වීමට ඔවුන්ට හිමිකමක් නොමැත. කෙසේ නමුත් වත්කම පාවිච්චි කරන්නේ කෙසේද සහ කුමන අරමුණකටද පිළිබඳ අදාල තීරණ කලින් නිශ්චය කළ හැකි නම්, වත්කම ක්‍රියා කිරීමේ හිමිකම්, වත්කම පාවිච්චි කිරීමේ මඟ පෙන්වීමට අයිතිය ගණුදෙනුකරුට පිරිනැමිය හැකිය. (ආ 24(ආ)(i) ඡේදය බලන්න)

**පාවිච්චි කරන කාලපරිච්ඡේදය තුලදී සහ ඊට පෙර නිශ්චය කළ තීරණ**


ආ28 වත්කම පාවිච්චි කරන්නේ කෙසේද? කුමන අරමුණකටද යන්න පිළිබඳ අදාල තීරණ ක්‍රම ගණනාවකින් කලින් නිශ්චය කිරීමට පුළුවනි. උදාහරණ ලෙස අදාල තීරණ, වත්කම සැලැස්ම හෝ වත්කමේ පාවිච්චිය මත ගිවිසුම්මය සීමා කිරීම් වලින් කලින් නිශ්චය කිරීමට පුළුවනි.

ආ29 වත්කම පාවිච්චි කිරීම මඟ පෙන්වීමට ගණුදෙනුකරුට අයිතියක් තිබේද යන්න තක්සේරු කිරීමේදී, ආ 24 (ආ) (ii) ඡේදයේ විස්තර කර ඇති ගණුදෙනුකරු සැලසුම්කළ වත්කම් (වත්කමේ සුවිශේෂී වූ කොටස් හෝ) හැර, අස්තිත්වයක් පාවිච්චි කරන කාලපරිච්ඡේදය තුලදී වත්කමේ පාවිච්චිය පිළිබඳ තීරණ ගැනීමට හිමිකම් පමණක් සලකා බැලිය යුතු වේ. ප්‍රතිඵලයක් ලෙස, ආ24 (ආ) ii ඡේදයේ කොන්දේසි පවතිනම් හැර, අස්තිත්වයක් පාවිච්චි කරන කාලපරිච්චේදයට පෙර කලින් නිශ්චය කළ තීරණ සලකා නොබැලිය යුතු වේ. උදාහරණ ලෙස පාවිච්චි කරන කාලපරිච්ඡේදයට පෙර වත්කමක නිමවුම විශේෂයෙන් නියම කිරීමට හැකියාවක් ගණුදෙනුකරුට තිබේ නම් පමණක්, එම වත්කමේ පාවිච්චිය මඟ පෙන්වීමට අයිතිය ගණුදෙනුකරුට නොමැත. පාවිච්චි කරන කාලපරිච්ඡේදයට පෙර ගිවිසුමේ නිමවුම විශේෂයෙන් නියම කිරීමට හැකියාව, වත්කම පාවිච්චි කිරීම සම්බන්ධයෙන් අනෙකුත් ඕනෑම තීරණ ගැනීමේ හිමිකම් නොමැතිව, භාණ්ඩ සහ සේවා මිලදී ගැනීමට ඕනෑම ගණුදෙනුකරුවෙකු වශයෙන් සමාන හිමිකමක් ගණුදෙනුකරුට දෙයි.

**ආරක්ෂක අයිතීන්**

ආ30 වත්කමක හෝ වෙනත් වත්කම්වල සැපයුම්කරුගේ ඇල්ම ආරක්ෂා කිරීමට, එහි සේවක මණ්ඩල ආරක්ෂක කිරීම හෝ නිති සහ රෙගුලාසි සමඟ සැපයුම්කරුගේ අනුකූලතාව සහතික කිරීමට සැලසුම් කළ නියමයන් සහ කොන්දේසි ගිවිසුමක ඇතුලත් කළ හැකිය. ආරක්ෂක අයිතීන් වලට උදාහරණ මේවා වේ. (i) වත්කමක් පාවිච්චි කරන උපරිම ප්‍රමාණය විශේෂයෙන් නියමකිරීම හෝ වත්කම පාවිච්චි කිරීමට ගණුදෙනුකරුට පුළුවන් වන්නේ කොහේද හෝ කවදාද යන්න සීමා කිරීම (ii) විශේෂිත වූ ක්‍රියාත්මක කිරීමේ පරිචයන් අනුගමනය කිරීමට ගණුදෙනුකරුට නියමකිරීම හෝ (iii) වත්කම පාවිච්චි කිරීමේ වෙනස්කම් සැපයුම්කරුට දැනුම්දීමට ගණුදෙනුකරුට නියම කිරීම ගණුදෙනුකරුගේ පාවිච්චියේ අයිතියේ විෂය පථය ආරක්ෂිත අයිතීන් නියම ලෙස නිර්වචනය කරන නමුත් එමගින් වත්කමක් පාවිච්චි කිරීමේ මඟ පෙන්වීමට ඇති හිමිකම ගණුදෙනුකරුගෙන් වෙන්කොට සැලකීම හෝ වැළැක්වීම නොකරයි.

ආ31 ගිවිසුමක් කල්බද්දකින් සමන්විත ද නැද්ද තක්සේරු කිරීමේදී ඇස්තිත්වයකට පහත සඳහන් ගැලීම් සටහන උදවු වේ.




## ගිවිසුමක සංරචක වෙන්කර දැක්වීම (12-17 ඡේද)

ආ32 පහත සඳහන් කරුණු දෙකම පවතී නම්, පාදක වූ වත්කමක පාවිච්චි කිරීමේ හිමිකම වෙනමම කල්බදු සංරචකයකි.

(අ) කල්බදු ගැනුම්කරුට පාදකවන වත්කම මත පමණක් හෝ පහසුවෙන් ලබා ගැනීමට වෙනත් සම්පත් සමඟ එකට පාවිච්චියෙන් ප්‍රතිලාභ කල්බදු ගැනුම්කරුට ලැබීමට පුළුවනි. පහසුවෙන් ලබාගත හැකි සම්පත් යනු විකුණු හෝ වෙනමම කල්බදු කළ භාණ්ඩ හෝ සේවා (කල්බදු දීමනාකරු හෝ වෙනත් සැපයුම්කරුවන්

විසින්) හෝ කල්බදු ගැනුම්කරු දැනටමත් ලබා ගෙන තිබෙන සම්පත් වේ. (වෙනත් ගණුදෙනුවකින් හෝ සිද්ධියක් තුලින් හෝ කල්බදු දීමනාකරුගෙන්); සහ

(ආ) ගිවිසුමක පාදක වූ වත්කමක්, ගිවිසුමේ පාදක වූ වෙනත් වත්කමක් සමග තදින් බැඳීමක් නැතහොත් තදින් එකිනෙකට සම්බන්ධතාවයක් නොමැත. උදාහරණ ලෙස අනෙකුත් පාදක වූ වත්කම් සමග වඩා රඳා නොපවතිමින් හෝ වඩාත් එකිනෙකට සම්බන්ධ නොවෙමින් පාදක වූ වත්කම පෙන්වා දිය හැකි ගිවිසුමකින් වෙනත් පාදක වූ වත්කම් පාවිච්චි කිරිමේ හිමිකමේ සැලකිය යුතු කල්බදු ගැනුම්කරු කල්බදු නොකිරීමට තීරණය කිරීමට පුළුවන් වන කරුණ.

ආ33 කල්බදු ගැනුම්කරුට භාණ්ඩ හෝ සේවා පවරනු නොලබන ක්‍රියාකාරකම් සහ පිරිවැය සඳහා කල්බදු ගැනුම්කරු විසින් ගෙවීමට නියමිත ප්‍රමාණයක් කල්බදු ගිවිසුමකට ඇතුලත් විය හැකිය. උදාහරණ ලෙස පරිපාලන කාර්යයක් සඳහා අයකළ හෝ කල්බද්ද ආශ්‍රිතව කල්බදු ගැනුම්කරුට භාණ්ඩ හෝ සේවා නොපැවරිමට දැරූ වෙනත් පිරිවැය, ගෙවීමට නියමිත මුළු ප්‍රමාණයේ කල්බදු දීමනාකරු ඇතුලත් කළ හැකිය. එවැනි ගෙවිය යුතු ප්‍රමාණය ගිවිසුමේ වෙනමම සංරචකයක් ලෙස පැන නොගින නමුත් ගිවිසුමේ හඳුනාගත් සංරචකවලට වෙනමම බෙදාහරින මුළු ප්‍රතිෂ්ඨාවේ කොටසක් ලෙස සැලකිය යුතුයි.

## කල්බදු වාරය (18-21 ඡේද)

ආ34 කල්බදු වාරය නිශ්චය කිරීමේදී සහ කල්බද්දක අවලංගු කළ නොහැකි කාලපරිච්ඡේදයේ දිග තක්සේරු කිරීමේදී, අස්තිත්වයක් ගිවිසුමේ නිර්වචන ව්‍යවහාර කළයුතු අතර ගිවිසුමේ වලංගු වන කාලපරිච්ඡේදය නිශ්චය කරයි. සැලකිය යුතු නොවන දඩයකට වඩා වැඩි නොවන අනෙකුත් පාර්ශවයේ අවසරයකින් තොරව කල්බද්ද අවසන් කිරීමට අයිතිය එක් එක් කල්බදු ගැනුම්කරු සහ කල්බදු දීමනාකරුට තිබෙන විට කල්බද්දක් තවදුරටත් වලංගු නොවේ.

ආ35 කල්බදු ගැනුම්කරුට පමණක් කල්බද්දක් අවසන් කිරීමට අයිතිය තිබේනම්, එම අයිතිය කල්බදුවාරය නිශ්චය කිරීමේදී අස්තිත්වයක් සලකාබලන කල්බදු ගැනුම්කරුට පවතින කල්බද්ද අවසන් කිරීමට එම අයිතිය විකල්පක් ලෙස සලකා බලයි. කල්බදු දීමනාකරුට පමණක් කල්බද්දක් අවසන් කිරීමට අයිතිය තිබේ නම් කල්බද්ද අවසන් කිරීමට විකල්පයක් මගින් ආවරණය වන කාලපරිච්ඡේදය කල්බද්දේ අවලංගු කළ නොහැකි කාලපරිච්ඡේදයේ ඇතුලත් වේ.

ආ36 කල්බදු වාරය ආරම්භක දිනයේදී පටන්ගන්නා අතර කල්බදු දීමනාකරු විසින් කල්බදු ගැනුම්කරුට සපයන ඕනෑම බදු සහන කාලපරිච්ඡේද ඇතුලත් වේ.

ආ37 ආරම්භක දිනයේදී, අස්තිත්වයක් කල්බද්ද දීර්ඝ කිරීමට විකල්පයක් ක්‍රියාත්මක කිරීමට හෝ පාදක වූ වත්කම මිලදී ගැනිමට හෝ කල්බද්ද අවසන් කිරීමට විකල්පයක් ක්‍රියාත්මක නොකිරීමට කල්බදු ගැනුම්කරු සාධාරණ තහවුරුවක් වේද යන්න තක්සේරු කරයි. අස්තිත්වය විකල්පය ක්‍රියාත්මක දිනය වන තුරු ආරම්භක දිනයේ පටන් කරුණු සහ සිද්ධි වල ඕනෑම අපේක්ෂිත වෙනස්කම් ඇතුලත්ව විකල්ප ක්‍රියාත්මක කිරීමට හෝ නොකිරීමට, කල්බදු ගැනුම්කරු සඳහා ආර්ථික දීමනාවක් ඇතිකිරීමට සියලුම අදාල කරුණු සහ සිද්ධි සලකා බලයි. සලකා බලන සාධකවල උදාහරණවල ඇතුලත් වන නමුත් ඒවාට පහත දෑ සීමා නොවේ.

(අ) වෙළෙඳපොල අනුපාත සමග සසඳමින් විකල්ප කාලපරිච්ඡේද සඳහා ගිවිසුම්මය නියමයන් සහ කොන්දේසි එනම්;

i. ඕනෑම විකල්ප කාලපරිච්ඡේදයක් තුල කල්බද්ද සඳහා ගෙවීම් කළ ප්‍රමාණය;

ii. කල්බද්ද සඳහා ඕනෑම විචල්‍ය ගෙවීම් හෝ වෙනත් අසම්භාව්‍ය ගෙවීම් වල ප්‍රමාණය එනම් දඩ අවසන් කිරීම සහ අවශේෂ වටිනාකම සහතික වීම් වලින් ප්‍රතිඵල දෙන ගෙවීම්; සහ

iii. ආරම්භක විකල්ප කාලපරිච්ඡේදවලින් පසු ක්‍රියාත්මක කළ හැකි ඕනෑම විකල්පවල කොන්දේසි සහ නියමයන් (උදාහරණ ලෙස දැනට වෙළෙඳපොල අනුපාතිකයන්ට පහලින් ඇති අනුපාතිකයකට දීර්ඝ කරන කාලපරිච්ඡේදයක් අවසානයේ ක්‍රියාත්මක කළ හැකි මිලදී ගැනීමේ විකල්පයක්).

(ආ) කල්බද්ද දීර්ඝ කිරීමට හෝ අවසන් කිරීමට හෝ පාදක වූ වත්කම මිලදී ගැනීමට විකල්පය ඇති විට, කල්බදු ගැනුම්කරු සඳහා සැලකිය යුතු ආර්ථික ප්‍රතිලාභ තිබීමට අපේක්ෂා කරන ගිවිසුමේ නියමයන් වලින් පවරා ගන්නා (පවරා ගැනීමට අපේක්ෂිත හෝ) සැලකියයුතු කල්බදු අයිතියේ වැඩි දියුණු කිරීම් ක්‍රියාත්මක කිරිම හට ගැනීම.

(ඇ) කල්බද්ද අවසන් කිරීමට සම්බන්ධ පිරිවැය එනම් කතිකා කර ගැනීමේ පිරිවැය, අළුත් කිරීමේ පිරිවැය, කල්බදු ගැනුම්කරුගේ අවශ්‍යතාවයට අළුත් වත්කමක් එකට එකතු කිරීමේ පිරිවැය හෝ අවසන් කිරීමේ

දඩ සහ ඒ හා සමාන පිරිවැය පාදක වූ වත්කම ගිවිසුම්මය නියම කළ තත්වයෙන් හෝ ගිවිසුම්මය නියම කළ ස්ථානයට නැවත භාරදීම ආශ්‍රිත පිරිවැය ඇතුලත්ව.

(ඈ) කල්බදු ගැනුම්කරුගේ මෙහෙයුම් සලකා ගෙන පාදක වූ වත්කමේ වැදගත්කම උදාහරණ ලෙස පාදක වූ වත්කමේ පිහිටීම සහ යෝග්‍ය විකල්ප තිබීමෙන් පදනම් වූ වත්කම් විශේෂිත වූ වත්කමක් වීම. සහ

(ඉ) විකල්පය ක්‍රියාත්මක කිරීම සමඟ ආශ්‍රිත කොන්දේසි සහිත බව (එනම් එකක් හෝ ඊට වැඩිපුර කොන්දේසි ඉෂ්ට වේ නම් පමණක් විකල්පය ක්‍රියාත්මක කළ හැකි වන විට) සහ එම කොන්දේසි පැවතිය හැකි බව.

ආ38 විකල්පය ක්‍රියාත්මක කරන්නේදැයි නොසලකා එක සමාන සැලකිය යුතු අවම හෝ ස්ථිර මුදල් ආපසු ගෙවීමක් කල්බදු ගැනුම්කරු විසින් කල්බදු දීමනාකරුට සහතික වීමක් වැනි එකක් හෝ ඊට වැඩි ගිවිසුම්මය ලක්ෂණ (උදාහරණ ලෙස අවශේෂ වටිනාකම සහතික කිරීමක්) කල්බද්දක් දීර්ඝ කිරීමට හෝ අවසන් කිරීමට විකල්පයක් එකට සංයෝග කළ හැකිය. එවැනි අවස්ථාවක, ආ42 ඡේදයේ ස්ථිර වශයෙන් ස්ථාවර ගෙවීම් මත මඟ පෙන්වීම එසේ තිබියදී කල්බදු ගැනුම්කරු කල්බද්ද දීර්ඝ කිරීමට විකල්පය ක්‍රියාත්මක කිරීම හෝ කල්බද්ද අවසන් කිරීමට විකල්පය ක්‍රියාත්මක නොකිරීමට සාධාරණ ලෙස නිශ්චිත බව අස්තිත්වයක් උපකල්පනය කළ යුතුයි.

ආ39 කල්බද්දක් අවලංගු කළ නොහැකි කාලපරිච්ඡේදය කෙටිවීම, කල්බද්ද දීර්ඝ කිරීමට විකල්පයක් ක්‍රියාත්මක කිරීම හෝ කල්බද්ද අවසන් කිරීමට විකල්පයක් ක්‍රියාත්මක නොකිරීම කල්බදු ගැනුම්කරුවෙකුට බොහෝ විට විය හැකිය. වත්කම ප්‍රතිෂ්ඨාපනයක් ලබාගැනීම සමඟ ආශ්‍රිත පිරිවැය වඩා කෙටිකාලීන වලංගු නොවන කාලපරිච්ඡේදයකට සමානුපාතිකව වැඩිවිය හැකි හෙයිනි.

ආ40 නියම ලෙස පාවිච්චි කළ විශේෂිත වර්ගවල වත්කම් (කල්බදු හෝ තමන්ට අයිතිම තිබේද යන්න) සහ එසේ කිරීම සඳහා ආර්ථික හේතු කල්බදු ගැනුම්කරුගේ අතීත ක්‍රියාකාරකම්, කල්බදු ගැනුම්කරු විකල්පයක් ක්‍රියාත්මක කිරීමට හෝ නොකිරීමට සාධාරණ නිශ්චිත වේදැයි තක්සේරු කිරීමට උදවුවන තොරතුරු සැපයිය හැකිය. උදාහරණ ලෙස කල්බදු ගැනුම්කරුවෙක් විශේෂිත වූ කාලපරිච්ඡේදයක් සඳහා නියත ලෙස භාවිතා කරන විශේෂිත වූ වත්කම් වර්ග තිබේ නම් හෝ පාදක වූ වත්කම් වලට විශේෂිත වර්ගවල කල්බදු මත විකල්පයක් නිතරම ක්‍රියාත්මකවන එවැනි වත්කම් මත කල්බදු විකල්පය ක්‍රියාත්මක කිරීමට සාධාරණ ලෙස නිශ්චිත වේද යන්න තක්සේරු කිරීමේදී අතීත භාවිතයන් සඳහා ආර්ථික හේතු සලකා බැලිය යුතුවේ.

ආ41 කල්බද්ද ආරම්භක කළ දිනට පසුව, කල්බදු ගැනුම්කරුවෙක් සැලකිය යුතු සිද්ධියක් සිදුවීම හෝ කල්බදු ගැණුකරුගේ පාලනයේ ඇති සැලකිය යුතු සිදුවීම්වල වෙනස්කම් මත කල්බදු වාරය කල්බදු ගැනුම්කරු නැවත තක්සේරු කරන අතර, කල්බදු වාරය නිශ්චය කිරීමේදී කලින් ඇතුලත් නොකල විකල්පය ක්‍රියාත්මක කිරීම හෝ කල්බදු වාරය නිශ්චය කිරීමේදී එහි කලින් ඇතුලත් කළ විකල්පයක් ක්‍රියාත්මක නොකිරීම සාධාරණ නිශ්චිත වේද යන්න 20 ඡේදයේ නියම කරයි. සැලකිය යුතු සිද්ධි හෝ සිදුවීම්වල වෙනස්කම් වලට ඇතුලත් උදාහරණ පහත පරිදි වේ.

(අ) විකල්පය දිර්ඝ කිරීමට හෝ කල්බද්ද අවසන් කිරීමට හෝ පාදක වූ වත්කම මිලදී ගැනීම ක්‍රියාත්මක කරන විට, කල්බද්ද සඳහා සැලකිය යුතු ආර්ථික වාසි කල්බදු ගැනුම්කරුට තිබෙන බව ආරම්භක දිනට අපේක්ෂිත නොවූ නමුත් සැලකිය යුතු බදු අයිතියේ දියුණුව ක්‍රියාත්මක වීම නිසා වන හට ගැනීම;

(ආ) ආරම්භක දිනට අපේක්ෂිත නොවන පාදක වූ වත්කමේ සැලකිය යුතු සංශෝධනයක් හෝ ගණුදෙණුකරුවන්ගේ අවශ්‍යතාවයන්;

(ඇ) කලින් නිශ්චය කළ කල්බදු වාරය අවසානයට එහා කාලපරිච්ඡේදයක් සඳහා පාදක වූ වත්කමේ උපකල්බද්දක ආරම්භය; සහ

(ඈ) විකල්පයක් ක්‍රියාත්මක කිරීමට හෝ නොකිරීමට සෘජුවම අදාලවන කල්බද්දේ ව්‍යාපාරික තීරණයක් (උදාහරණ ලෙස වත්කම පාවිච්චි කිරිමේ හිමිකම යෙදවීම තුලින් විකල්ප වත්කමක් බැහැර කිරීම හෝ ව්‍යාපාරික වත්කමක් බැහැරකිරීම, අනුපූරක වත්කමක කල්බද්ද දීර්ඝ කිරීමට තීරණයක්).

## ප්‍රධාන වශයෙන් වන ස්ථාවර කල්බදු ගෙවීම්
## (27(අ), 36 (ඇ) සහ 70 (අ) ඡේද)

ආ42 කල්බදු ගෙවීම්වල ඕනෑම ප්‍රධාන වශයෙන් වන ස්ථාවර කල්බදු ගෙවීම් ඇතුලත් වේ. ප්‍රධාන වශයෙන් වන ස්ථාවර කල්බදු ගෙවීම්, ස්වරූපයෙන් විචල්‍යතාවයකින් සමන්විත නමුත් ප්‍රධාන වශයෙන් මඟ හැරිය නොහැකි ගෙවීම් වේ. ප්‍රධාන වශයෙන් වන ස්ථාවර කල්බදු ගෙවීම් ඇතිවීමට උදාහරණ;

(අ) ගෙවීම් විචල්‍ය කල්බදු ගෙවීම් ලෙස ව්‍යුහගතවන නමුත් එම ගෙවීම්වල සැබෑ ලෙස විචල්‍යතාවයක් නොමැත. එවැනි ගෙවීම් සැබෑ ආර්ථික හරයක් නොමැති විචල්‍ය වගන්ති වලින් සමන්විත වේ. එවැනි ගෙවීම් වලට උදාහරණ පහත පරිදි වේ.

(i) කල්බද්ද තුල වත්කමක් ක්‍රියාත්මක කිරීමේ හැකියාවෙන් යුක්ත බව ඔප්පු වන්නේ නම් හෝ සිද්ධියක් සැබෑ ලෙස වීමේ හැකියාවක් නොවන සිදුවීමක් ඇතිවූයේ නම් පමණක්; හෝ

(ii) පාදක වූ වත්කමේ පාවිච්චියට එකට සම්බන්ධ කරන විචල්‍ය කල්බදු ගෙවීමක් ලෙස මූලිකව ව්‍යුහගත කර ඇති ගෙවීම් නමුත් ආරම්භක දිනට පසු සමහර අවස්ථාවක නැවත විසඳිය හැකි විචල්‍යතාවයක් වීමෙන් කල්බදු වාරයේ ඉතිරිය සඳහා එම ගෙවීම් ස්ථාවර ලෙස හටගැනීම. විචල්‍යතාවය විසඳූ විට, එම ගෙවීම් ප්‍රධාන වශයෙන් වන ස්ථාවර ගෙවීම් බවට පත් වේ.

(ආ) කල්බදු ගැනුම්කරුට සිදුකළ හැකි එකකට වඩා ගෙවීම් කට්ටල තිබෙන නමුත් එම ගෙවීම් කට්ටල එකකින් පමණක් තාත්වික ගෙවීම් සිදුවේ. එම අවස්ථාවේදී අස්තිත්වයක් තාත්වික කට්ටලයේ ගෙවීම් කල්බදු ගෙවීම් ලෙස සැලකිය යුතුවේ.

(ඇ) කල්බදු ගැනුම්කරු සිදුකරන එකකට වඩා වැඩි තාත්වික ගෙවීම් කට්ටල තිබෙන නමුත් එවැනි ගෙවීම් කට්ටල අඩුම තරමින් එකකින් සිදු කළ යුතුයි. එම අවස්ථාවේදී අස්තිත්වයක් කල්බදු ගෙවීම් ලෙස අඩුම අගයට (වට්ටම් කළ පදනමක් මත) එකතු කරන ගෙවීම්වල කට්ටලය කල්බදු ගෙවීම් ලෙස සැලකිය යුතුවේ.

## කල්බද්ද ආරම්භ කළ දිනට පෙර පාදක වූ වත්කම සමග කල්බදු ගැනුම්කරුගේ සම්බන්ධය

### පාදක වූ වත්කමේ ඉදිකිරීමට හෝ සැලසුම් කිරීමට සම්බන්ධයෙන් කල්බදු ගැනුම්කරුගේ පිරිවැය

ආ43 කල්බදු ගැනුම්කරු විසින් පාවිච්චිය සඳහා තිබෙන පාදක වූ වත්කමට පෙර, අස්තිත්වයක් කල්බද්දක් කතිකා කරගත හැකිය. සමහර කල්බදුවලට, කල්බදුගැනුම්කරු විසින් පාවිච්චිය සඳහා පාදක වූ වත්කම ඉදිකිරීමට හෝ ප්‍රතිසැලසුම් කිරීමට අවශ්‍ය විය හැකිය. ගිවිසුමක කොන්දේසි සහ නියමයන් මත රැඳෙමින් වත්කම ඉදිකිරීමට හෝ සැලසුම් කිරීමට සම්බන්ධ ගෙවීම් සිදු කිරීමට කල්බදු ගැනුම්කරුට නියම කළහැකි වේ.

ආ44 පාදක වූ වත්කම ඉදිකිරීමට හෝ සැලසුම් කිරීමට සම්බන්ධ පිරිවැය කල්බදු ගැනුම්කරු දැරුවේ නම්, කල්බදු ගැනුම්කරු විසින් LKAS 16 වැනි වෙනත් යෝග්‍ය ප්‍රමිතීන් ප්‍රකාරව එම පිරිවැය සඳහා ගිණුම්ගත කළයුතුවේ. පාදක වූ වත්කම ඉදිකිරීමට හෝ සැලසුම් කිරීමට සම්බන්ධ පිරිවැය තුල පාදක වූ වත්කම පාවිච්චි කිරීමේ හිමිකම සඳහා කල්බදු ගැනුම්කරු විසින් සිදුකළ ගෙවීම් ඇතුලත් නොකරයි. පාදක වූ වත්කම පාවිච්චි කිරීමේ හිමිකම සඳහා ගෙවීම් යනු කල්බදු ගෙවීමේ කාලය නොසලකා කරන කල්බද්දක ගෙවීම් වේ.

### පාදක වූ වත්කම්කට නීත්‍යානුකුල අයිතිය

ආ45 කල්බදු දීමනාකරුට නීත්‍යානුකුල අයිතිය මාරුවීමට සහ කල්බදු ගැනුම්කරුට වත්කම කල්බදු කිරීමට පෙර, පාදක වූ වත්කමක නීත්‍යානුකුල අයිතිය කල්බදු ගැනුම්කරුට ලබාගැනීමට හැකිය. නීත්‍යානුකුල අයිතිය ලබා ගැනීමෙන්ම එම ගණුදෙණුව සඳහා ගිණුම් ගත කරන්නේ කෙසේදැයි නිශ්චය කරනු නොලැබේ.

ආ46 කල්බදු දීමනාකරුට වත්කම පැවරීමට පෙර, කල්බදු ගැනුම්කරු පාදක වූ වත්කම පාලනය කරයි (පාලනය ලබාගැනීම හෝ) නම්, 98-103 ඡේද ව්‍යවහාර කරමින් මෙම ගණුදෙණුව, විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙණුවක් ලෙස ගිණුම් ගත කරනු ලැබේ.

ආ47 කෙසේනමුත්, කල්බදු දීමනාකරුට වත්කම පැවරීමට පෙර, පාදක වූ වත්කමේ පාලනය කල්බදු ගැනුම්කරු ලබා නොගන්නේ නම්, ගණුදෙණුව විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙණුවක් නොවේ. උදාහරණ ලෙස නිෂ්පාදකයෙක්, කල්බදු දීමනාකරුවෙක් සහ කල්බදු ගැනුම්කරුවෙක්, කල්බදු ගැනුම්කරුට කල්බදුදීමට කල්බදු දීමනාකරු විසින් නිෂ්පාදකයෙකුගෙන් වත්කම මිලදී ගැනීම සඳහා ගණුදෙණුවක් කතිකා කර ගත්තේ නම්, එය මෙවැනි අවස්ථාවක් විය හැකිය. කල්බදු දීමනාකරුට නීත්‍යානුකුල අයිතිය මාරුවීමට පෙර, පදනම් වූ වත්කමේ නීත්‍යානුකුල අයිතිය කල්බදු ගැනුම්කරුට ලබාගැනීමට හැකි වේ. මෙම අවස්ථාවේදී පාදක වූ වත්කමේ නීත්‍යානුකුල අයිතිය කල්බදු දීමනාකරුට මාරුකිරීමට පෙර නමුත් වත්කමේ පාලනය ලබා නොගෙන පාදක වූ වත්කමක නීත්‍යානුකුල අයිතිය කල්බදු ගැනුම්කරුවෙක් ලබා ගත්තේ නම්, ගණුදෙණුව විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙණුවක් ලෙස නොවන නමුත් එය කල්බද්දක් ලෙස ගිණුම්ගත කරයි.

## කල්බදු ගැනුම්කරුගේ හෙළිදරවු කිරීම් (59 ඡේදය)

ආ48 51 ඡේදයට අනුව, හෙළිදරවු කිරීමේ අරමුණ ඉෂ්ට කිරීමට අවශ්‍ය කල්බදු ක්‍රියාකාරකම් පිළිබඳ අමතර තොරතුරු තිබේදැයි නිශ්චය කිරීමේදී, කල්බදු ගැනුම්කරුවෙක් පහත සඳහන් දෑ සලකා බලයි.

(අ) එම තොරතුරු මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට අදාලද යන්න. එම තොරතුරු මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට අදාල වේ යැයි අපේක්ෂිත නම් පමණක් 59 ඡේදයේ විශේෂයෙන් නියම කළ අමතර තොරතුරු කල්බදුගැනුම්කරුවෙක් සැපයිය යුතුවේ. මේ සම්බන්ධයෙන් එම තොරතුරු පරිශීලකයින්ට තේරුම් ගැනීමට උදවු වේ නම් මෙය අවස්ථාවක් විය හැකිය.

i. කල්බදු වලින් සපයන නම්‍යතාවය. උදාහරණ ලෙස කල්බදු ගැනුම්කරුවෙක් අවසන් කිරිමේ විකල්පය ක්‍රියාත්මක කිරීම මගින් හෝ වාසිදායක කොන්දේසී සහ නියමයන් සමග කල්බදු අළුත් කිරීම මගින් එහි අනාවරණය අඩු කිරිමට පුළුවන් කල්බදු නම්‍යතාවය, කල්බදු ගැනුම්කරු සපයිය හැකිය .

ii. කල්බදු වලින් පනවනු ලබන සීමා කිරීම්. උදාහරණ ලෙස විශේෂිත වූ මූල්‍ය අනුපාත පවත්වා ගැනීම වැනි කල්බදු ගැනුම්කරුට නියම කිරීම මගින් කල්බදු සීමා කිරීම් පැනවිය හැකිය .

iii. ප්‍රධාන විචල්‍යවලට වාර්තාකරන තොරතුරුවල සංවේදීතාවය. උදාහරණ ලෙස අනාගත විචල්‍ය කල්බදු ගෙවීම් වාර්තාකරන තොරතුරු සංවේදී විය හැකිය.

iv. කල්බදු වලින් පැනනගින වෙනත් අවදානම්වලට අනාවරණය

v. කර්මාන්ත පරිච මගින් විචලනයන්. එවැනි විචලනයන්වලට උදාහරණ ලෙස කල්බදු ගැනුම්කරුගේ කල්බදු කළඹයට බලපාන අසාමාන්‍ය හෝ අසමසම කල්බදු නියමයන් සහ කොන්දේසී ඇතුලත් විය හැකිය.

(ආ) එම තොරතුරු වලින් මූලික මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කර පැහැදිලිව තිබිම හෝ සටහන් වල හෙළිදරවු කර දකින්නට තිබේද යන්න. කල්බදු ගැනුම්කරුවෙක් මූල්‍ය ප්‍රකාශනවල දැනටමත් වෙනත් තැනක ඉදිරිපත් කර ඇති තොරතුරු දෙවරක් සටහන් කිරීම අවශ්‍ය නොවේ.

ආ49 මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට තක්සේරු කිරීමට උදවු දෙන තොරතුරු , 51 ඡේදයට අනුව හෙළිදරවු කිරිමේ අරමුණ තෘප්ත කිරිමට අවශ්‍ය විය හැකි තත්වයන් මත රදාපවතිමින් විචල්‍ය කල්බදු ගෙවීම්වලට සම්බන්ධ අමතර තොරතුරු ඇතුලත් කිරිමට පුළුවනි.

උදාහරණ ලෙස;

(අ) විචල්‍ය කල්බදු ගෙවීම් භාවිතා කිරිම සහ එම ගෙවීම්වල ව්‍යාප්තිය සඳහා කල්බදු ගැනුම්කරුගේ හේතු;

(ආ) ස්ථාවර ගෙවීම්වලට විචල්‍ය කල්බදු ගෙවීම්වල සාපේක්ෂ වැදගත්කම;

(ඇ) ප්‍රධාන විචල්‍යයන් වෙනස්වීම්වලට ප්‍රතිචාර ලෙස ගෙවීම් වෙනස්වීම අපේක්ෂා කරන්නේ කෙසේද සහ විචල්‍ය කල්බදු ගෙවීම් රදාපවතින ප්‍රධාන විචල්‍යයන්;

(ඈ) විචල්‍ය කල්බදු ගෙවීම්වල වෙනත් මෙහෙයුම් සහ මූල්‍ය බලපෑම්

ආ50 මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට තක්සේරු කිරීමට උදවු දෙන තොරතුරු , 51 ඡේදයට අනුව හෙළිදරවු කිරිමේ අරමුණ තෘප්ත කිරිමට අවශ්‍ය විය හැකි සිද්ධි මත රදාපවතිමින් විකල්ප දීර්ඝ කිරිමට හෝ විකල්ප අවසන් කිරිමට සම්බන්ධ අමතර තොරතුරු ඇතුලත් කිරිමට පුළුවනි.

උදාහරණ;

(අ) දීර්ඝ කිරිමේ විකල්ප හෝ අවසන් කිරිමේ විකල්ප භාවිතය සඳහා සහ එම විකල්පවල ව්‍යාප්තිය සඳහා කල්බදු ගැනුම්කරුගේ හේතු;

(ආ) කල්බදු ගෙවීම්වලට විකල්පමය කල්බදු ගෙවීම්වල සාපේක්ෂ වැදගත්කම;

(ඇ) කල්බදු වගකීම් මැනීම තුල ඇතුලත් කර නොමැති විකල්ප ක්‍රියාත්මක කිරිමේ ව්‍යාප්තිය; සහ

(ඈ) එම විකල්පවල වෙනත් මෙහෙයුම් සහ මූල්‍ය බලපෑම්.

ඇ51 මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට තක්සේරු කිරීමට උදවු දෙන තොරතුරු, 51 ඡේදයට අනුව හෙළිදරවු කිරිමේ අරමුණ තෘප්ත කිරිමට අවශ්‍ය විය හැකි සිද්ධි මත රදා පවතිමින් ව්‍යාප්ති විකල්ප හෝ අවසන් කිරිමේ විකල්ප සම්බන්ධ අමතර තොරතුරු ඇතුලත් කිරිමට පුළුවනි.

උදාහරණ

(අ) අවශේෂ වටිනාකම සහතික කිරිම සඳහා සහ එම සහතික කිරිම්වල ව්‍යාප්තිය සඳහා කල්බදු ගැනුම්කරුගේ හේතු;

(ආ) අවශේෂ වටිනාකමේ අවදානමට කල්බදු ගැනුම්කරුගේ අනාවරණයේ වැදගත්කම;

(ඇ) එම සහතික කිරිම් සැපයීම සඳහා පාදක වූ වත්කම්වල ස්වභාවය;

(ඈ) එම සහතික කිරිම්වල වෙනත් මෙහෙයුම් සහ මූල්‍ය බලපෑම්.

ආ52 මූල්‍ය ප්‍රකාශන පරිශීලකයින්ට තක්සේරු කිරීමට උදවු දෙන තොරතුරු, 51 ඡේදයට අනුව හෙළිදරවු කිරිමේ අරමුණ තෘප්ත කිරිමට අවශ්‍ය විය හැකි සිද්ධි මත රඳාපවතිමින්, විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙණුවලට සම්බන්ධයෙන් අමතර තොරතුරු ඇතුලත් කිරිමට පුළුවනි.

උදාහරණ

(අ) විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙණුව සඳහා සහ එම ගණුදෙණු ව්‍යාප්තියේ කල්බදු ගැනුම්කරුගේ හේතු;

(ආ) තනි තනි විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙණුවල ප්‍රධාන කොන්දේසී සහ නියමයන්;

(ඇ) කල්බදු වගකීම් මැනීම් තුල ඇතුලත් නොකළ ගෙවීම්;

(ඈ) වාර්තාකරණ කාලපරිච්ඡේදය තුල විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙණුවල මුදල් ප්‍රවාහ බලපෑම්.

## කල්බදු දීමනාකරුගේ කල්බදු වර්ගීකරණය (61-66 ඡේද)

ආ53 මෙම ප්‍රමිතියේ කල්බදු දීමනාකරුවන් සඳහා කල්බදුවල වර්ගීකරණය, පාදක වූ වත්කමේ අයිතියට අනුශංගික කල්බද්දේ අවදානම සහ ප්‍රතිලාභ මාරු කරන ප්‍රමාණය මත පදනම් වේ. අකර්මණ්‍ය ධාරිතාවයේ හෝ තාක්ෂණික යල්පැනීම් වලින් ඇති විය හැකි පාඩු සහ ආර්ථික තත්වයන් වෙනස්වීම නිසා ප්‍රතිලාභවල විචලනයන් අවදානමේ ඇතුලත් වේ. පාදක වූ වත්ක මේ ආර්ථික ජීවිත කාලය පුරා අපේක්ෂිත ලාභදායකත්ව මෙහෙයුම් සහ අවශේෂ වටිනාකම උපලබ්ධි වීම හෝ වටිනාකම වැඩි වීමෙන් ලාභය, ප්‍රතිලාභවල නිරූපණය කළ හැකිය.

ආ54 කල්බදු ගිවිසුමක ආරම්භක දිනය සහ කල්බද්ද පටන්ගත් දිනය අතර විශේෂිත වෙනස්වීම් සිදුවීම සඳහා කල්බදු ගෙවීම් ගැලපීමට කොන්දේසී සහ නියමයන් ඇතුලත් කළ හැකිය. (එනම් කල්බදු දීමනාකරුගේ පාදක වූ වත්කමේ පිරිවැය වෙනස්වීමක් හෝ කල්බදු දීමනාකරුගේ කල්බද්ද මූල්‍ය කිරීමේ පිරිවැයේ වෙනසක්) එම අවස්ථාවේදී කල්බද්ද වර්ගීකරණ අරමුණ සඳහා ඕනෑම එවැනි වෙනස්වීම්වල බලපෑම ආරම්භක දිනට සිදුවී ඇති ලෙස සැලකිය යුතු වේ.

ආ55 කල්බද්ද තුල ඉඩම් සහ ගොඩනැගිලි මූලිකාංග දෙකම ඇතුලත් කර ඇතිවිට, කල්බදු දීමනාකරු එක් එක් කොටසේ වර්ගීකරණය මූල්‍ය කල්බද්දක් ලෙස හෝ මෙහෙයුම් කල්බද්දක් ලෙස වෙනමම 62 - 66 ඡේද සහ ආ53 - ආ54 ඡේද ප්‍රකාරව තක්සේරු කළයුතු වේ. ඉඩම් මූලිකාංගය, මූල්‍ය කල්බද්දක්ද මෙහෙයුම් කල්බද්දක්ද යන්න නිශ්චය කිරීමේදී, වැදගත් සැලකිලිමත්වීම වන්නේ ඉඩමේ සාමාන්‍යයෙන් අනියත ජීවිත කාලයක් තිබෙන බවයි.

ආ56 ඉඩම් සහ ගොඩනැගිලි කල්බද්දක් සඳහා වර්ග කිරීමේදී සහ ගිණුම්ගත කිරීම අවශ්‍ය වූ ඕනෑම විටක, කල්බදු දීමනාකරු කල්බදු ගෙවීම් (ඕනෑම එකවර ගෙවූ ඉදිරියට ගෙවීම් ඇතුලත්ව), ආරම්භක දිනට කල්බද්දේ ඉඩම් කොටසේ සහ ගොඩනැගිලි කොටසේ කල්බදු අයිතියේ සාපේක්ෂ සාධාරණ අගයන්වලට සාමානුපතිකව ඉඩම් සහ ගොඩනැගිලි අතරේ බෙදාහැරිය යුතු වේ. එම කොටස් අතරේ සාධරණ ලෙස කල්බදු ගෙවීම් බෙදාහැරීමට නොහැකි නම් සම්පූර්ණ කල්බද්ද මූල්‍ය කල්බද්දක් ලෙස වර්ගීකරණය කරයි. නොඑසේ නම් මෙහෙයුම් කල්බදු ලෙස සංරචක දෙකම පැහැදිලි නම්, සම්පූර්ණ කල්බද්දම මෙහෙයුම් කල්බද්දක් ලෙස වර්ගීකරණය කරයි.

ආ57 ඉඩම් සහ ගොඩනැගිලි කල්බද්දක් සඳහා ඉඩම් මූලිකාංගය සඳහා වන අගය නොවැදගත් වන විට, කල්බදු දීමනාකරුවෙක් කල්බදු වර්ගීකරණය සඳහා ඉඩම් සහ ගොඩනැගිලි තනි ඒකකයක් ලෙස සලකනු ලැබිය හැකි අතර එය 62 - 66 ඡේද සහ ආ53 - ආ54 ඡේද ප්‍රකාරව මූල්‍ය කල්බද්දක් ලෙස හෝ මෙහෙයුම් කල්බද්දක් ලෙස වර්ගීකරණය කරයි. එවැනි අවස්ථාවක ගොඩනැගිල්ලේ ආර්ථික ජීවිත කාලය සම්පූර්ණ පාදක වූ වත්කමේ ආර්ථික ජීවිත කාලය ලෙස කල්බදු දීමනාකරුවෙක් සැලකිය යුතු වේ.

### උප කල්බදු වර්ගීකරණය

ආ58 උප කල්බද්දක් වර්ගීකරණයේදී, උප කල්බද්ද මූල්‍ය කල්බද්දක් හෝ මෙහෙයුම් කල්බද්දක් ලෙස අතරමැදි කල්බදු දීමනාකරුවෙක් පහත පරිදි වර්ගීකරණය කළයුතු වේ.

අ) අස්තිත්වය, කල්බදු ගැනුම්කරුවෙක් ලෙස 6 ඡේදය ප්‍රකාරව ගිණුම්ගත කර ඇති ප්‍රධාන කල්බද්ද කෙටිකාලීන කල්බද්දක් නම්, මෙහෙයුම් කල්බද්දක් ලෙස උප කල්බද්ද වර්ගීකරණය කළයුතු වේ.

ආ) එසේ නොමැති නම්, උප කල්බද්ද පාදක වූ වත්කමෙහි යොමුවට වඩා ප්‍රධාන කල්බද්දෙන් පැන නගින වත්කම පාවිච්චි කිරිමේ හිමිකමේ යොමුව මඟින් වර්ගීකරණය කළයුතු වේ (උදාහරණ ලෙස කල්බදු විෂයට ගැනෙන දේපළ, පිරියත සහ උපකරණවල අයිතමය).

## ඇ පරිශිෂ්ඨය

## බල පැවැත්වෙන දිනය සහ සංක්‍රාන්තිය

මෙම පරිශිෂ්ඨය ප්‍රමිතියේ කොටසක් වන අතර ප්‍රමිතියේ අනෙකුත් කොටස් මෙන් සමාන අධිකාරිත්යක් තිබේ.

## බල පැවැත්වෙන දිනය

ඇ1 අස්තිත්වයක් 2019 ජනවාරි 01 දින හෝ ඊටපසු ආරම්භවන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේද සඳහා මෙම ප්‍රමිතිය ව්‍යාවහාර කළ යුතු වේ. SLFRS – 15 *ගණුදෙණුකරුවන් සමග ඇතිකරගත් ගිවිසුම්වල අයභාරය* ව්‍යවහාර කරන හෝ මෙම ප්‍රමිතිය පළමුවරට ව්‍යවහාර කරන දිනට කලින් ව්‍යවහාර කරන අස්තිත්ව සඳහා ඉඩදෙයි. අස්තිත්වයක් මෙම ප්‍රමිතිය කලින් ව්‍යවහාර කරන්නේ නම් එම කරුණ හෙළිදරව් කළයුතු වේ.

## සංක්‍රාන්තිය

ඇ2 ඇ 1 - ඇ19 ඡේදවල අවශ්‍යතාවයන්හි අරමුණ සඳහා, පළමුවරට ව්‍යවහාර කරන දිනය, අස්තිත්වයක් මෙම ප්‍රමිතිය පළමුවරට ව්‍යවහාර කරන වාර්ෂික කාලපරිච්ඡේදය පටන්ගත් දිනයයි.

## කල්බද්දක් නිර්වචනය

ඇ3 ප්‍රායෝගික භාවිතයේදී, පළමුවරට ව්‍යවහාර කරන දිනයට ගිවිසුමක් කල්බද්දකින් සමන්විතදැයි නැවත තක්සේරු කිරීමට අස්තිත්වයකට අවශ්‍ය නොවේ. ඊට හැර අස්තිත්වයකට පහත පරිදි ඉඩ දෙනු ලැබේ.

අ) LKAS 17 *කල්බදු* සහ IFRIC 4 – *එකගවීමක් කල්බද්දක්ද යන්න නිශ්චය කිරීම* ප්‍රකාරව, කල්බදු වශයෙන් කලින් හඳුනාගත් ගිවිසුම්වලට මෙම ප්‍රමිතිය ව්‍යාවහාර කිරීමට ඉඩ දෙයි. එම කල්බදුවලට ඇ 5- ඇ18 ඡේදවල සංක්‍රාන්ති අවශ්‍යතාවයන් අස්තිත්වය ව්‍යවහාර කළයුතු වේ.

ආ) LKAS 17 සහ IFRIC 4 ප්‍රකාරව කල්බද්දකින් සමන්විත ලෙස කලින් හඳුනානොගත් ගිවිසුම්වලට මෙම ප්‍රමිතිය ව්‍යාවහාර කිරීමට ඉඩ දෙනු නොලැබේ.

ඇ4 අස්තිත්වයක් ඇ3 ඡේදයේ ප්‍රායෝගික භාවිතය තෝරා ගත්තේ නම්, එම කරුණ හෙළිදරව් කළයුතු අතර එහි සියළුම ගිවිසුම්වලට ප්‍රායෝගික භාවිතය ව්‍යාවහාර කළයුතු වේ. එහි ප්‍රතිඵලයක් ලෙස අස්තිත්වයක් පළමුවරට ව්‍යවහාර කරන දිනට හෝ ඊට පසුව එළඹුණු ගිවිසුම්වලට පමණක් (වෙනස්ව හෝ) 9 - 11 ඡේදවල අවශ්‍යතාවයන් ව්‍යවහාර කළයුතු වේ.

## කල්බදු ගැනුම්කරුවන්

ඇ5 මෙම ප්‍රමිතිය කල්බදු වලට පහත සඳහන් දෙකෙන් එකක්, කල්බදු ගැනුම්කරුවෙක් ව්‍යවහාර කළයුතු වේ.

අ) LKAS 8 - ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්වීම් සහ වැරදි ප්‍රකාරව, එක් එක් පෙර වාර්තාකරණ කාලපරිච්ඡේදවලට අතීතානුයෝගිව; හෝ

ආ) ආ7 සිට ආ13 දක්වා ඡේදවලට අනුව, පළමුවරට ව්‍යවහාර කරන දිනට හඳුනාගත් පළමුවරට ප්‍රමිතිය ව්‍යාවහාර කිරීමේ සමුච්චිත බලපෑම සමඟ අතීතානුයෝගිව.

ඇ6 කල්බදු ගැනුම්කරුවෙක් ඔහුගේ සියළුම කල්බදුවලට ඇ5 ඡේදයේ විස්තර කර ඇති තෝරා ගැනීම ඒකාකාරිව ව්‍යවහාර කළයුතු වේ.

ඇ7 කල්බදු ගැනුම්කරුවෙක් ඇ5(ආ) ඡේදයට අනුව, මෙම ප්‍රමිතිය ව්‍යාවහාර කිරීමට තෝරාගන්නේ නම්, කල්බදු ගැනුම්කරු සංසන්දනාමක තොරතුරු නැවත ඉදිරිපත් කිරීම නොකළ යුතු වේ. ඒ වෙනුවට කල්බදු ගැනුම්කරු රඳවාගත් ඉපයීම්වල ආරම්භක ශේෂයට ගැලපීමක් ලෙස පළමුවරට ව්‍යාවහාර කරන දිනට (වෙනත් ස්කන්ධ සංරචකයකට යෝග්‍ය ලෙස හෝ) මෙම ප්‍රමිතිය පළමුවරට ව්‍යවහාර කිරීමෙන් සමුච්චිත බලපෑම හඳුනාගත යුතු වේ.

**මෙහෙයුම් කල්බදු ලෙස කලින් වර්ග කළ කල්බදු**

ඇ8 කල්බදු ගැනුම්කරුවෙක් ඇ5 (ආ) ඡේදයට අනුව මෙම ප්‍රමිතිය ව්‍යවහාර කිරීමට තෝරාගත්තේ නම් කල්බදු ගැනුම්කරු;

(අ) LKAS 17 ප්‍රකාරව මෙහෙයුම් කල්බද්දක් ලෙස කලින් වර්ගකළ කල්බදු සඳහා පළමුවරට ව්‍යාවහාර කරන දිනට කල්බදු වගකීම හඳුනාගත යුතු වේ. කල්බදු ගැනුම්කරු එම කල්බදු වගකීම පළමුවරට ව්‍යාවහාර කරන දිනට කල්බදු ගැනුම්කරුගේ වර්ධනය වන ණය අනුපාතිකය භාවිතයෙන් වට්ටම් කළ ඉතිරි කල්බදු ගෙවීම්වල වර්තමාන අගයට මැනිය යුතු වේ.

(ආ) LKAS 17 ප්‍රකාරව මෙහෙයුම් කල්බද්දක් ලෙස කලින් වර්ග කළ කල්බදු සඳහා, පළමුවරට ව්‍යාවහාර කරන දිනට වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් හඳුනාගත යුතු වේ. කල්බදු ගැනුම්කරු කල්බද්දෙන් කල්බද්ද පදනම මත වත්කම පාවිච්චි කිරීමේ හිමිකම මැනීමට පහත සඳහන් දෙකෙන් එකක් තෝරා ගැනීම කළයුතු වේ.

i) පළමුවරට ව්‍යාවහාර කරන දිනට කල්බදු දීමනාකරුගේ වර්ධනය වන ණය අනුපාතිකය භාවිතයෙන් වට්ටම් කළ නමුත් ආරම්භක දිනට මෙම ප්‍රමිතිය ව්‍යාවහාර කර තිබේ නම් එහි ධාරණ අගය; හෝ

ii) පළමුවරට ව්‍යාවහාර කරන දිනට පෙර, වහාම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගත් කල්බද්ද සම්බන්ධයෙන් ඕනෑම කලින් ගෙවූ හෝ උපචිත කල්බදු ගෙවීම්වල ප්‍රමාණයෙන් ගලපන ලද කල්බදු වගකීමට සමාන වටිනාකමක්.

ඇ) කල්බදු ගැනුම්කරු ඇ10 (ආ) ඡේදයේ ප්‍රායෝගික භාවිතය ව්‍යාවහාර කිරීම හැර පළමුවරට ව්‍යාවහාර කරන දිනට වත්කම පාවිච්චි කිරීමේ හිමිකමට LKAS 36 - වත්කම් හානිකරණය ව්‍යාවහාර කරයි.

ඇ9 ඇ8 ඡේදයේ අවශ්‍යතාවයන් එසේ තිබියදී, LKAS 17 ප්‍රකාරව මෙහෙයුම් කල්බද්දක් ලෙස කලින් වර්ග කළ කල්බදු සඳහා කල්බදු ගැනුම්කරුවෙක් ඃ

අ) 6 ඡේදය ප්‍රකාරව ගිණුම්ගත කළ අඩු වටිනාකමක් සහිත පාදක වූ වත්කමක (ආ 3 - ආ 8 ඡේද වල විස්තර කර ඇති පරිදි ) කල්බදු සඳහා සංක්‍රාන්තිය මත ඕනෑම ගැලපීම් සිදු කිරීමට අවශ්‍ය කරනු නොලැබේ. කල්බදු ගැනුම්කරු පළමුවරට ව්‍යාවහාර කරන දිනයේ සිට මෙම ප්‍රමිතිය එවැනි කල්බදු සඳහා ගිණුම්ගත කළයුතු වේ.

ආ) LKAS 40 - *ආයෝජන දේපළවල සාධාරණ වටිනාකම් ආකෘතිය* භාවිතයෙන් ආයෝජන දේපළ ලෙස කලින් ගිණුම් ගත කළ කල්බදු සඳහා සංක්‍රාන්තිය මත ඕනෑම ගැලපීම් සිදු කිරීමට අවශ්‍ය කරනු නොලැබේ. කල්බදු ගැනුම්කරු LKAS 40 ප්‍රකාරව එම කල්බදු මගින් පැන නගින වත්කම පාවිච්චි කිරීමේ හිමිකම සහ කල්බදු වගකීම සඳහා මෙම ප්‍රමිතිය පළමුවරට ව්‍යාවහාර කළ දිනයේ සිට ගිණුම්ගත කළයුතු වේ.

ඇ) LKAS 17 ප්‍රකාරව මෙහෙයුම් කල්බදු ලෙස කලින් ගිණුම් ගතකළ කල්බදු සඳහා පළමුවරට ව්‍යාවහාර කරන දිනට සාධාරණ අගයට වත්කම පාවිච්චි කිරීමේ හිමිකම මැනිය යුතු අතර එය පළමුවරට ව්‍යාවහාර කළ දිනයේ සිට LKAS 40 හි සාධාරණ වටිනාකම් ආකෘතිය භාවිතයෙන් ආයෝජන දේපළ ලෙස ගිණුම්ගත කළයුතු වේ.

LKAS 40 ප්‍රකාරව එම මෙම ප්‍රමිතිය පළමුවරට ව්‍යාවහාර කළ දිනයේ සිට කල්බදු මගින් පැන නගින වත්කම පාවිච්චි කිරීමේ හිමිකම සහ කල්බදු වගකීම ගිණුම්ගත කළයුතු වේ.

ඇ10 LKAS 17 ප්‍රකාරව මෙහෙයුම් කල්බදු ලෙස කලින් ගිණුම්ගත කළ කල්බදු සඳහා ඇ5 (ආ) ඡේදයට අනුව, කල්බදු ගැනුම්කරුවෙක් මෙම ප්‍රමිතිය අතීතානුයෝගිව ව්‍යාවහාර කරන විට, පහත සඳහන් ප්‍රායෝගික භාවිතයන් එකක් හෝ ඊට වැඩියෙන් භාවිතා කළහැකිය. කල්බදු ගැනුම්කරුවෙකුට මෙම ප්‍රායෝගික භාවිතයන් කල්බද්දෙන් කල්බද්ද මත ව්‍යාවහාර කිරීමට ඉඩ දෙයි.

(අ) කල්බදු ගැනුම්කරුවෙක් සාධාරණ පමණට සමාන ලක්ෂණ සහිත කල්බදුවල කළඹයකට තනි වට්ටම් අනුපාතිකයක් ව්‍යාවහාර කළ හැකිය. (එනම් සමාන ආර්ථික පරිසරක් තුල සමාන ඉතිරි කල්බදු වාරය සහිත සමාන පාදක වූ වත්කමේ සමාන පන්තියක් සඳහා වන කල්බදුවලට).

(ආ) කල්බදු ගැනුම්කරුවෙක් හානිකරණ පරීක්ෂාවක් ක්‍රියාත්මක කිරීමට විකල්පයක් ලෙස පළමුවරට ව්‍යාවහාර කරන දිනට පෙර වහාම LKAS 37 - *ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්* ප්‍රකාරව, භාරක කල්බදුද යන තක්සේරුව මත විශ්වාසය තැබිය හැකිය. කල්බදු ගැණුකරුවෙක් මෙම ප්‍රායෝගික

භාවිතය තෝරා ගත්තේ නම්, පළමුවරට ව්‍යාවහාර කරන දිනට පෙර වහාම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය තුල හදුනාගත් හාරක කල්බදු සඳහා ප්‍රතිපාදනයේ ප්‍රමාණය මගින් පළමුවරට ව්‍යාවහාර කරන දිනට වත්කම පාවිච්චි කිරිමේ හිමිකම කල්බදු ගැනුම්කරු ගැලපීම් කළයුතු වේ.

(ඇ) පළමුවරට ව්‍යාවහාර කරන දිනට කල්බදු වාරය මාස 12ක් තුල අවසන් වන කල්බදු වලට ඇ8 ඡේදයේ අවශ්‍යතාවයන් ව්‍යාවහාර නොකිරීමට කල්බදු ගැනුම්කරුට තෝරාගත හැකිය. මෙවැනි අවස්ථාවල කල්බදු ගැනුම්කරු :

i) 6 ඡේදයේ විස්තර කර ඇති පරිදි කෙටිකාලීන කල්බදු ගිණුම් ගත කරන ආකාරයෙන්ම එම කල්බදු සඳහාද ගිණුම්ගත කළයුතු වේ.

ii) පළමුවරට ව්‍යාවහාර කරන දිනට ඇතුලත් කරන වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදයේ කෙටිකාලීන කල්බදු වියදම් හෙළිදරව් කිරිම් තුල ඇතුලත් එවැනි කල්බදු ගෙවීම් සමග ආශ්‍රිත පිරිවැයක් ඇතුලත් කළයුතුවේ.

(ඈ) පළමුවරට ව්‍යාවහාර කරන දිනට කල්බදු ගැනුම්කරුවෙක් වත්කම පාවිච්චි කිරිමේ හිමිකම මැනිමෙන් මූලික සෘජු පිරිවැය ඉවත් කළ හැකිවේ.

(ඉ) ගිවිසුමේ කල්බද්ද දීර්ඝ කිරීමට හෝ අවසන් කිරීමට විකල්පවලින් සමන්විත නම් කල්බදු ගැනුම්කරුට කල්බදු වාරය නිශ්වය කිරීමේදී මෙන් පසුදැක්ම භාවිතා කළ හැකිවේ.

## මූල්‍ය කල්බදු ලෙස කලින් වර්ග කළ කල්බදු

ඇ11 LKAS 17 ප්‍රකාරව මූල්‍ය කල්බදු ලෙස වර්ග කළ කල්බදු සඳහා කල්බදු ගැනුම්කරුවෙක් ඇ5 (ආ) ඡේදයට අනුව මෙම ප්‍රමිතිය ව්‍යාවහාර කිරීමට තෝරා ගත්තේ නම්, පළමුවරට ව්‍යාවහාර කරන දිනට වත්කම පාවිච්චි කිරිමේ හිමිකමේ ධාරණ අගය සහ කල්බදු වගකීම LKAS 17 ප්‍රකාරව මනින ලද එම දිනට පෙර වහාම කල්බදු වත්කමේ සහ කල්බදු වගකීමේ ධාරණ අගයට වියයුතුයි. එම කල්බදු සඳහා කල්බදු ගැනුම්කරුවෙක් පළමුවරට ව්‍යාවහාර කරන දිනයේ සිට වත්කම පාවිච්චි කිරිමේ හිමිකම සහ කල්බදු වගකීම මෙම ප්‍රමිතිය ප්‍රකාරව ගිණුම් ගත කළයුතු වේ.

## හෙළිදරව් කිරීම

ඇ12 ඇ5 (ආ) ඡේදයට අනුව මෙම ප්‍රමිතිය ව්‍යාවහාර කිරීමට කල්බදු ගැනුම්කරුවෙක් තෝරා ගත්තේ නම්, LKAS 8 හි 28 (ඊ) ඡේදයෙන් නියම කළ තොරතුරු සඳහා හැර, LKAS 8 හි 28 ඡේදයේ නියම කළ පළමුවරට ව්‍යාවහාර කිරීම පිළිබඳ තොරතුරු කල්බදු ගැනුම්කරු හෙළිදරව් කිරීම කළ යුතුවේ. LKAS 8 හි 28 (ඊ) ඡේදයේ විශේෂයෙන් නියම කළ තොරතුරු වෙනුවට කල්බදු ගැනුම්කරු පහත සඳහන් දෑ හෙළිදරව් කිරීම කළයුතු වේ.

(අ) පළමුවරට ව්‍යාවහාර කරන දිනයේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගත් කල්බදු වගකීම් වලට ව්‍යාවහාර කළ බරතැබූ සාමාන්‍ය කල්බදු ගැනුම්කරුගේ වර්ධක ණය අනුපාතිකය; සහ

(ආ) පහත සඳහන් දෙක අතර වෙනසේ පැහැදිලි කිරිමක්:

i) ඇ8 (ආ) ඡේදයේ විස්තර කර ඇති පරිදි පළමුවරට ව්‍යාවහාර කරන දිනයේ වර්ධක ණය අනුපාතිකය භාවිතයෙන් වට්ටම්කල, පළමුවරට ව්‍යාවහාර කරන දිනට වහාම පෙර වාර්ෂික වාර්තාකරණ කාලපරිච්ඡේදය අවසානයේ LKAS 17 ප්‍රකාරව හෙළිදරව් කළ මෙහෙයුම් කල්බදු බැඳියාවන් සහ

ii) පළමුවරට ව්‍යාවහාර කරන දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගත් කල්බදු වගකීම

ඇ13 කල්බදු ගැනුම්කරුවෙක් ඇ10 ඡේදයෙන් විශේෂයෙන් නියම කළ එකක් හෝ ඊටවැඩි ප්‍රායෝගික භාවිතයන් යොදාගන්නේ නම් එම කරුණ හෙළිදරව්කිරීම කළයුතු වේ.

## කල්බදු දීමනාකරු

ඇ14 ඇ15 ඡේදයේ විස්තර කරඇති දෑ හැර, කල්බදු දීමනාකරුවෙකුට පළමුවරට ව්‍යාවහාර කරන දිනයේ සිට මෙම ප්‍රමිතිය ප්‍රකාරව කල්බදු සඳහා ගිණුම් ගත කර ඇති කල්බදු දීමනාකරුගේ කල්බදු සඳහා සංක්‍රාන්තිය මත ඕනෑම ගැලපීමක් සිදු කිරීම අවශ්‍ය නොවේ.

ඇ15 අතරමැදි කල්බදු දීමනාකරු,

අ) මෙම ප්‍රමිතිය ප්‍රකාරව එක් එක් උපකල්බද්ද, මූල්‍ය කල්බද්දක්ද නැතහොත් මෙහෙයුම් කල්බද්දක්ද යන්න ලෙස වර්ග කරන්නේදැයි නිශ්වය කිරීමට පළමුවරට ව්‍යාවහාර කරන දිනට ඉදිරියට යන සහ LKAS 17

ප්‍රකාරව මෙහෙයුම් කල්බදු ලෙස වර්ගකළ උප කල්බදු නැවත තක්සේරු කළ යුතු වේ. අතරමැදි කල්බදු දීමනාකරු පළමුවරට ව්‍යාවහාර කරන දිනට ප්‍රධාන කල්බද්දේ සහ උප කල්බද්දේ ඉතිරිව ඇති ගිවිසුම්ගත නියමයන් සහ කොන්දේසි මත එම දිනට එම තක්සේරුව කළයුතු වේ.

ආ) LKAS 17 ප්‍රකාරව මෙහෙයුම් කල්බදු ලෙස වර්ග කළ නමුත් මෙම ප්‍රමිතිය ප්‍රකාරව මූල්‍ය කල්බදු, පළමුවරට ව්‍යාවහාර කරන දිනට එළඹුණු අළුත් මූල්‍ය කල්බද්දක් ලෙස උප කල්බද්ද සඳහා ගිණුම්ගත කළයුතු වේ.

### පළමුවරට ව්‍යාවහාර කරන දිනට පෙර විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙණු

ඇ16 විකිණීමක් ලෙස ගිණුම් ගත කිරීමට පාදක වූ වත්කම පැවරීම SLFRS 15හි අවශ්‍යතාවයන් සම්පූර්ණ කරන්නේ දැයි නිශ්චය කිරීමට, පළමුවරට ව්‍යාවහාර කරන දිනට පෙර එළඹිණු විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙණු අස්තිත්වයක් නැවත තක්සේරු නොකළ යුතු වේ.

ඇ17 විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙණුව, විකිණීමක් ලෙස සහ LKAS 17 ප්‍රකාරව මූල්‍ය කල්බද්දක් ලෙස ගිණුම් ගත කර ඇත්නම්, විකුණුම්කරු - කල්බදු ගැනුම්කරු,

අ) පළමුවරට ව්‍යාවහාර කරන දිනට පැවති අනෙකුත් මූල්‍ය කල්බදු ගිණුම් ගත කළ ආකාරයටම ප්‍රතිකල්බදුකරණය සඳහා ගිණුම්ගත කරනු ලබන අතර; සහ

ආ) විකිණීම මත ඕනෑම ලාභයක් කල්බදු වාරය පුරා දිගටම ක්‍රමක්ෂය කළ යුතුයි.

ඇ18 විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙණුවක්, විකිණීමක් ලෙස සහ LKAS 17 ප්‍රකාරව මෙහෙයුම් කල්බද්දක් ලෙස ගිණුම් ගත කර ඇත්නම්, විකුණුම්කරු - කල්බදු ගැනුම්කරු,

(අ) පළමුවරට ව්‍යාවහාර කරන දිනට පැවති අනෙකුත් මෙහෙයුම් කල්බදු ගිණුම් ගත කළ ආකාරයටම ප්‍රතිකල්බදුකරණය සඳහා ගිණුම්ගත කළයුතුයි.

(ආ) පළමුවරට ව්‍යාවහාර කරන දිනට පෙර වහාම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගත් බාහිර වෙළඳපොළ නියමයන්ට සම්බන්ධ ඕනෑම විලම්භිත ලාභ හෝ පාඩු සඳහා වත්කම පාවිච්චි කිරීමේ හිමිකම ප්‍රතිකල්බදුකරණය, ගැලපීම් කළයුතුයි.

### ව්‍යාපාර සංයෝජන සම්බන්ධයෙන් කලින් හඳුනාගත් අගයන්

ඇ19 ව්‍යාපාර සංයෝජනයේ කොටසක් ලෙස අත්පත් කරගත් මෙහෙයුම් කල්බද්දක වාසිදායක හෝ අවාසිදායක නියමයන් සම්බන්ධයෙන් කල්බදු ගැනුම්කරුවෙක් SLFRS 03 - *ව්‍යාපාර සංයෝජන* ප්‍රකාරව වත්කමක් හෝ වගකීමක් කලින් හඳුනාගත්තේ නම්, කල්බදු ගැනුම්කරුවෙක් පළමුවරට ව්‍යාවහාර කරන දිනට එම වත්කම හෝ වගකීම හඳුනා නොගත යුතු අතර අනුරූපී අගය මගින් වත්කම පාවිච්චි කිරීමේ හිමිකමේ ධාරණ අගයට ගැලපීම් කළයුතු වේ.

## SLFRS 09ට යොමුවන්

ඇ20 අස්තිත්වයක් මෙම ප්‍රමිතිය ව්‍යාවහාර කළ නමුත් SLFRS 09 - *මූල්‍ය සාධනපත්‍ර* දැනට ව්‍යාවහාර කර නොමැති නම්, SLFRS 09ට මෙම ප්‍රමිතියේ ඕනෑම යොමුවක් LKAS 39 - *මූල්‍ය සාධනපත්‍ර හඳුනා ගැනීම සහ මැනීමට* යොමුවක් ලෙස කියවිය යුතුයි.

## අනෙකුත් ප්‍රමිත ඉවත් කිරීම

ඇ21 මෙම ප්‍රමිතිය, පහත සඳහන් ප්‍රමිත සඳහා අර්ථනිරූපන අවලංගු කරයි.

අ) LKAS 17 - *කල්බදු*

ආ) IFRIC 4 – *එකඟවීමක් කල්බද්දකින් සමන්විතද යන්න නිශ්චය කිරීම*

ඇ) SIC 15 - *මෙහෙයුම් කල්බදු - ප්‍රතිදාන*

ඈ) SIC 27 - *කල්බද්දක නෛතිකභාවය ඇතුලත් වන ගණුදෙණුවේ යථා ස්වරූපය ඇගයීම*

## ඈ පරිශිෂ්ඨය

## වෙනත් ප්‍රමිතිවලට සංශෝධන

*මෙම ප්‍රමිතිය නිකුත් කිරීමේ ප්‍රතිඵලයක් ලෙස අනෙකුත් ප්‍රමිතිවලට සංශෝධන මෙම ප්‍රවිෂ්ඨයෙන් විදහා දක්වයි. 2019 ජනවාරි 01 දිනයට හෝ ඊට පසු ආරම්භවන වාර්ෂික කාලපරිච්ඡේදයක් සඳහා අස්තිත්වයක් මෙම ප්‍රමිතිය ව්‍යවහාර කළ යුතුවේ. අස්තිත්වයක් පෙර කාලපරිච්ඡේදයක් සඳහා මෙම ප්‍රමිතිය ව්‍යවහාර කරන්නේ නම්, එම පෙර කාලපරිච්ඡේදය සඳහාද මෙම සංශෝධන ව්‍යවහාර කළයුතු වේ.*

*අස්තිත්වයකට SLFRS 15 - ගණුදෙනුකරුවන් සමඟ ඇතිකරගත් ගිවිසුම්වල අයභාරය, ව්‍යවහාර කිරීමට පෙර SLFRS 16 ව්‍යවහාර කිරීමට (ඈ 1 ඡේදය බලන්න) ඉඩ නොදේ. 2016 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන ප්‍රමිති සඳහා ප්‍රතිඵලයක් ලෙස, 2016 ජනවාරි 01 දින සිට බලපැවැත්වෙන SLFRS 15 මගින් සංශෝධනය කළ, එම ප්‍රමිතිවල වගන්ති මත පදනම් කරගෙන, මෙම පරිශිෂ්ඨයේ සංශෝධන ඉදිරිපත් කරයි. මෙම පරිශිෂ්ඨයේ ප්‍රමිතීන්හි වගන්තිවල, 2016 ජනවාරි 01 දින බලාත්මක නොකළ වෙනත් යම් සංශෝධනයක් ඇතුලත් කර නොමැත.*

*2016 ජනවාරි 01 දින සිට බලාත්මක නොකළ ප්‍රමිති සඳහා, SLFRS 15 මගින් සංශෝධන කළ, පිළිගෙන තිබෙන එම ප්‍රමිතියේ වගන්ති මත පදනම් කරගෙන මෙම පරිශිෂ්ඨයේ සංශෝධන (මෙම ප්‍රකාශයේ ඇතුලත්ව) ඉදිරිපත් කරයි. 2016 ජනවාරි 01 දින සිට බලාත්මක නොකළ වෙනත් යම් සංශෝධන මෙම පරිශිෂ්ඨයේ එම ප්‍රමිතීන්හි වගන්තිවල ඇතුලත් නොවේ.*

*සංශෝධන ඡේද, අයින් කළ වගන්ති තනි ඉරකින් කපාහරිමින් සහ අළුතින් එකතු වූ වගන්ති යටින් ඉරක් අඳිමින් පෙන්වා තිබේ.*

## SLFRS 01 - *ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති මුල්වරට සම්මත කර ගැනීම*

| |
|---|
| 30 වැනි ඡේදය සංශෝධනය කරන අතර 39 අආ ඡේදය අළුතින් එකතු කරයි. |

### සලකනු ලබන පිරිවැය ලෙස සාධාරණ වටිනාකමේ භාවිතය

30 අස්තිත්වයක් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක්, ආයෝජන දේපළක්, අස්පෘශ්‍ය වත්කමක් හෝ වත්කම පාවිච්චි කිරීමේ හිමිකම (ඈ 5 සහ ඈ 7 ඡේද බලන්න) සඳහා සලකනු ලබන පිරිවැය ලෙස සාධාරණ වටිනාකම එහි ආරම්භක SLFRS මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ භාවිතා කරන්නේ නම්, අස්තිත්වයේ ප්‍රථම SLFRS මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එක් එක් රේඛීය අයිතමය සඳහා හෙළිදරව් කිරීම කළයුතු වේ;

(අ) ......

## බලපැවැත්වෙන දිනය

39අආ 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 - කල්බදු හි, 30, ඈ4, ඈ1, ඈ7, ඈ 8ආ සහ ඈ 9 ඡේද සංශෝධනය කළ අතර ඈ9අ ඉවත්කර සහ ඈ9 ආ- ඈ9ඉ ඡේද අළුතින් එකතු කරන ලදී අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, මෙම සංශෝධන ව්‍යවහාර කළයුතු වේ.

| |
|---|
| ඈ 4 ඡේදය සංශෝධනය කරයි. |

### ව්‍යාපාර සංයෝජනය සඳහා නිදහස්වීම්

ඈ4 පළමුවරට ව්‍යවහාර කරන්නා, අතීත ව්‍යවහාර සංයෝජනයකට SLFRS 03 අතීතානුයෝගීව ව්‍යවහාර නොකරන්නේ නම්, මෙය එම ව්‍යාපාර සංයෝජනය සඳහා පහත සඳහන් ප්‍රතිඵල ඇති කරයි.

(අ) .......

(ඊ) අතීත ව්‍යාපාර සංයෝජනයකදී අත්පත් කරගත් වත්කම් හෝ භාරගත් වගකීම්, පූර්ව ගැප් (GAAP) ප්‍රකාරව හඳුනා නොගත්තේ නම්, ආරම්භක SLFRS මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ශූන්‍ය වූ සලකනු ලබන පිරිවැයක් එයට නොමැත. ඒ වෙනුවට අත්පත්කර ගැනීමට භාජනයවන්නාගේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ SLFRSs වලට අනුව අවශ්‍ය යැයි සලකනු ලබන පදනම මත අත්පත් කරගනු ලබන්නා ඔහුගේ ඒකාබද්ධ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ එය හඳුනා ගැනීම සහ මිනුම් කිරීම කළයුතුයි. පැහැදිලි

කිරීමක් ලෙස පූර්ව ගැප් ප්‍රකාර කල්බදු ගැනුම්කරුවෙක් වන අත්පත් කිරීමට භාජනය වන්නා, අත්පත් කරගනු ලබන්නා විසින් අතීත ව්‍යාපාර සංයෝජනයේදී අත්පත් කරගත් කල්බදු ප්‍රාග්ධනිත කර නොමැති නම්, ~~LKAS 17~~ SLFRS 16 - කල්බදු අවශ්‍යතාවය පරිදි අත්පත් කරගනු ලබන්නා ඔහුගේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ ප්‍රාග්ධනිත කළ යුතු බැවින් අස්තිත්වය සිය ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවල එම කල්බදු ප්‍රාග්ධනිත කළයුතුයි. ඒ ආකාරයටම, අත්පත් කරගනු ලබන්නා පූර්ව ගැප් ප්‍රකාරව SLFRS වලට සංක්‍රාන්ති වූ දිනයේදී පැවතුනු අසම්භාව්‍ය වගකීමක්, හඳුනාගෙන නැත්නම්, LKAS 37 *ප්‍රතිපාදන, අසම්භාව්‍ය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්* ප්‍රමිතියෙන් එය අත්පත් කරගැනීමට භාජනයවන්නාගේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනා ගැනීම තහනම් කර නොමැතිනම්, අත්පත් කරගනු ලබන්නා ඒ අසම්භාව්‍ය වගකීම එදිනට හඳුනාගත යුතුයි. ප්‍රතිවිරුද්ධ ලෙස පූර්ව ගැප් ප්‍රකාර එම වත්කම හෝ වගකීම කීර්තිනාමයේ අන්තර්ගත වී ඇති නමුත් SLFRS 3 යටතේ වෙන්ව හඳුනාගත හැකි නම්, එම වත්කම් හෝ වගකීම SLFRS වලින් එය අත්පත් කර ගැනීමට භාජනය වන්නාගේ මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගැනීම අවශ්‍ය නම මිස කීර්තිනාමයේම පවතී

(උ) ....

| |
|---|
| ඇ පරිශිෂ්ඨය තුල ඇ1, ඇ7, ඇ8(ආ) සහ ඇ9 සංශෝධනය කරයි. ඇ9 (අ) ඡේදය ඉවත් කරන අතර ඇ9(ආ)- ඇ9(ඉ) ඡේද අළුතින් එකතු කරයි. |

## වෙනත් SLFRSs වලින් නිදහස්වීම්

ඇ1 අස්තිත්වයක් පහත සඳහන් නිදහස් කිරීම් වලින් එකක් හෝ වැඩි ගණනක් උපයෝගී කරගැනීමට තෝරාගත හැකිය.

(අ) ....

(ඇ) කල්බදු (ඇ9 සහ ~~ඇ9(අ)~~ ඇ9(ආ) - ඇ9(ඉ));

....

## සලකනු ලබන පිරිවැය

...

ඇ7 ඇ5 සහ ඇ6 ඡේදයන්හි ඇති තෝරා ගැනීම් පහත සඳහන් දෑ සඳහාද යොදා ගත හැකිය.

(අ) ආයෝජන දේපළ, අස්තිත්වයක් LKAS 40 *ආයෝජන දේපළ* ප්‍රමිතියේ පිරිවැය ආකෘතිය භාවිතයට තෝරාගෙන ඇත්නම්; සහ

(අඅ) වත්කම පාවිච්චි කිරිමේ හිමිකම (SLFRS 16 *කල්බදු*); සහ

(ආ) .............

ඇ8(ආ) මෙහෙයුමවලදී අනුපාත නියමයන්ට යටත්ව භාවිතා කරන හෝ කලින් භාවිතා කළ දේපළ පිරියත, උපකරණ අයිතම, වත්කම පාවිච්චි කිරිමේ හිමිකම හෝ අස්පෘශ්‍ය වත්කම් සමහර අස්තිත්වයන් තබාගනී. SLFRSs අනුව ප්‍රාග්ධනය කිරීමට සුදුසුකම නොලබන නමුත් එවැනි වත්කම්වල ධාරණ අගයේ කලින් ගැප් යටතේ නිශ්චය කරන ලද අගයන් ඇතුලත් කළ හැකිය. මෙය අවස්ථාවක් නම්, පළමු වරට ව්‍යවහාර කරන්නා සලකනු ලබන පිරිවැය ලෙස SLFRSs වලට සංක්‍රාන්ති දිනයට එවැනි අයිතමයක කලින් ගැප් ධාරණ අගය භාවිතා කිරීමට තෝරා ගත හැකිය. අස්තිත්වයක් අයිතමයක මෙම නිදහස්වීම ව්‍යවහාර කරන්නේ නම්, එය සියළුම අයිතම වලට ව්‍යවහාර කිරීම අවශ්‍ය නොවේ. SLFRSs වලට සංක්‍රාන්ති වන දිනයට, අස්තිත්වයක් මෙම නිදහස්වීම භාවිතා කරන එක් එක් අයිතමවල හානිකරණය සඳහා LKAS 36 අනුව පරීක්ෂාව කලයුතුවේ. මෙම ඡේදයේ අරමුණ සඳහා භාණ්ඩ සහ සේවා සඳහා ගණුදෙනුකරුවන්ට අයකරන මිල පිහිටුවීමේ රාමුවක් විසින් සහ එම රාමුව මගින් මිල නියාමක ලෙස පාලනය සහ අනුමැතියට යටත්ව පාලනය වන්නේ නම්, මෙහෙයුම් මිල නියාමනයකට යටත් වේ (SLFRS 14 - *නියාමක කල්දමන ගිණුම්වල නිර්වචන* කර ඇති පරිදි)

## කල්බදු

ඇ9 ඉවත්කරන ලදී

සංක්‍රාන්ති දිනයට පැවැති සිද්ධි සහ සිදුවීම් පදනම් කරගෙන, කල්බදු වලින් සමන්විත ගිවිසුම්වලට SLFRS 16 හි 9-11 ඡේද ව්‍යවහාර කරමින්, එම ගිවිසුම් සංක්‍රාන්ති දිනට පවතින ගිවිසුම් කල්බදු වලින් සමන්විත ද යන්න මුල්වරට ව්‍යවහාර කරන්නෙක් තක්සේරු කළ හැකිය.

ඇ9අ ඉවත් කරන ලදී

ඇ9ආ කල්බදු වගකීම් සහ වත්කම් පාවිච්චි කිරිමේ හිමිකම හදුනාගන්නා කල්බදු ගැණුකරුවෙක් පළමුවරට ව්‍යවහාර කරන්නෙක් වන විට, සියළුම කල්බදු වලට පහත සඳහන් ප්‍රවේශය ව්‍යවහාර කළ හැකිය (ඇ9ඈ ඡේදයේ විස්තර කර ඇති ප්‍රායෝගික භාවිතයට යටත්ව).

(අ) SLFRSs වලට සංක්‍රාන්ති දිනයට කල්බදු වගකීමක් මනියි. කල්බදු ගැනුම්කරුවෙක් මෙම ප්‍රවේශය අනුගමනය කිරීමෙන් SLFRSs හි සංක්‍රාන්ති දිනයට කල්බදු ගැනුම්කරුගේ වර්ධන ණය අනුපාතිකය භාවිතයෙන් වට්ටම් කළ (ඇ 9 ඉ ඡේදය බලන්න) ඉතිරිව ඇති කල්බදු ගෙවීම්වල වර්තමාන අගයට (ඇ 9 ඉ ඡේදය බලන්න.) එම කල්බදු වගකීම මැනිය යුතුය.

(ආ) SLFRSs වල සංක්‍රාන්ති දිනයට වත්කම් පාවිච්චි කිරිමේ හිමිකමක් මනියි. පහත සඳහන් දෙකෙන් එකකින් කල්බදු ගැනුම්කරු වත්කම් පාවිච්චි කිරිමේ හිමිකම මැනීමට කල්බද්දෙන් කල්බද්ද මත පදනම් ව තෝරාගත යුතුවේ.

i. කල්බද්ද ආරම්භ කළ දින සිට SLFRS 16 ව්‍යවහාර කර තිබේනම්, නමුත් (ඇ9ඉ ඡේදය බලන්න) SLFRSs වලට සංක්‍රාන්ති වූ දිනයට කල්බදු ගැනුම්කරුගේ වර්ධක ණය අනුපාතිකය භාවිතයෙන් වට්ටම් කළ එහි ධාරණ අගය ලෙස.

ii. SLFRSs වල සංක්‍රාන්ති දිනයට පෙර වහාම මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගත් කල්බද්දට සම්බන්ධ ඕනෑම උපචිත හෝ කලින් ගෙවූ ගෙවීම්වල ප්‍රමාණය මගින් ගලපන ලද කල්බදු වගකීමට සමාන අගයක්.

(ඇ) SLFRSs වලට සංක්‍රාන්ති දිනට වත්කම් පාවිච්චි කිරිමේ හිමිකමට LKAS 36 ව්‍යවහාර කිරීම.

ඇ9ඇ ඇ 9 (ආ) ඡේදයේ අවශ්‍යතාවයන් එසේ තිබියදී, පළමුවරට ව්‍යවහාර කරන කල්බදු ගැනුම්කරුවෙක් LKAS 40 හි ආයෝජන දේපළ නිර්වචනය ඉෂ්ටවන කල්බදු සඳහා SLFRS s වලට සංක්‍රාන්ති වූ දිනයට සාධාරණ අගයට වත්කම් පාවිච්චි කිරිමේ හිමිකම මනිනු ලබන අතර, SLFRSs වලට සංක්‍රාන්ති වූ දිනයේ සිට LKAS 40 හි සාධාරණ වටිනාකම් ආකෘතිය භාවිතයෙන් එම වත්කම් මනිනු ලැබේ.

ඇ9ඈ පළමුවරට ව්‍යවහාර කරන කල්බදු ගැනුම්කරුවෙක් කල්බද්ද කල්බද්දට පදනම් කරගෙන SLFRSs වලට සංක්‍රාන්ති වූ දිනට පහත සඳහන් එකක් හෝ ඊට වැඩියෙන් යොදා ගැනීමට හැකිය.

(අ) සාධාරණව සමාන ලක්ෂණ සහිත කල්බද කළඹයකට තනි වට්ටම් අනුපාතිකයක් ව්‍යවහාර කිරීම (උදාහරණ ලෙස සමාන ආර්ථික පරිසරයක් තුල සමාන වූ පාදක වූ වත්කමක පන්තියක් සඳහා ඉතිරිව ඇති සමාන කල්බදු වාරයක්).

(ආ) SLFRs වලට සංක්‍රාන්ති වූ දිනයේ සිට මාස 12 ඇතුලත අවසන් වන කල්බදු වාරයක කල්බද්දට (ඇ9ඉ බලන්න) ඇ9ආ ඡේදයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර නොකිරීමට තෝරාගැනීම ඒ වෙනුවට SLFRS 16 හි 6 ඡේදයට අනුව ගිණුම්ගත කළ කෙටිකාලීන කල්බදු වූයේ නම් එම කල්බදු ලෙසට අස්තිත්වයක් ගිණුම්ගත කළයුතුයි. (හෙළිදරවු කිරීමේ තොරතුරු ඇතුලත්ව)

(ඇ) අඩු වටිනාකමකින් යුක්ත පාදක වූ වත්කමක කල්බදුවලට ( SLFRS 16හි ආ3 - ආ8 ඡේදවල විස්තර කර ඇති පරිදි) ඇ9 ආ ඡේදයේ අවශ්‍යතාවයන් ව්‍යවහාර නොකිරීමට තෝරාගැනීම. ඒ වෙනුවට අස්තිත්වයක් SLFRS 16 හි 6 වැනි ඡේදයට අනුව එම කල්බදු (තොරතුරුවල හෙළිදරවු කිරීම ඇතුළත්ව) ගිණුම්ගත කළයුතුයි.

(ඈ) SLFRSs වලට සංක්‍රාන්ති වූ දිනයට වත්කම පාවිච්චි කිරිමේ හිමිකම මැනීමෙන් සිට මූලික සෘජු පිරිවැය (ඇ9 ඉ ඡේදය බලන්න) බැහැර කිරීම.

(ඉ) ගිවිසුම, කල්බද්ද දීර්ඝ කිරීමට හෝ අවසන් කිරීමට විකල්ප වලින් සමන්විත නම් කල්බදු වාරය නිශ්චය කිරීම වැනි පසුදැක්ම භාවිතා කිරීම.

ඇ9ඉ කල්බදු ගෙවීම්, කල්බදු ගැනුම්කරු, කල්බදු ගැනුම්කරුගේ වර්ධක ණය අනුපාතිකය, කල්බද්දේ ආරම්භක දිනය, මූලික සෘජු පිරිවැය සහ කල්බදු වාරය SLFRS 16 හි නිර්වචිත පද වන අතර මෙම ප්‍රමිතියේද එම තේරුමම භාවිතා කරයි.

## SLFRS 3 - ව්‍යාපාර සංයෝජන

14 සහ 17 ඡේද සංශෝධන කරන අතර 28අ සහ 28ආ ඡේද සහ ඒ සම්බන්ධ සිරස්තල සහ 64ක ඡේදය අළුතින් එකතු කරයි.

*හඳුනාගැනීමේ කොන්දේසි*

...

14 ~~ආ28 - ආ40~~ ආ31- ආ40 ඡේද ~~මෙහෙයුම් කල්බදු සහ~~ අස්පෘශ්‍ය වත්කම් හඳුනාගැනීම පිළිබඳ උපදේශ සපයයි. 22-28 ආ ඡේදවල හඳුනාගත හැකි වත්කම් සහ වගකීම් වර්ග සඳහන් කර ඇති අතර මෙම SLFRS හඳුනා ගැනීමේ මූලධර්ම සහ කොන්දේසිවල සීමිත ව්‍යතිරේක සලස්වන අයිතම එහි ඇතුලත් වේ.

*ව්‍යාපාර සංයෝජනයකදී, අත්පත්කරගත් හඳුනාගත හැකි වත්කම් සහ පවරාගත් වගකීම් වර්ගීකරණය හෝ නම් කිරීම.*

17 මෙම SLFRS 15 වැනි ඡේදයේ සඳහන් මූලධර්ම වලට ව්‍යතිරේක දෙකක් සපයයි.

(අ) ~~LKAS 17~~ SLFRS 16 කල්බදු ප්‍රකාරව අත්පත් කරගැනීමට භාජනය වන කල්බදු දීමනාකරුගේ කල්බදු ගිවිසුමක් මෙහෙයුම් කල්බද්ද හෝ මූල්‍ය කල්බද්ද ක් ලෙස වර්ගීකරණය

(ආ) .....

**අත්පත් කරගැනීමට භාජනය වන්නා කල්බදු ගැනුම්කරු වන කල්බදු**

28අ අත්පත්කර ගැනීමට භාජනය වන්නා කල්බදු ගැනුම්කරු වන හඳුනාගත් කල්බදු සඳහා SLFRS 16 ට අනුව වත්කම පාවිච්චි කිරීමේ හිමිකම සහ කල්බදු වගකීම් අත්පත් කරගන්නා හඳුනාගත යුතු වේ. පහත සඳහන් වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම සහ කල්බදු වගකීම හඳුනා ගැනීමට, අත්පත් කර ගන්නාට අවශ්‍ය නොවේ.

(අ) අත්පත් කරගත් දිනයේ සිට මාස 12 ක් ඇතුලත අවසන් වන කල්බදුවාරය සහිත කල්බදු (SLFRS 16 හි නිර්වචන කල) ;හෝ

(ආ) අඩු වටිනාකමකින් යුක්ත පාදක වූ වත්කමේ කල්බදු සඳහා (SLFRs 16 හි ආ3- ආ8 ඡේදවල විස්තර කර ඇති පරිදි).

28ආ අත්පත් කරගත් දිනට අත්පත් කරගත් කල්බද්ද අළුත් කල්බද්දක් වූයේ නම්, කල්බදු වගකීම ඉතිරිව ඇති කල්බදු ගෙවීම් වල වර්තමාන අගයට අත්පත් කරගන්නා මැනිය යුතුවේ (SLFRS 16 හි විස්තර කර පරිදි). වෙළෙඳපොල නියමයන් සමඟ සැසඳූ විට කල්බද්ද වාසිදායක හෝ අවාසිදායක නියමයන් පිළිබිඹුවීමට ගලපන ලද කල්බදු වගකීම ලෙස එකම අගයට වත්කම පාවිච්චි කිරීමේ හිමිකම අත්පත්කරගන්නා මැනිය යුතුවේ.

## බලපැවැත්වෙන දිනය

.....

64ක 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 හි, 14, 17 ආ32 සහ ආ 42ඡේද සංශෝධනය කළ අතර ආ28 -ආ30 ඡේද සහ ඒ සම්බන්ධ සිරස්තල සමඟ ඉවත් කරන ලදී. 28අ - 28ආ ඡේද සහ ඒ සම්බන්ධ සිරස්තල අළුතින් එකතු කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධන ව්‍යවහාර කළයුතු වේ.

ආ පරිශිෂ්ඨයේ තුල ආ28 - ආ30 ඡේද ඒ සම්බන්ධ සිරස්තල සමඟ ඉවත්කරයි. ආ32 සහ ආ42 සංශෝධනය කරයි.

### ~~මෙහෙයුම් කල්බදු~~

ආ28 ඉවත්කරන ලදී

ආ29 ඉවත්කරන ලදී

ආ30 ඉවත්කරන ලදී

### අස්පෘශ්‍ය වත්කම්

...

ආ32 ගිවිසුම්ගත නීතිමය නිර්ණායක සපුරා ඇති අස්පෘශ්‍ය වත්කමක්, එම වත්කම අත්පත්කර ගැනීමට භාජනය වන්නාගෙන් හෝ වෙනත් අයිතිවාසිකම් හා බැඳීම්වලින් මාරු කළ හෝ වෙන්කළ නොහැකි වුවත් හඳුනාගත හැකිය.

උදාහරණ

(අ) ඉවත් කරන ලදී

(ආ) ....

### අත්පත්කර ගැනීමට භාජනය වන්නා කල්බදු දෙන්නා වන මෙහෙයුම් කල්බදු වලට යටත්වන වත්කම්

ආ42 අත්පත් කර ගැනීමට භාජනය වන්නා කල්බදු දෙන්නා වන මෙහෙයුම් කල්බද්දකට යටත් ගොඩනැගිල්ලක් හෝ ස්වාධිකාරය වැනි වත්කමක අත්පත් කරගත් දින සාධාරණ වටිනාකම මැනීමේදී, අත්පත්කරගන්නා කල්බදු ගිවිසුමේ කොන්දේසි සැලකිල්ලට ගත යුතුයි. ~~අත්පත්කර ගැනීමට භාජනය වන්නා කල්බදු ගැනුම්කරු වන විට 29 ඡේදයට අනුව~~ මෙහෙයුම් කල්බද්දේ කොන්දේසි වෙළෙඳපොල කොන්දේසි සමග සැසඳීමේදී වාසිදායක හෝ අවාසිදායක නම් අත්පත් කර ගන්නා වෙන් වූ වත්කමක් හෝ වගකීමක් ලෙස හඳුනා නොගනී.

## SLFRS 4 - *රක්ෂණ ගිවිසුම්*

| |
|---|
| SLFRS 15 මගින් සංශෝධනය කළ 4 වැනි ඡේදය සංශෝධනය කරන අතර 41එ ඡේදය අළුතින් එකතු කරන ලදී. |

### විෂයපථය

....

4 අස්තිත්වයක් මෙම SLFRS හි පහත දෑ සඳහා අදාල ව්‍යවහාර නොකළ යුතුයි.

(අ) .....

(ඇ) අනාගත භාවිතය හෝ භාවිතයට අයිතිය මත මූල්‍ය නොවන අයිතමයක අසම්භාව්‍ය වන ගිවිසුම්මය අයිතිවාසිකම් හෝ ගිවිසුම්මය බැඳීම් (උදාහරණ ලෙස සමහර බලපත්‍ර ගාස්තු, පුරස්කාර, ~~අසම්භාව්‍ය~~ විචල්‍ය කල්බදු ගෙවීම්, සහ සමාන අයිතම) එමෙන්ම ~~මූල්‍ය~~ කල්බද්දක අන්තර්ගත බදු ගැනුම්කරුගේ සහතික කළ අවශේෂ වටිනාකම (~~LKAS 17~~ SLFRS 16 කල්බදු, SLFRS 15 ගණුදෙනුකරුවන් සමඟ ගිවිසුම්වල අයහාරය සහ LKAS 38 අස්පෘශ්‍ය වත්කම් බලන්න).

(ඈ) .....

### බල පැවැත්වෙන දිනය සහ සංක්‍රාන්තිය

...

41එ <u>2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 හි 4 වැනි ඡේදය සංශෝදනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.</u>

## SLFRS 7 මූල්‍ය සාධන පත්‍ර - හෙළිදරවු කිරීම්

29 වැනි ඡේදය සංශෝධනය කරන අතර 44ඇඇ ඡේදය අළුතින් එකතු කරයි.

### සාධාරණ අගය

29 පහත සඳහන් සාධාරණ අගය හෙළිදරවු කිරීම් අවශ්‍ය නොවේ.

(අ) .....

(ආ) සක්‍රීය වෙළෙඳපොලක සර්වසම සාධන පත්‍රයක් සඳහා (එනම් පළමු මට්ටමේ යෙදවුමක්) මිල ප්‍රකාශිත වෙළෙඳපොළ මිලක් නොමැති ස්කන්ධ සාධනපත්‍ර ආයෝජනයක හෝ එලෙස සාධාරණ අගය විශ්වාසදායක ලෙස මැනිය නොහැකි නිසා LKAS 39 අනුව පිරිවැයට මනින ලද ස්කන්ධ සාධනපත්‍රයකට සම්බන්ධ කර ඇති ව්‍යුත්පන්න සඳහා; ~~හෝ~~

(ඇ) අභිමතානුසාරී සහභාගීවීමේ ගති ලක්ෂණ (SLFRS 4 හි විස්තර කර ඇති පරිදි ) අඩංගු ගිවිසුමක එම ගති ලක්ෂණයේ සාධාරණ අගය විශ්වාසදායක ලෙස මැනිය නොහැකි නම්; <u>හෝ</u>

<u>(ඈ) කල්බදු වගකීම් සඳහා</u>

## බලපැවැත්වන දිනය සහ සංක්‍රාන්තිය

...

<u>44ඇඇ 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 - *කල්බදු* , 29 සහ ආ11ඈ ඡේද සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධන ව්‍යවහාර කළයුතු වේ.</u>

ආ පරිශිෂ්ඨයේ ආ11ඈ ඡේදය සංශෝධනය කරයි.

### ප්‍රමාණාත්මක ද්‍රවශීලතා අවදානම් හෙළිදරවු කිරීම් (34 (අ) සහ 39 (අ) සහ ආ) ඡේද)

ආ11ඈ 39(අ) සහ (ආ) ඡේදවලින් නියම කළ පරිණතවීමේ විශ්ලේෂණයේ හෙළිදරවු කළ ගිවිසුම්ගත අගයන් යනු ගිවිසුම්ගත වට්ටම් නොකරන ලද මුදල් ප්‍රවාහයන්ය.

උදාහරණ

(අ) දළ මූල්‍ය කල්බදු බැඳීම්වල වගකීම් (මූල්‍ය ගාස්තු අඩු කිරීමට පෙර)

(ආ) ....

## SLFRS 9 මූල්‍ය සාධනපත්‍ර

2.1 ඡේදය සහ 5.5.15 ඡේදය සංශෝධනය කරන අතර 7.1.15 ඡේදය අළුතින් එකතු කරයි.

### 2 පරිච්ඡේදය විෂය පථය

**2.1 පහත සඳහන් දෑ හැර සියලුම අස්තිත්ව විසින් සියළුම වර්ගයේ මූල්‍ය සාධන පත්‍රවල මෙම ප්‍රමිතිය ව්‍යවහාර කළයුතු වේ.**

**(අ) ....**

**(ආ) ~~LKAS 17~~ SLFRS 16 කල්බදු ව්‍යවහාර කරන කල්බදු යටතේ අයිතිවාසිකම් සහ බැඳීම්. කෙසේ නමුත්,**

**i.** **මෙම ප්‍රමිතියේ හඳුනා නොගැනිම සහ හානිකරණ අවශ්‍යතාවයන්ට යටත්ව කල්බදු දීමනාකරුවෙක් විසින් හඳුනාගත් ගෙවියයුතු මූල්‍ය කල්බද්ද (එනම් මූල්‍ය කල්බදුවල ශුද්ධ ආයෝජනයට) සහ ලැබිය යුතු මෙහෙයුම් කල්බද්ද;**

**ii.** **මෙම ප්‍රමිතියේ 3.3.1 ඡේදයේ හඳුනානොගැනීමේ අවශ්‍යතාවයන්ට යටත්ව කල්බදු ගැනුම්කරුවෙක් විසින් හඳුනාගත් ගෙවියයුතු මූල්‍ය කල්බදු වගකීම්; සහ**

**iii.** **මෙම ප්‍රමිතියේ නිහිත ව්‍යුත්පන්න අවශ්‍යතාවයන්ට යටත්වන කල්බද්දේ නිහිත ව්‍යුත්පන්නයන්.**

(ඇ) **…**

## වෙළෙඳ ලැබිය යුතු මුදල්, ගිවිසුම් වත්කම් සහ ලැබියයුතු කල්බදු සඳහා සරල කළ ප්‍රවේශය

**5.5.15** **5.5.3 සහ 5.5.5 ඡේද නොසලකා, පහත සඳහන් දෑ සඳහා අස්තිත්වයක් අපේක්ෂිත ණය අලාභ ජීවිතකාලයට සමානවන ප්‍රමාණයකට, අලාභ ප්‍රතිපාදනය නිතරම මැනිය යුතුවේ.**

**(අ)** **...**

**(ආ)** **අපේක්ෂිත ණය අලාභ ජීවිත කාලයට සමාන ප්‍රමාණයකට අලාභ ප්‍රතිපාදනය මැනීමට ගිණුම් ප්‍රතිපත්තිය අස්තිත්වය තෝරා ගන්නේ නම්, ~~LKAS 17~~ SLFRS 16 හි විෂය පථයේ ඇතුලත් ගණුදෙනුවල ප්‍රතිඵල තුලින් ලැබියයුතු කල්බදු. මෙම ගිණුම්කරන ප්‍රතිපත්තිය, සියළුම ලැබියයුතු කල්බදු වලට ව්‍යවහාර කරන නමුත් ලැබියයුතු මූල්‍ය සහ මෙහෙයුම් කල්බදු වලට වෙනමම ව්‍යවහාර කළහැකිය.**

**...**

## 7.1 බලපැවැත්වෙන දිනය

.....

7.1.5 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 , 2.1, 5.5.15, ආ4.3.8, ආ5.5.34 සහ ආ5.5.46 ඡේද සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධන ව්‍යවහාර කළයුතු වේ.

ආ. පරිශිෂ්ඨයේ, ආ 4.3.8, ආ5.5 34 සහ ආ 5.5 46 ඡේද සංශෝධනය කරයි

## නිහිත ව්‍යුත්පන්න (4.3 කොටස)

**....**

ආ.4.3.8 ආර්ථික ලක්ෂණ සහ නිහිත ව්‍යුත්පන්නවල අවදානම් පහත සඳහන් උදාහරණවල සත්කාරක ගිවිසුමේ අවදානම සහ ආර්ථික ලක්ෂණ සමඟ ඉතා සමීපව සම්බන්ධ වේ. මෙම උදාහරණවලදී අස්තිත්වයක් සත්කාරක ගිවිසුමකින් වෙන්ව නිහිත ව්‍යුත්පන්න සඳහා ගිණුම්ගත නොකරයි.

(අ) ....

(ඊ) නිහිත ව්‍යුත්පන්නය, (i) පාරිභෝගික මිල දර්ශකයකට කල්බදු ගෙවීම් වල දර්ශකයක් වැනි උද්ධමනයට සම්බන්ධ දර්ශකයක් (අස්තිත්වයේ තමන්ගේ ආර්ථික පරිසරය තුල උද්ධමනයට සම්බන්ධ වන දර්ශකය සහ තෝලනය නොවන සැපයූ කල්බද්ද ) (ii) විකුණුම් මත පදනම් වන ~~අසම්භාව්‍ය තුලිය~~ විචල්‍ය කල්බදු ගෙවීම් හෝ (iii) ~~අසම්භාව්‍ය තුලිය~~ විචල්‍ය පොලී අනුපාතික මත පදනම් වන විචල්‍ය කල්බදු ගෙවීම් නම්, සත්කාර කල්බදු ගිවිසුමක් තුල නිහිත ව්‍යුත්පන්නයක් සත්කාරක ගිවිසුමකට වඩාත් සමීපව සම්බන්ධ වේ.

(උ) ...

## අපේක්ෂිත ණය අලාභ

.....

ආ5.5.34 ලැබිය යුතු කල්බද්දක් සඳහා අලාභ ප්‍රතිපාදනයක් මැනීමේදී අපේක්ෂිත ණය අලාභ නිශ්චය කිරීමට භාවිතා කරන මුදල් ප්‍රවාහ ~~LKAS17~~ SLFRS 16 කල්බදු අනුව ලැබිය යුතු කල්බදු මැනීමේදී භාවිතා කරන මුදල් ප්‍රවාහ සමග ඒකාකාරී විය යුතුය.

.....

### මුදලේ කාල වටිනාකම

....

ආ5.5.46 ලැබිය යුතු කල්බද්ද මත අපේක්ෂිත ණය අලාභ SLFRS 16 ~~LKAS 17~~ අනුව ලැබිය යුතු කල්බදු මැනීමේදී භාවිතා කළ වට්ටම් අනුපාතිකයම යොදාගෙන වට්ටම් කළයුතු වේ.

....

## SLFRS 13 සාධාරණ වටිනාකම මැනීම

6 වැනි ඡේදය සංශෝධනය කරයි.

### විෂය පථය

...

6 පහත සඳහන් දෑ වලට මෙම ප්‍රමිතියේ මැනීමේ සහ හෙළිදරවු කිරීමේ අවශ්‍යතාවයන් ව්‍යවහාර කරනු නොලබයි.

(අ) ...

(ආ) SLFRS 16 - කල්බදු අනුව ගිණුම්ගත කළ කල්බදු ගණුදෙණු ;සහ

(ඇ) ...

ඇ පරිශිෂ්ඨයේ ඇ6 ඡේදය එකතු කරන ලදී.

### බලපැවැත්වෙන දිනය සහ සංක්‍රාන්තිය

...

ඇ6 2016 ජනවාරි මස නිකුත් කළ SLFRS 16 *කල්බදුනි* 6 වැනි ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

## SLFRS 15 ගණුදෙනුකරුවන් සමඟ ඇතිකර ගත් ගිවිසුම් වලින් අයභාරය

5 සහ 97 ඡේද සංශෝධනය කරයි.

### විෂය පථය

5 අස්තිත්වයක් විසින් පහත සඳහන් දෑ හැර, ගණුදෙනකරුවන් සමඟ වන සියළුම ගිවිසුම් වලට මෙම ප්‍රමිතිය යොදාගත යුතුවේ.

(අ) ~~LKAS 17~~ SLFRS 16 කල්බදු විෂය පථයේ ඇතුලත් කල්බදු ගිවිසුම්

(ආ) ....

### ගිවිසුමක් සම්පූර්ණ කිරීමට පිරිවැය

...

97 ගිවිසුමකට (විශේෂයෙන් නියම කළ කලින් අපේක්ෂා කළ ගිවිසුමක් හෝ) ඍජුවම සම්බන්ධ වන පිරිවැයට පහත සඳහන් ඕනෑම දෙයක් ඇතුලත් වේ.

(අ) ...

(ඇ) ගිවිසුමකට හෝ ගිවිසුම් ක්‍රියාකාරකම්වලට ඍජුවම සම්බන්ධ පිරිවැය බෙදාහැරීම (උදාහරණ ලෙස ගිවිසුම් කළමනාකරණ සහ සුපරීක්ෂාවේ පිරිවැය, රක්ෂණය සහ උපකරණවල ක්ෂය, ගිවිසුම සම්පූර්ණ කිරීමේදී භාවිතා කරන උපකරණ සහ වත්කම පාවිච්චි කිරීමේ හිමිකම. )

(ඇ) ...

| |
|---|
| ආ පරිශිෂ්ඨයෙහි ආ 66 සහ ආ70 ඡේද සංශෝධනය කරයි. |

## ඉදිරි හෝ ඉල්ලුම් විකල්පයක්

ආ66 අස්තිත්වයකට වත්කම නැවත මිලදී ගැනීමට බැඳීමක් හෝ හිමිකමක් තිබේ නම්, (ඉදිරි හෝ ඉල්ලුම් විකල්පයක්) ගණුදෙනුකරුවෙක් වත්කම භෞතිකව භුක්තිව තිබුනා වුවත්, ගණුදෙනුකරුට වත්කම භාවිතයට මගපෙන්වීමට ඇති හැකියාව සීමාසහිත සහ සියළු ඉතිරිව ඇති ප්‍රතිලාභ බොහෝදුරට ලබාගැනිම නිසා, ගණුදෙනුකරු වත්කමේ පාලනය ලබා නොගනී. ඒ නිසාවෙන් පහත සඳහන් ඒවායින් එකක් ලෙස අස්තිත්වයක් ගිවිසුම සඳහා ගිණුම්ගත කළයුතු වේ.

(අ) ගිවිසුම විකුණා ප්‍රතිකල්බදුකරන ගණුදෙනුවක කොටසක් නම් හැර, අස්තිත්වය වත්කමේ මුල් විකුණුම්මිලට වඩා අඩුවෙන් වටිනාකමක් සඳහා වත්කම නැවත මිලදී ගැනීම පුළුවන් හෝ කළයුතු නම්, කල්බද්දක් ~~LKAS 17~~ SLFRS 16 ප්‍රකාරව ගිණුම්ගත කළයුතුයි. ගිවිසුම විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙනුවක කොටසක් නම්, අස්තිත්වය වත්කම හඳුනාගැනීම දිගටම කළයුතු අතර ගණුදෙනුකරුගෙන් ලැබෙන ඕනෑම ප්‍රතිෂ්ඨාවක් සඳහා මූල්‍ය වගකීමක් හඳුනාගත යුතුයි. අස්තිත්වය SLFRS 9ට අනුව මූල්‍ය වගකීම සඳහා ගිණුම්ගත කළයුතුයි; නැතහොත්

(ආ) ...

## යෙදවුම් විකල්පයක්

ආ70 අස්තිත්වයක් වත්කමක මුල් විකුණුම්මිලට වඩා අඩුවෙන් මිලකට ගණුදෙනුකරුවෙකුගේ ඉල්ලීමකට (යෙදවුම් විකල්පයක්) නැවත මිලදී ගැනීමට බැඳීමක් තිබේනම්, එම අයිතිය ක්‍රියාත්මක කිරීමට වැදගත් ආර්ථික පෙළඹවීමක් ගණුදෙනුකරුවෙකුට තිබේදැයි ගිවිසුමක ආරම්භයේදී අස්තිත්වය සලකා බැලිය යුතුවේ. කාලපරිච්ඡේදයක් සඳහා විශේෂයෙන් නියම කළ වත්කමක් පාවිච්චි කිරීමේ හිමිකම සඳහා අස්තිත්වයක ප්‍රතිෂ්ඨාව කාර්‍යක්ෂම ගෙවීමෙන් ගණුදෙනුකරුවන් තුල අයිතිය ගණුදෙනුකරුවන්ගේ ක්‍රියාත්මක කිරීමේ ප්‍රතිඵල දෙයි. එමනිසා, ගණුදෙනුකරුට එම අයිතිය ක්‍රියාත්මක කිරීමෙන් සැලකිය යුතු ආර්ථික පෙළඹවීමක් තිබේ නම්, අස්තිත්වය ගිවිසුම විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙනුවේ කොටසක් නම් මිස ගිවිසුම ~~LKAS 17~~ SLFRS 16 ප්‍රකාරව කල්බද්දක් වශයෙන් ගිණුම්ගත කළ යුතුවේ. ගිවිසුම විකුණා ප්‍රතිකල්බදුකරණ ගණුදෙනුවක කොටසක් නම්, අස්තිත්වය වත්කමක් ලෙස තවදුරටත් හඳුනාගත යුතු අතර ගණුදෙනුකරුගෙන් ලැබුන ඕනෑම ප්‍රතිෂ්ඨාවක් සඳහා මූල්‍ය වගකීමක් හඳුනාගත යුතුයි. අස්තිත්වය මූල්‍ය වගකීම සඳහා SLFRs 9 අනුව ගිණුම්ගත කළයුතු වේ.

....

| |
|---|
| ඇ පරිශිෂ්ඨය තුල ඇ1අ ඡේදය එකතු කරයි. |

## බලපැවැත්වෙන දිනය

....

ඇ1අ 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 *කල්බදුහි* 5, 97, ආ 66 සහ ආ 70 ඡේද සංශෝධන කර ඇත. අස්තිත්වයක් SLFRs 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධන ව්‍යවහාර කළයුතු වේ.

## LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| |
|---|
| 123 ඡේදය සංශෝධනය කරන අතර 139ල ඡේදය අළුතින් එකතු කරයි. |

### ගිණුම්කරණ ප්‍රතිපත්ති හෙළිදරව් කිරීම

....

123 අස්තිත්වයේ ගිණුම්කරන ප්‍රතිපත්ති භාවිතා කිරීමේ ක්‍රියාවලියේදී, මූල්‍ය ප්‍රකාශනවල හඳුනාගත් ප්‍රමාණයන් කෙරෙහි වඩාත් සැලකිය යුතු බලපෑමක් ඇති කරන ඇස්තමේන්තු කිරීම් අදාල වන ඒවා හැර, කළමණාකරණය විසින් විවිධ විනිශ්චයන් සිදුකරයි. උදාහරණ ලෙස පහත කරුණු නිශ්චය කිරීමේදී කළමනාකරණය විසින් විනිශ්චයන් සිදුකරයි.

(අ) ...

(ආ) කල්බදු වලට යටත්වන ~~කල්බදු~~ වත්කම්වල කල්බදු දීමනාකරුවන් සඳහා මූල්‍ය වත්කම්වල අයිතියේ සියළුම සැලකිය යුතු අවදානම් සහ ප්‍රතිලාභ අනෙකුත් අස්තිත්වයන්ට සෑහෙන තරමින් මාරුවනුයේ කවදාද යන්න; සහ

(ඇ) ...

## සංක්‍රාන්තිය සහ බලපැවැත්වෙන දිනය

139ල 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 කල්බදුවල , 123 ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධන ව්‍යවහාර කළයුතු වේ.

# LKAS 2 *තොග*

12 වන ඡේදය සංශෝධනය කරන අතර 40උ ඡේදය අළුතින් එකතු කරයි.

### පර්වර්තන පිරිවැය

12 තොගවල පර්වර්තන පිරිවැයට ඍජු ශ්‍රමය වැනි නිශ්පාදන ඒකකවලට ඍජුවම සම්බන්ධ වන පිරිවැය ඇතුලත් වේ. නිමිභාණ්ඩ වලට ද්‍රව්‍ය පර්වර්තනය කිරීමේදී දරනු ලබන ස්ථාවර සහ විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය පිරිවැයවල ක්‍රමානුකූල වෙන්කිරීමක්ද එයට ඇතුලත් වේ. ස්ථාවර නිෂ්පාදන පොදුකාර්ය යනු ක්‍ෂයවීම්, කර්මාන්තශාලා ගොඩනැගිලිවල නඩත්තු කිරීම, උපකරණ ~~සහ~~ නිෂ්පාදන ක්‍රියාවලියේදී යොදාගන්නා වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම සහ කර්මාන්තශාලා කළමනාකරණය සහ පරිපාලන පිරිවැය වැනි නිෂ්පාදන පරිමාවට සාපේක්ෂව වෙනස්නොවී පවතින නිෂ්පාදන වක්‍ර පිරිවැය වේ. විචල්‍ය නිෂ්පාදන පොදුකාර්ය යනු වක්‍රද්‍රව්‍ය සහ වක්‍ර ශ්‍රමය වැනි නිෂ්පාදන පරිමාව සමඟ ඍජුව හෝ ආසන්න වශයෙන් ඍජුවම වෙනස්වන වක්‍ර නිෂ්පාදන පිරිවැය වේ.

...

## බලපැවැත්වෙන දිනය

...

40උ 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 කල්බදු හි 12 ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFES 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

# LKAS 7 *මුදල් ප්‍රවාහ ප්‍රකාශය*

17 සහ 44 ඡේද සංශෝධනය කරන අතර 59 ඡේදය අළුතින් එකතු කරයි.

### මූල්‍ය ක්‍රියාකාරකම්

17 අස්තිත්වයකට ප්‍රාග්ධනය සැපයූ පුද්ගලයන් විසින් අනාගත මුදල් ප්‍රවාහයන් මත කළ හැකි හිමිකම් පුරෝකථනය කිරීමේදී එය ප්‍රයෝජනවත් වන නිසා මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ඇතිවන මුදල් ප්‍රවාහයන් වෙනමම හෙළිදරව් කිරීම වැදගත් වේ. මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ඇතිවන මුදල් ප්‍රවාහයන්ට උදාහරණ වන්නේ;

(අ) ....

(ඉ) ~~මූල්‍ය~~ කල්බද්දකට අදාලවන හිඟව තිබෙන වගකීම අඩු කිරීම සඳහා බදු ගැනුම්කරු විසින් කරන මුදල් ගෙවීම්.

## මුදල් නොවන ගණුදෙණු

....

44 බොහෝ ආයෝජන සහ මූල්‍ය ක්‍රියාකාරකම් වලින් ආයතනයක ප්‍රාග්ධන හා වත්කම් ව්‍යුහයට බලපෑම් කළද, ප්‍රවර්තන මුදල් ප්‍රවාහයන් මත සෘජු බලපෑමක් ඇති නොකරයි. මුදල් නොවන ගණුදෙනු ප්‍රවර්තන කාලපරිච්ඡේදයේ මුදල් ප්‍රවාහයන්ට මැදිහත් නොවන නිසා එම අයිතමයන් මුදල් ප්‍රවාහ ප්‍රකාශයෙන් ඉවත් කිරීම, මුදල් ප්‍රවාහ ප්‍රකාශයක අරමුණු හා අනුකුල වේ. මුදල් නොවන ගණුදෙනු සඳහා උදාහරණ වන්නේ;

(අ) සෘජුවම සම්බන්ධවන වගකීම් පවරාගනිමින් හෝ ~~මූල්‍ය~~ කල්බද්දක් මඟින් අත්පත් කර ගන්නා වත්කම්;

(ආ) .....

## බලපැවැත්වෙන දිනය

......

59 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 *කල්බදු* , 17 සහ 44 ඡේද සංශෝධන කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධන ව්‍යවහාර කළයුතු වේ.

# LKAS 12 - ආදායම් බදු

SLFRs 9 - *මූල්‍ය සාධන පත්‍ර* අනුගමනය නොකරන අස්තිත්වයක් සඳහා 20 ඡේදය සංශෝධනය කරයි.

### සාධාරණ අගයට ධාරණය කරන වත්කම්

20 ඇතැම් වත්කම් සාධාරණ අගයට ධාරණය කිරීමට හෝ ප්‍රත්‍යාගණනය කිරීම් සඳහා SLFRS මගින් අවසර දෙයි. නැතහොත් අවශ්‍ය කෙරෙයි. (උදාහරණ ලෙස LKAS 16 *දේපළ පිරියත සහ උපකරණ,* LKAS 38 අස්පෘශ්‍ය වත්කම්, LKAS 39 මූල්‍ය සාධනපත්‍ර - හඳුනාගැනීම සහ මැනීම, LKAS 40 *ආයෝජන දේපළ* සහ SLFRS 16 *කල්බදු*). සමහර බල ප්‍රදේශවල ප්‍රත්‍යාගණනය හෝ වත්කම්වල සාධාරණ අගය දක්වනු ලබන වෙනත් නැවත ප්‍රකාශ කිරීම් ප්‍රවර්ථන කාලපරිච්ඡේදයේ බදුවන ලාභයට (බදු අලාභය) බලපායි. එහි ප්‍රතිඵලයක් ලෙස වත්කමේ බදු පදනම ගලපනු ලබන අතර තාවකාලික වෙනස්කම් පැන නොනගී. වෙනත් බල ප්‍රදේශවල ප්‍රත්‍යාගණන හෝ වත්කම් නැවත ප්‍රකාශ කිරීම් ප්‍රත්‍යාගණනය කළ හෝ නැවත ප්‍රකාශකළ කාලපරිච්ඡේදයේ බදුවන ලාභයට බලානොපාන අතර ඒ නිසා වත්කමේ බදු පදනම ගලපනු නොලැබේ. මෙම තත්වය, එසේවුවද ධාරණ අගය අනාගතයේදී අයකර ගැනීමේදී අස්තිත්වයට බද්දට යටත් ආර්ථික ප්‍රතිලාභ ප්‍රවාහයක් ප්‍රතිලාභය වන අතර, ආදායම් බදු අරමුණ සඳහා අයකර ගනු ලබන ප්‍රමාණය ඒවායේ ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණයෙන් වෙනස් වෙනු ඇත. ප්‍රත්‍යාගණනය කළ වත්කමක ධාරණ අගය හා එහි බදු පදනම අතර වෙනස තාවකාලික වෙනසක් වන අතර එයින් විලම්භිත බදු වගකීමක් හෝ වත්කමක් පැනනගී.

(අ) ....

SLFRS 9 *මූල්‍ය සාධනපත්‍ර* අනුගමනය කරන අස්තිත්වයක් සඳහා 20 ඡේදය සංශෝධනය කරයි.

### සාධාරණ අගයට ධාරණය කරන වත්කම්

20 ඇතැම් වත්කම් සාධාරණ අගයට ධාරණය කිරීමට හෝ ප්‍රත්‍යාගණනය කිරීම් සඳහා SLFRS මගින් අවසර දෙයි. නැතහොත් අවශ්‍ය කෙරෙයි. (උදාහරණ ලෙස LKAS 16 *දේපළ පිරියත සහ උපකරණ* LKAS 38 අස්පෘශ්‍ය වත්කම්, LKAS 39 මූල්‍ය සාධනපත්‍ර - හඳුනාගැනීම සහ මැනීම, LKAS 40 - *ආයෝජන දේපළ* සහ SLFRS 16 *කල්බදු*) සමහර බල ප්‍රදේශවල ප්‍රත්‍යාගණනය හෝ වත්කම්වල සාධාරණ අගය දක්වනු ලබන වෙනත් නැවත ප්‍රකාශ කිරීම් ප්‍රවර්ථන කාලපරිච්ඡේදයේ බදුවන ලාභයට (බදුඅලාභය) බලපායි. එහි ප්‍රතිඵලයක් ලෙස වත්කමේ බදු පදනම ගලපනු ලබන අතර තාවකාලික වෙනස්කම් පැන නොනගී. වෙනත් බල ප්‍රදේශවල ප්‍රත්‍යාගණන හෝ වත්කම් නැවත ප්‍රකාශ කිරීම් ප්‍රත්‍යාගණනය කළ හෝ නැවත ප්‍රකාශ කළ කාලපරිච්ඡේදයේ බදුවන ලාභයට බලානොපාන අතර ඒ නිසා වත්කමේ බදු පදනම ගලපනු නොලැබේ. මෙම තත්වය, එසේ වුවද ධාරණ අගය අනාගතයේදී අයකර ගැනීමේදී අස්තිත්වයට බද්දට යටත් ආර්ථික ප්‍රතිලාභ ප්‍රවාහයක් ප්‍රතිලාභය වන අතර ආදායම්

බදු අරමුණු සඳහා අයකර ගනු ලබන ප්‍රමාණය ඒවායේ ආර්ථික ප්‍රතිලාභ ප්‍රමාණයෙන් වෙනස් වෙනු ඇත. ප්‍රත්‍යාගණනය කළ වත්කමක ධාරණ අගය හා එහි බදු පදනම අතර වෙනස තාවකාලික වෙනසක් වන අතර එයින් විලම්භිත බදු වගකීමක් හෝ වත්කමක් පැනනගී.

(අ) ....

| |
|---|
| 98උ ඡේදය එකතු කරයි. |

## බලපැවැත්වෙන දිනය

....

98උ 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 කල්බදු , 20 ඡේදය සංශෝධන කර ඇත. SLFRS 16 ව්‍යවහාර කරන විට, අස්තිත්වයක් එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

# LKAS 16 දේපළ, පිරියත සහ උපකරණ

| |
|---|
| 4 සහ 27 ඡේද ඉවත් කරන අතර 5, 10, 44 සහ 68 ඡේද සංශෝධනය කරයි. SLFRS 15 මගින් සංශෝධනය කළ 65 වැනි ඡේදය සංශෝධනය කරන අතර 81L ඡේදය අළුතින් එකතු කරයි. |

## විෂය පථය

....

4 [ඉවත් කරන ලදී]

5 LKAS 40 *ආයෝජන දේපළ* ප්‍රකාරව පිරිවැය ආකෘතිය භාවිතා කරන අස්තිත්වයක් මෙම ප්‍රමිතියේදී පිරිවැය ආකෘතිය, අයිතිව ඇති ආයෝජන දේපළ සඳහා භාවිතා කළ හැකිය.

## හඳුනාගැනීම

....

10 අස්තිත්වයක් සියලු දේපළ හා පිරියත සහ උපකරණ සඳහා පිරිවැය, එම පිරිවැය දරණ අවස්ථාවකදී මෙම හඳුනාගැනීමේදී මූලධර්මය යටතේ අගය කරයි. මෙම පිරිවැයට දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් මුල්වරට අත්කර ගැනීමට හෝ තැනීමට වැය වූ පිරිවැය සහ පසුව එකතු කිරීම්, කොටස් නැවත ස්ථාපනය හෝ එයට සේවා සැපයීම ඇතුලත් වෙයි. වත්කම පාවිච්චි කිරිමේ හිමිකමේ ක්ෂයවීම් වැනි ඉදිකිරීමට, දේපළ පිරියත හෝ උපකරණ අයිතමයක් කොටසක් ප්‍රතිෂ්ඨාපනය කිරීමට එකතු කළ හෝ නඩත්තු කිරිමට භාවිතා කළ වත්කම්වල කල්බදු වලට සම්බන්ධ දැරූ පිරිවැය, දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක පිරිවැයේ ඇතුලත් වේ.

### පිරිවැය මැනීම

...

27. [ඉවත් කරන ලදී]

...

### ක්ෂයවීම්

...

44 අස්තිත්වයක් දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් සඳහා මුලින් හඳුනාගත් වටිනාකම එහි වැදගත් කොටස්වලට වෙන් කර ඒ එකිනෙක කොටස වෙන වෙනම ක්ෂය කරනු ඇත. උදාහරණයක් ලෙස ගුවන් යානයක් බඳ රාමුව හා ඇන්ජිම වෙන්ම ගෙන ක්ෂය කිරීම ~~අයිතිව තිබෙන හෝ මූල්‍ය කල්බද්දට යටත් වූ එකක් වුවද~~ යෝග්‍ය විය හැකිය. ඒ ආකාරයෙන්ම, අස්තිත්වයක් දේපළ, පිරියත සහ උපකරණ මෙහෙයුම් කල්බද්දකට යටත්ව පවරා ගත්තේ නම්, එහි කල්බදු දීමනාකරු ලෙස වෙළෙඳපොල කොන්දේසිවලට සාපේක්ෂව එම අයිතමයේ

පිළිබිඹුවන පිරිවැය කල්බදු කොන්දේසිවලට අනුරූපව වාසිදායක හෝ අවාසිදායක වීමට ඉඩ ඇතත් ඒ වෙනුවෙන් වෙනමම ප්‍රමාණයක් ක්ෂය කිරීම යෝග්‍ය විය හැකිය.

...

## හඳුනාගැනීම ඉවත් කිරීම

...

68 **දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් ඉවත් කිරීමේදී ඇතිවන ප්‍රතිලාභ හෝ අලාභ ඉවත් කරන අවස්ථාවේදී ලාභය හෝ අලාභයෙහි ඇතුලත් කරනු ලැබේ. (විකුණා කල්බද්දට ගැනීමේදී පදනම මත වෙනත් ආකාරයකට සැලකීම ~~LKAS 17~~ SLFRs 16 *කල්බදු* හි අවශ්‍ය නොකරන්නේ නම් හැර) ප්‍රතිලාභ අයභාරය ලෙස වර්ගීකරණය නොකළ යුතුයි.**

**...**

69 දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක් ඉවත්කිරීම් විවිධ ආකාරයට සිදුවිය හැකිය (උදාහරණ ලෙස විකිණීමෙන්, මූල්‍ය කල්බද්දකට ඇතුලත් වීමෙන් හෝ පරිත්‍යාග කිරීමෙන්). අයිතමයක් ඉවත් කිරීමේ දිනය යනු SLFRS 15 අනුව කාර්යසාධන බැඳීමක් සම්පූර්ණ වන බව නිශ්චය කිරීම සඳහා වන අවශ්‍යතාවයන් එය ලබාගන්නා එම අයිතමයේ පාලනය ගත් දිනයයි. විකුණා ප්‍රතිකල්බදුකරණයක් ඉවත් කිරීමේදී ~~LKAS 17~~ SLFRS 16 ව්‍යවහාර කරයි.

...

## බලපැවැත්වෙන දිනය

...

81L 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 , 4 සහ 27 ඡේද ඉවත් කළ අතර 5, 10, 44 සහ 68-69 ඡේද සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධන ව්‍යවහාර කළයුතු වේ.

# LKAS 21 *විදේශ විනිමය අනුපාතිකයන්හි වෙනස්වීම්වල බලපෑම්*

| 16 ඡේදය සංශෝධනය කරන අතර 60ණ ඡේදය අළුතින් එකතු කරයි. |
|---|

## මූල්‍ය අයිතමයන්

16 මූල්‍යමය අයිතමයක අත්‍යවශ්‍ය ලක්ෂණය වන්නේ නිශ්චිත හෝ නිශ්චය කළ හැකි ව්‍යවහාර මුදල් ඒකක සංඛ්‍යාවක් ලැබීමට (හෝ භාරදීමට ඇති බැඳීමක්) ඇති අයිතිය වේ. උදාහරණවලට මුදලින් ගෙවිය යුතු විශ්‍රාම සහ අනෙකුත් සේවක ප්‍රතිලාභ, මුදලින් පියවිය යුතුව ඇති ප්‍රතිපාදන ~~සහ~~ කල්බදු වගකීම් සහ වගකීම් ලෙස හඳුනාගන්නා මුදල් ලාභාංශ ඇතුලත් වේ. එමෙන්ම අස්තිත්වයේම ස්කන්ධ සාධනපත්‍ර විචල්‍ය සංඛ්‍යාවක් ලැබීමට (හෝ භාරදීමට ) ගිවිසුමක් හෝ විචල්‍ය වත්කම් ප්‍රමාණයක් එහි සාධරණ වටිනාකමලැබීමට (හෝ භාරදීමට), නිශ්චිත හෝ නිශ්චය කළ හැකි ව්‍යවහාර මුදල් ඒකක සංඛ්‍යාව මූල්‍ය අයිතමයක් වේ. ප්‍රතිලෝම වශයෙන් මූල්‍ය නොවන අයිතමයක විශේෂ ලක්ෂණය වන්නේ නිශ්චිත හෝ නිශ්චය කළ හැකි ව්‍යවහාර මුදල් ඒකක සංඛ්‍යාවක් ලැබීමට (හෝ භාරදීමට ඇති බැඳීම්) නොමැතිකමයි. උදාහරණවලට භාණ්ඩ හා සේවා සඳහා කලින් ගෙවීම්, කීර්තිනාමය, අස්පෘශ්‍ය වත්කම්, තොග, දේපළ, පිරියත සහ උපකරණ, වත්කම පාවිච්චි කිරිමේ හිමිකම සහ මූල්‍ය නොවන වත්කමක් භාරදීමෙන් පියවනු ලැබීමට ඇති ප්‍රතිපාදන.

## බලපැවැත්වෙන දිනය සහ සංක්‍රාන්තිය

....

60ණ 2016 අප්‍රේල් මස නිකුත් කරන SLFRS 16 කල්බදු, 16 ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

## LKAS 23 ණය ගැණුම් පිරිවැය

6 වැනි ඡේදය සංශෝධනය කළ අතර 20 ඇ ඡේදය අළුතින් එකතු කරයි.

### නිර්වචන

...

6 ණය ගැණුම් පිරිවැයට පහත සඳහන් දෑ ඇතුලත් විය හැකිය.

(අ) ...

(ආ) ~~LKAS 17~~ SLFRS 16 - *කල්බදු වලට* අනුව හඳුනාගත් ~~මූල්‍ය~~ කල්බදු වගකීම් සම්බන්ධයෙන් ~~මූල්‍ය ශාස්තු~~ පොළිය

(ඉ) ...

### බලපැවැත්වෙන දිනය

...

29ඇ 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16හි, 6 ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

## LKAS 32 - *මූල්‍ය සාධනපත්‍ර ඉදිරිපත් කිරීම*

97 S ඡේදය අළුතින් එකතු කරයි.

### බලපැවැත්වෙන දිනය සහ සංක්‍රාන්තිය

....

97 S 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 *කල්බදු*, AG9 සහ AG10 ඡේද සංශෝධනය කර ඇත. අස්තිත්වයක් මෙම SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධිත ව්‍යවහාර කළයුතු වේ.

## LKAS 37 *ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් සහ අසම්භාව්‍ය වත්කම්*

5 ඡේදය සංශෝධනය කරන අතර 102 ඡේදය අළුතින් එකතු කරයි.

### විෂය පථය

....

5 නිශ්චිත ආකාරයක ප්‍රතිපාදන, අසම්භාව්‍ය වගකීම් හෝ අසම්භාව්‍ය වත්කම් සම්බන්ධයෙන් වෙනත් ප්‍රමිතියකින් ක්‍රියාකරන්නේ නම්, අස්තිත්වයක් මෙම ප්‍රමිතිය වෙනුවට එම ප්‍රමිතිය ව්‍යවහාර කරයි. උදාහරණ ලෙස සමහර ප්‍රතිපාදන වර්ග පහත දක්වෙන ප්‍රමිතිවල සාකච්ඡා කෙරේ.

(අ) ...

(ආ) කල්බදු (SLFRS 16 *කල්බදු* බලන්න). කෙසේ වුවද SLFRS 16 න් නිර්වචන කළ පරිදි කල්බද්ද ආරම්භක දිනට පෙර භාරක වන ඕනෑම කල්බද්දකට මෙම ප්‍රමිතිය ව්‍යවහාර කරන එවැනි අවස්ථාවකට මෙම ප්‍රමිතිය ව්‍යවහාර කරයි. භාරක වී තිබෙන SLFRS 16 හි 6 ඡේදයට අනුව ගිණුම්ගත කළ අඩු වටිකම්කින් පාදක වූ වත්කමේ කල්බදු සඳහා සහ කෙටිකාලීන කල්බදු වලට මෙම ප්‍රමිතිය ව්‍යවහාර කරයි.

(ඇ) ...

### බලපැවැත්වෙන දිනය

...

102 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16හි 5 ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධනය ව්‍යහාර කළයුතු වේ.

## LKAS 38 අස්පෘශ්‍ය වත්කම්

| |
|---|
| 3, 6 සහ 113 ඡේද සංශෝධනය කරන අතර SLFRS 15 මගින් සංශෝධන කළ 114 ඡේදය සංශෝධනය කරයි. 130ඛ ඡේදය අළුතින් එකතු කරයි. |

### විෂය පථය

...

3 වෙනත් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතියක් නිශ්චිත අස්පෘශ්‍ය වත්කම් වර්ගයක් සඳහා ගිණුම්කරණය නිර්දේශ කරයි නම්, අස්තිත්වය විසින් මෙම ප්‍රමිතිය වෙනුවට එම ප්‍රමිතිය ව්‍යවහාර කරයි. උදාහරණ ලෙස මෙම ප්‍රමිතිය පහත දැක්වෙන ඒවාට ව්‍යවහාර නොවේ.

(අ) ...

(ඇ) SLFRS 16 *කල්බදු වලට* අනුව ගිණුම්ගත කළ අස්පෘශ්‍ය වත්කම් වල කල්බදු

(ඇ) ...

6 චලන චිත්‍රපට සේයා වීඩියෝ පටි සහ නාට්‍ය අත්පිටපත් සහ ස්වාධිකාරය යන අයිතම සඳහා බලපත්‍ර යටතේ කල්බදු ගැනුම්කරුවෙක් තබාගන්නා හිමිකම් SLFRS 16 විෂය පථයෙන් ඉවත්කර ඇති අතර මෙම ප්‍රමිතියේ විෂය පථයට ගැනේ.

...

### විශ්‍රාම ගැන්වීම සහ ඉවත් කිරීම

...

**113 අස්පෘශ්‍ය වත්කමක් ඉවත්කිරීමෙන් පැන නගින් ලාභය හෝ අලාභය, ශුද්ධ විකුණුම් මිලක් ඇත්නම් එය වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස නිශ්චය කළයුතුය. එය වත්කම ඉවත් කරන විට ලාභයක් හෝ අලාභයක් ලෙස හඳුනාගත යුතුයි. (~~LKAS 17~~ SLFRS 16 හි අවශ්‍යතා අනුව විකුණු සහ ප්‍රතිකල්බදුකරණ යටතේ වෙනත් ආකාරයක හඳුනා ගැනීමක් හැර) ප්‍රතිලාභ, ආදායම් ලෙස වර්ගීකරණය නොකළ යුතුවේ.**

114 අස්පෘශ්‍ය වත්කමක් ඉවත් කිරීම විවිධ ආකාරයට සිදුවිය හැකිය. (උදාහරණ - විකිණීම, මූල්‍ය කල්බද්දකට ඇතුලත්වීම හෝ ප්‍රදාන යන ආදී මඟින්). මෙවැනි වත්කමක් ඉවත් කරන දිනය, අස්තිත්වය SLFRS 16 ගණුදෙනුකරුවන් සමග ඇති කරගත් ගිවිසුම්වල අයභාරය අනුව කාර්යසාධන බැඳීම් ඉෂ්ඨ වන දිනය නිශ්චය කිරිම සඳහා අවශ්‍යතා සමඟ ග්‍රාහක එම වත්කමේ පාලනය ලබා ගත් දිනයයි. SLFRS 16 විකුණා ප්‍රතිකල්බදුකරණයක් මගින් ඉවත්කිරීමට ව්‍යහාර කරයි.

### සංක්‍රාන්ති ප්‍රතිපාදන සහ බලපැවැත්වෙන දිනය

....

130ක 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 හි 3, 6, 113 සහ 114 ඡේද සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධන ව්‍යවහාර කළයුතු වේ.

## LKAS 39 මූල්‍ය සාධන පත්‍ර හඳුනාගැනීම සහ මැනීම

| |
|---|
| SLFRS 9 හි මූල්‍ය සාධන පත්‍ර අනුගමනය නොකරන අස්තිත්වයක් සඳහා 2 ඡේදය සංශෝධනය කරන අතර 103ඍ ඡේදය අළුතින් එකතු කරයි. SLFRS 9 අනුගමනය කරන අස්තිත්වයක් සඳහා LKAS 39 සංශෝධනය නොකරයි. |

## විෂයපථය

2 **සියළුම අස්තිත්වයන් විසින් සියළුම වර්ගවල මූල්‍ය සාධනපත්‍ර සඳහා පහත සඳහන් දෑ හැර මෙම ප්‍රමිතිය ව්‍යවහාර කළයුතු වේ.**

(අ) ...

(ආ) **SLFRS 16 කල්බදු අදාලවන කල්බදු යටතේ හිමිකම් සහ බැඳීම්. කෙසේ වෙතත්:**

**(i) බදු දීමනාකරු විසින් හඳුනා ගනු ලැබූ අත්හැරීම් සහ හානිකරණයට යටත් වන ලැබිය යුතු මූල්‍ය කල්බදු (එනම් මූල්‍ය කල්බදුවල ශුද්ධ ආයෝජනය) සහ ලැබිය යුතු මෙහෙයුම් කල්බදු සඳහා වූ මෙම ප්‍රමිතියේ ප්‍රතිපාදන (15-37, 58, 59, 63 -65 සහ අ පරිශිෂ්ඨයේ AG36-AG52 සහ AG84-AG 93 ඡේද බලන්න);**

**(ii) මෙම ප්‍රමිතියේ 39 ඡේදය ඇති අත්හැරීම් ප්‍රතිපාදනවලට යටත්වන කල්බදු ගැනුම්කරු විසින් හඳුනාගත් ~~ලැබිය යුතු මූල්‍ය~~ කල්බදු වගකීම්;**

**(iii) ...**

## බලපැවැත්වෙන දිනය සහ සංක්‍රාන්තිය

...

103ඪ 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16, 2 සහ AG33 ඡේද සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධන ව්‍යවහාර කළයුතු වේ.

# LKAS 40 *ආයෝජන දේපළ*

LKAS 40 *ආයෝජන දේපළවල* දී ඇති විස්තීර්ණ වෙනස්වීම්වලට මෙම ප්‍රමිතියේ සම්පූර්ණ පාඨය අන්තර්ගතය ඇ පරිශිෂ්ඨයේ අවසානයේ නැවත ඉදිරිපත් කළ යෝජිත වෙනස්කම් සමග දී ඇත.

# LKAS 41 *කෘෂිකර්මය*

2 ඡේදය සංශෝධනය කරන අතර 64 ඡේදය අළුතින් එකතු කරයි.

## විෂයපථය

....

2 මෙම ප්‍රමිතිය පහත දැක්වෙන ඒවාට ව්‍යවහාර නොවේ.

(අ) ...

(ඊ) කෘෂිකාර්මික ක්‍රියාකාරකමක් සම්බන්ධයෙන් ඉඩමක කල්බද්දකින් පැන නගින වත්කම් පාවිච්චි කිරීමේ හිමිකම (SLFRS 16 *කල්බදු* බලන්න.)

...

## බල පැවැත්වෙන දිනය සහ සංක්‍රාන්තිය

64 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 හි, 2 ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

# IFRIC 1 *පවතින බලය නොපැවරීම්, ප්‍රතිසංස්කරණ සහ සමාන වගකීම්වල වෙනස්වීම්*

යොමු ඡේදය සංශෝධනය කරයි.

## යොමුවන්

- SLFRS 16 කල්බදු
- LKAS 1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම
- ...

2 ඡේදය සංශෝධනය කරන අතර 9ආ ඡේදය අළුතින් එකතු කරයි.

## විෂය පථය

2 මෙම අර්ථ නිරූපනය පහත සඳහන් දෙකෙන්ම ඕනෑම පවතින බලය නොපැවරීම, ප්‍රතිසංස්කරණය හෝ ඒ සමාන වගකීමක මැනීමෙහි වෙනස් කිරීමකට ව්‍යවහාර කරයි.

(අ) LKAS 16 අනුව දේපළ, පිරියත සහ උපකරණ අයිතමයක පිරිවැයේ කොටසක් වශයෙන් හෝ SLFRS 16 අනුව වත්කම පාවිච්චි කිරිමේ හිමිකමක පිරිවැයේ කොටසක් වශයෙන් හඳුනාගැනීම; සහ

(ආ) ...

## බලපැවැත්වෙන දිනය

....

9ආ 2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 හි, 2 ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

# IFRIC 12 *සේවා සහන එකඟ වීම්*

යොමු ඡේදය සංශෝධනය කරයි.

## යොමුවන්

- SLFRS 15 *ගණුදෙනුකරුවන් සමග ඇතිකරගත් ගිවිසුම්වල අයභාරය*
- SLFRS 16 කල්බදු
- ...
- ඉවත්කරන ලදී
- ...
- ඉවත්කරන ලදී

28ඊ ඡේදය අළුතින් එකතු කරයි.

## බලපැවැත්වෙන දිනය

...

28ඊ අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16, AG 8 සහ ආ පරිශිෂ්ඨය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

අ පරිශිෂ්ඨයේ, AG8 සංශෝධනය කරයි.

## අ පරිශිෂ්ඨය

## විෂය පථය (5 ඡේදය)

...

AG8 AG7(අ) ඡේදයේ විස්තර කර වෙන්කළ යටිතල පහසුකම් හෝ AG7(ආ) ඡේදයේ විස්තර කර නිගමනය නොකළ උපකාරක සේවා සැපයීමට භාවිතා කළ පහසුකම් භාවිතා කිරීමට හිමිකමක් ක්‍රියාත්මක කරන්නාට තිබිය හැකිය. දෙයාකාරයටම, ක්‍රියාත්මක කරන්නාට සහතිකවන්නාගෙන් කල්බද්දකට හරයක තිබිය හැකි එසේ නම් එය SLFRS 16 ප්‍රකාරව ගිණුම්ගත කළයුතු වේ.

## SIC - 29 *සේවා සහන එකඟවීම්* හෙළිදරව් කිරීම්

යොමු ඡේදය සංශෝධනය කරයි.

## යොමුවන්

- SLFRS 16 *කල්බදු*
- ...
- ඉවත් කරන ලදී
- ...

5 ඡේදය සංශෝධනය කරයි.

## නිකුත් කිරීම

...

5 සමහර සේවා සහන එකඟවීම්වල සම්බන්ධ සමහර පැතිකඩ සහ හෙළිදරවු කිරීම් දැනට පවතින ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත මගින් දැනටමත් අවධානයට ලක් කරයි (උදාහරණ - දේපළ, පිරියත සහ උපකරණ අයිතම මිලදී ගැනීමට LKAS 16 ව්‍යවහාර කරයි. වත්කම් වල කල්බදුවලට SLFRS 16 ව්‍යවහාර කරන අතර අස්පෘශ්‍ය වත්කම් අත්පත්කර ගැනීමට LKAS 38 ව්‍යවහාර කරයි). කෙසේ නමුත් LKAS 37 ව්‍යවහාර කරන භාරක ගිවිසුම් හැර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතවල අවධානයට ලක්කර නොමැති ඉටුකිරීම් ගිවිසුම් සේවා සහන එකඟවීමක් ඇතුලත් කලහැකිය. එම නිසා මෙම අර්ථනිරූපනය සේවා සහන එකඟවීම්වල අමතර හෙළිදරවු කිරීම් ආමන්ත්‍රණය කරයි.

බලපැවැත්වෙන දිනය ඡේදය සංශෝධනය කරයි.

## බලපැවැත්වෙන දිනය

...

2012 ජනවාරි 01 දින හෝ ඊට පසු ආරම්භක වාර්ෂික කාලපරිච්ඡේද සඳහා 6(ඉ) සහ 6අ ඡේදවල සංශෝධන අස්තිත්වයක් ව්‍යවහාර කළයුතු වේ. අස්තිත්වයක් පෙර කාලපරිච්ඡේදය සඳහා IFRIC 12 ව්‍යවහාර කරයි නම්, එම කාලපරිච්ඡේදය සඳහා සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16හි, 5 ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්යක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

## SIC 32- *අස්පෘශ්‍ය වත්කම් - වෙබ් ජාල පිරිවැය*

යොමු ඡේදය සංශෝධනය කරයි.

## යොමුවන්

- ...
- SLFRS 15 ගණුදෙනුකරුවන් සමග ඇතිකරගත් ගිවිසුම්වලින් අයභාරය
- SLRS16 කල්බදු
- ...
- ~~LKAS 17 කල්බදු~~
- ...

SLFRS 15 මගින් සංශෝධන කළ 6 ඡේදය සංශෝධනය කරයි.

## නිකුත් කිරීම

......

6 සාමාන්‍ය ව්‍යාපාරික තත්වයක් තුල විකිණීමක් සඳහා (LKAS 2 සහ SLFRS 15 බලන්න) හෝ SLFRS 16 ප්‍රකාරව ගිණුම් ගත කළ අස්පෘශ්‍ය වත්කම්වල කල්බදු සඳහා අස්තිත්වයක් විසින් තබා ගන්නා අස්පෘශ්‍ය වත්කම්වලට LKAS 38 ව්‍යවහාර නොකරයි. ඒ අනුව සංවර්ධනය මත හෝ වෙනත් අස්තිත්වයකට විකිණීම සඳහා වෙබ්ජාල මෙහෙයුම (වෙබ් ජාල මෘදුකාංග හෝ) හෝ SLFRS 16 ප්‍රකාරව ගිණුම්ගත කළ වියදමකට මෙම අර්ථනිරූපණය ව්‍යවහාර නොකරයි.

බලපැවැත්වෙන දිනයේ ඡේදය සංශෝධනය කරයි.

## බලපැවැත්වෙන දිනය

...

2014 ජුනි නිකුත් කළ SLFRS 15 *ගණුදෙනුකරුවන් සමග ඇතිකරගත් ගිවිසුම්වල අයභාරය* යොමු කොටස සහ 6 ඡේදය සංශෝධන කර ඇත. අස්තිත්වයක් SLFRS 15 ව්‍යවහාර කරන විට, එම සංශෝධනය ව්‍යවහාර කළයුතුයි.

2016 අප්‍රේල් මස නිකුත් කළ SLFRS 16 හි 6 ඡේදය සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 16 ව්‍යවහාර කරන විට, එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

# LKAS 40 - *ආයෝජන දේපළ*

SLFRS 15 මඟින් සංශෝධනය කළ LKAS 40 - ආයෝජන දේපළවලට දී ඇති පෘථුල වෙනස්වීම් මෙම ප්‍රමිතයේ සම්පූර්ණ පාඨය යෝජිත වෙනස්වීම් සමඟ නැවත ඉදිරිපත් කර තිබේ. අළුත් පාඨ යටින් ඉරිගසා ඇති අතර ඉවත්කළ පාඨ ඉරකින් කපා තිබේ.

## අරමුණ

1. මෙම ප්‍රමිතයේ අරමුණ වන්නේ ආයෝජන දේපළ සඳහා ගිණුම්කරණය කළ යුතු ආකාරය සහ අදාළ හෙළි කිරීමේ අවශ්‍යතා නියම කිරීමයි.

## විෂය පථය

2. **ආයෝජන දේපළ හඳුනාගැනීමේදී, මැනීමේදී හා හෙළි කිරීමේදී මෙම ප්‍රමිතය ව්‍යවහාර කළයුතුය.**

3. [ඉවත් කරන ලදී]

4. මෙම ප්‍රමිතය පහත දෑ වලට අදාළ නොවේ.

(අ) කෘෂිකාර්මික කටයුතුවලට සම්බන්ධ ජීව විද්‍යාත්මක වත්කම් (LKAS 41 *කෘෂිකර්මය* සහ LKAS 16 - *දේපළ, පිරියත සහ උපකරණ* බලන්න); සහ

(ආ) ඛණිජ හිමිකම්, සහ තෙල්, ස්වාභාවික වායු සහ ඒ හා සමාන පුනරුත්පාදනය නොවන ඛණිජ සංචිත

## නිර්වචන

**5. පහත දැක්වෙන පද නිශ්චිතව දක්වා ඇති තේරුම් සමඟ මෙම ප්‍රමිතයෙහි භාවිතා වේ.**

***ධාරණ අගය*** **යනු වත්කමක් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ හඳුනාගන්නා වටිනාකම වේ.**

***පිරිවැය*** **යනු වත්කමක් අත්පත් කරගත් හෝ ඉදිකරන අවස්ථාවේ එය අත්පත් කරගැනීම පිණිස ගෙවන ලද මුදල් හෝ මුදල් හා සමාන දෑ වල ප්‍රමාණය හෝ දෙන ලද වෙනත් ප්‍රතිෂ්ඨාවක සාධාරණ වටිනාකම හෝ අදාල අවස්ථාවන්හිදී මූලිකව පිළිගත් අනිකුත් SLFRSs වල නිශ්චිත අවශ්‍යතාවයන්ට අනුකූලව වත්කමට අදාල වූ මුදලයි. උදා : SLFRS 2** ***කොටස් පදනම්කර ගෙවීම්.***

***සාධාරණ වටිනාකම*** **යනු මනින දිනයේදී වෙළෙඳපොළ සහභාගිවන්නන් අතරේ ක්‍රමවත් ගණුදෙණුවක් තුල වත්කමක් විකිණීමෙන් ලැබෙන හෝ වගකීමක් හුවමාරු කිරීමට ගෙවන මිළ වේ (SLFRS 13** ***සාධාරණ වටිනාකම මැනීම*).**

***ආයෝජන දේපළ*** **යනු බදු කුළී ඉපයීම හෝ ප්‍රාග්ධන වටිනාකම වැඩිවීම හෝ ඒ දෙකම සඳහා (අයිතිකරුවන් විසින් හෝ ~~මූල්‍ය කල්බදු~~ වත්කම පාවිච්චි කිරීමේ හිමිකම වශයෙන් බදු ගැනුම්කරු විසින්) තබාගෙන ඇති පහත සඳහන් දෑ සඳහා හැර දේපළ (ඉඩම් හෝ ගොඩනැගිල්ලක් හෝ ගොඩනැගිල්ලකින් කොටසක් හෝ ඒ දෙකම) වේ.**

**(අ) නිෂ්පාදනයේදී, භාණ්ඩ හෝ සේවා සැපයීමේදී හෝ පරිපාලන කාර්යයේදී භාවිතා කරන; හෝ**

**(ආ) සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී විකුණනු ලබන දේපළ.**

***අයිතිකරු - පදිංචිගත දේපළ*** **යනු නිෂ්පාදිත හෝ භාණ්ඩ හා සේවා සැපයීමේදී හෝ පරිපාලන කටයුතුවලදී හෝ භාවිතා කිරීමට තබාගන්නා (අයිතිකරු විසින් හෝ බදු ගැනුම්කරු විසින් ~~මූල්‍ය කල්බදු~~ වත්කම පාවිච්චි කිරීමේ හිමිකම වශයෙන් ) දේපළ වේ.**

## ආයෝජන දේපළ හෝ අයිතිකරු - පදිංචිගත දේපළ වශයෙන් වර්ගීකරණය

6. [ඉවත් කරන ලදී]

7. ආයෝජන දේපළ බදුකුළී ඉපයීම හෝ ප්‍රාග්ධන වටිනාකම වැඩිවීම හෝ ඒ දෙකම සඳහා තබා ගැනේ. එම නිසා අස්තිත්වය සතු අනෙකුත් වත්කම් වලින් ස්වාධීනව ආයෝජන දේපළ මගින් විශාල ලෙස මුදල් ප්‍රවාහයක් උත්පාදනය කරයි. මෙය අයිතිකරු පදිංචිගත දේපළවලින් ආයෝජන දේපළ වෙන්කොට දක්වයි. නිෂ්පාදනය හෝ භාණ්ඩ හෝ සේවා සැපයීම (හෝ පරිපාලන කාර්යයන් සඳහා දේපළ භාවිතය) දේපළ මගින් පමණක්ම නොවන නමුත් නිෂ්පාදනය හා සැපයීම් ක්‍රියාවලියේ භාවිතා කරන අනෙක් වත්කම් මගින්ද මුදල් ප්‍රවාහයන් ජනනය කෙරේ. අයිතිව තිබෙන අයිතිකරු පදිංචිගත දේපළවලට LKAS 16 ව්‍යවහාර කරන අතර වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් වශයෙන් බදු ගැනුම්කරු විසින් තබාගන්නා අයිතිකරු පදිංචිගත දේපළවලට SLFRS 16 ව්‍යවහාර කරයි.

8. පහත දැක්වෙන දෑ ආයෝජන දේපළ සඳහා උදාහරණ වේ.

(අ) සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී කෙටිකාලීනව විකුණා දැමීමට වඩා දිගුකාලීනව ප්‍රාග්ධන වටිනාකම වැඩිවීම සඳහා තබාගෙන ඇති ඉඩම්;

(ආ) වර්තමානයේදී තීරණය නොකරන ලද නමුත් අනාගතයේදී පාවිච්චිය සඳහා තබාගෙන ඇති ඉඩම් (යම් අස්තිත්වයක් සතු ඉඩමක් අයිතිකරු පදිංචිගත දේපළක් ලෙස භාවිතා කරන්නේද නැතහොත් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු වලදී කෙටිකාලීනව විකුණා දමන්නේද යන්න තීරණය කර නොමැති නම්, එම ඉඩම ප්‍රාග්ධන වටිනාකම වැඩිවීම සඳහා තබාගන්නක් ලෙස සැලකේ);

(ඇ) අස්තිත්වය සතු ගොඩනැගිල්ලක්, (හෝ ~~මූල්‍ය කල්බදු යටතේ~~ වාර්තා කරන අස්තිත්වය තබාගෙන ඇති ගොඩනැගිල්ලකට සම්බන්ධයෙන වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් ) සහ මෙහෙයුම් කල්බදු යටතේ එකක් හෝ වැඩිවාර ගණනක් බදු දී ඇති විට;

(ඈ) මෙහෙයුම් කල්බදු යටතේ එකක් හෝ වැඩිවාර ගණනාවක් බදු දීමට තබාගෙන ඇති හිස් ගොඩනැගිල්ලක්;

(ඉ) ආයෝජන දේපළක් ලෙස අනාගතයේදී ප්‍රයෝජනයට ගැනීම සඳහා ඉදිකරන ලද හෝ සංවර්ධනය කළ දේපළ;

9. පහත සඳහන් දෑ ආයෝජන දේපළ නොවන අයිතමයන් සඳහා උදාහරණ වන අතර ඒ නිසා ඒවා මෙම ප්‍රමිතයේ විෂය පථයෙන් බැහැර කෙරේ.

(අ) සාමාන්‍ය ව්‍යාපාරික කටයුතු තුළදී විකිණීම සඳහා තබාගෙන ඇති හෝ එවැනි විකිණීමක් සඳහා ඉදිකිරීම හෝ සංවර්ධන ක්‍රියාවලියේ ඇති දේපළ (LKAS 2- තොග බලන්න) උදාහරණ වශයෙන් නැවත විකිණීම සහ සංවර්ධනය සඳහා නුදුරු අනාගතයේදී බැහැර කිරීමේ අරමුණින් අත්පත් කරගත් දේපළ.

(ආ) <u>[ඉවත් කරන ලදී]</u>

(ඇ) අයිතිකරු - පදිංචිගත දේපළ වශයෙන් (LKAS 16 සහ <u>SLFRS 16</u> බලන්න) අනාගත භාවිතය සඳහා තබාගෙන ඇති දේපළ ඇතුලත්ව (අනෙකුත් දෑ අතරෙහි) අයිතිකරු පදිංචිගත දේපළ අනාගත වර්ධනය සඳහා සහ පසු අයිතිකරු පදිංචිගත දේපළ වශයෙන් තබාගන්නා දේපළ, සේවකයන් විසින් පාවිච්චියට ගනු ලබන දේපළ (වෙළඳපොළ අනුපාතික මත බදු කුලියක් සේවකයන් විසින් ගෙවූවද, නොගෙව්වද) සහ බැහැර කිරීමට අපේක්ෂිතව පවතින අයිතිකරු පදිංචිගත දේපළ

(ඈ) <u>[ඉවත් කරන ලදී]</u>

(ඉ) මූල්‍ය කල්බද්දක් යටතේ වෙනත් අස්තිත්වයකට කල්බදු දී ඇති දේපළ.

10. ඇතැම් දේපළ තුළ කොටසක් බදු කුලී ඉපයීමට හෝ ප්‍රාග්ධන වටිනාකම වැඩිවීමට තබාගෙන ඇති අතර තවත් කොටසක් නිෂ්පාදනය හෝ භාණ්ඩ හෝ සේවා සැපයීම සඳහා හෝ පරිපාලන කාර්යයන් සඳහා තබාගනී. මෙම කොටස් වෙන් වෙන් වශයෙන් විකුණනු ලබයි නම් (හෝ මූල්‍ය කල්බදු යටතේ වෙන් වෙන් වශයෙන් කල්බද්දට දෙයිනම්) අස්තිත්වයක් විසින් එම කොටස් සඳහා වෙන් වෙන් වශයෙන් ගිණුම් තබයි. කොටස් වෙන් වෙන් වශයෙන් විකුණනු නොලබයි නම්, එම දේපළ ආයෝජන දේපළක් ලෙස සලකන්නේ සැලකිය යුතු තරම් නොවන කොටසක් පමණක් නිෂ්පාදනය හෝ භාණ්ඩ හෝ සේවා සැපයීම හෝ පරිපාලන කාර්යය සඳහා පවත්වා ගන්නේ නම් පමණි.

11. ඇතැම් අවස්ථාවලදී, අස්තිත්වය මඟින් තබාගෙන ඇති දේපළ භාවිතා කරන්නන් වෙත උපයෝගී සේවා සපයනු ලබයි. අස්තිත්වයක් විසින් එවැනි දේපළක් ආයෝජන දේපළක් වශයෙන් සලකනු ලබන්නේ සාපේක්ෂ වශයෙන් එම සේවා එම පිළියෙල කිරීමෙහි සමස්ථයක් ලෙස වැදගත් නොවන කොටස් වන්නේ නම් පමණි. කාර්යාල ගොඩනැගිල්ලක අයිතිකරු විසින් එම ගොඩනැගිල්ල භාවිතා කරන බදුකරු වෙත ආරක්ෂාව සහ නඩත්තු සේවා සැපයීම මෙහි උදාහරණයකි.

12. අනෙක් අවස්ථාවලදී, සපයනු ලබන සේවාව වඩාත් වැදගත් කොටසක් වේ. උදාහරණ වශයෙන් අමුත්තන්ට සේවා සපයන හෝටලයක් අස්තිත්වයක් විසින් පවත්වා ගනිමින් කළමණාකරනය කරයි නම් එම සේවාව සමස්ථයක් ලෙස වැදගත් කොටසක් වේ. එම නිසා අයිතිකරු කළමණාකරනය කරන හෝටලයක් ආයෝජන දේපළකට වඩා අයිතිකරු පදිංචිගත දේපළකි.

13. දේපළක් ආයෝජන දේපළක් ලෙස සුදුසුකම් නොලැබීම සඳහා උපයෝගී සේවාව කොතෙක් වැදගත් වේද යන්න තීරණය කිරීම අපහසු විය හැකිය. උදාහරණයක් වශයෙන් ඇතැම් විට හෝටලයක අයිතිකරු විසින් ඇතැම් වගකීම් කළමණාකරන ගිවිසුම් යටතේ තුන්වන පාර්ශවයන් වෙත පවරනු ලැබිය හැකිය. එවැනි කළමණාකරන ගිවිසුම්වල කොන්දේසි පුළුල් වශයෙන් විවිධය. එක් අන්තයක දෘෂ්ඨිකෝණය අනුව අයිතිකරු තත්වානුරූපව අක්‍රිය ආයෝජකයෙක් වේ. අයිතිකරු දෛනික පිටතින් සම්පාදනය කරගෙන හෝටලයේ මෙහෙයුම් මඟින් උත්පාදනය කරගන්නා මුදල් ප්‍රවාහයන්ගේ සැලකිය යුතු තරම් වන කර්තව්‍යයන් වෙනස්වීමකට අවකාශ තබාගෙන කටයුතු කිරීම අනෙක් අන්තයේ දෘෂ්ඨියයි.

14. දේපළක් ආයෝජන දේපළක් වශයෙන් සුදුසුකම් ලබන්නේ ද යන්න තීරණය කිරීම සඳහා විනිශ්චය අවශ්‍ය වේ. අස්තිත්වයක් ආයෝජන දේපළ නිර්වචනය ප්‍රකාර සහ 7 සිට 13 දක්වා ඇති ඡේදයන්හි සම්බන්ධිත මඟපෙන්වීම සමඟ, විනිශ්චය ඒකාකාරිව ක්‍රියාත්මක කිරීමට හැකි වන පරිදි නිර්ණායක සකස් කරයි. වර්ගීකරණය කිරීම අපහසු වන අවස්ථාවලදී මෙම නිර්ණායකය අස්තිත්වයක් විසින් අනාවරණය කිරීම 75 (ඇ) ඡේදය මඟින් අවශ්‍ය වේ.

14අ. SLFRS 03 – ව්‍යාපාර සංයෝජන විෂය පථයේ ඇතුලත් වූ වත්කමක් හෝ වත්කම් කාණ්ඩයක් හෝ ව්‍යාපාර සංයෝජනයක් අත්පත්කරගැනිමක්, ආයෝජන දේපලක් අත්පත් කරගැනිමක්ද යන්න නිශ්චය කිරිමේදි විනිශ්චයක් අවශ්‍ය වේ. එය ව්‍යාපාර සංයෝජනයක්දැයි නිශ්චය කිරිමට SLFRS 03ට යොමුව දිය යුතුවේ. මෙම ප්‍රමිතියේ 7 - 14 ඡේදවල සාකච්ජාව, දේපළ අයිතිකරු පදිංචිගත දේපළක්ද නැතහොත් ආයෝජන දේපළක්ද යන්න සහ SLFRS 3 හි නිර්වචනය කළ ආයෝජන දේපළ ඇතුලත් කර ගැනීම ව්‍යාපාර සංයෝජනයක්ද නැද්ද නිශ්චය නොකිරිමේදි සම්බන්ධ වේ. SLFRS 3 හි නිර්වචනය කළ ව්‍යාපාර සංයෝජන නිර්වචනය විශේෂිත වූ ගණුදෙණුවක් සම්පූර්ණ වේදැයි සහ මෙම ප්‍රමිතියේ නිර්වචනය පරිදි ආයෝජන දේපළ ලෙස ඇතුලත් වීම නිශ්චය කිරිමේදී ප්‍රමිත දෙකෙම වෙනවෙනම ව්‍යවහාර කිරීම අවශ්‍යවේ.

15. ඇතැම් අවස්ථාවලදී අස්තිත්වයක් විසින් කල්බදු දෙන ලද එහි පරිපාලක හෝ වෙනත් පරිපාලිතයක් විසින් භාවිතා කරනුලබන දේපළවල හිමිකාරිත්වය දරයි. ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශ තුළ එම දේපළ ආයෝජන දේපළක් ලෙස සුදුසුකම් නොලබයි. මන්දයත් සමූහය සමස්ථයක් ලෙස ගත් කළ එම දේපළ අයිතිකරු පදිංචිගත දේපළක් වන බැවිනි. කෙසේ වෙතත් එහි හිමිකාරිත්වය ඇති අස්තිත්වයේ දෘෂ්ඨි කෝණයෙන්, එම දේපළ 5 වන ඡේදයේ නිර්වචනය හා එකඟ වේ නම් එය ආයෝජන දේපළකි. එම නිසා බදු ගැනුම්කරු තම මූල්‍ය ප්‍රකාශනවල එවැනි දේපළ ආයෝජන දේපළ ලෙස සලකයි.

## හඳුනාගැනීම

**16. <u>අයිතිව ඇති</u> ආයෝජන දේපළ වත්කමක් ලෙස පහත අවස්ථාවලදී පමණක් හඳුනාගත යුතුය.**

**(අ) ආයෝජන දේපළ ආශ්‍රිත අනාගත ආර්ථික ප්‍රතිලාභ අස්තිත්වය තුළට ගලාඒමට ඉඩ පවතින විට; සහ**

**(ආ) විශ්වාසදායි ලෙස ආයෝජන දේපලෙහි පිරිවැය මැනිය හැකිවීම.**

17. මෙම හඳුනා ගැනීමේ මූලධර්ම යටතේ අස්තිත්වයක් එහි සියළුම ආයෝජන දේපළ පිරිවැය එය දරන අවස්ථාවේදීම අගය කරයි. මෙම පිරිවැය තුළ ආයෝජන දේපළක් අත්පත් කර ගැනීම සඳහා දරන ලද මූලික පිරිවැය සහ එයට එකතු කිරීමට පසුව දරන ලද පිරිවැය කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමට හෝ දේපළක් සේවා කිරීමට දරන ලද පිරිවැය අන්තර්ගත වේ.

18. 16 වන ඡේදයේ හඳුනාගැනීමේ මූලධර්මය යටතේ, අස්තිත්වයක් එවැනි දේපළ දෛනික සේවා කිරීමේ පිරිවැය එම ආයෝජන දේපලෙහි ධාරණ වටිනාකම තුල හඳුනානොගනියි. ඊට වඩා එම පිරිවැයයන් ලාභය හෝ අලාභය තුළ දරන ලද පරිදි හඳුනාගැනේ. දෛනික සේවා කිරීමේ ගාස්තු යනු මූලික වශයෙන් ශ්‍රමය සහ පාවිච්චි කරන ද්‍රව්‍ය වන අතර කුඩා කොටස්වල පිරිවැය ද අන්තර්ගත විය හැකිය. මෙම පිරිවැයයන් හි අරමුණ බොහෝ විට එම දේපළ ''අළුත්වැඩියා සහ නඩත්තු'' සඳහා දැරූ ලෙස විස්තර කිරීමයි.

19. ආයෝජන දේපළවල කොටස් ඇතැම් විට ප්‍රතිස්ථාපනය මඟින් අත්පත් කරගෙන තිබිය හැකිය. උදාහරණ වශයෙන් මුල්ම බිත්ති ප්‍රතිස්ථාපනය කිරීමෙන් ඇතුලත බිත්ති ඇතිවිය හැකිය. හඳුනාගැනීමේ මූලධර්මය යටතේ, අස්තිත්වයක් ආයෝජන දේපළක ධාරණ අගය තුළ පවත්නා ආයෝජන දේපළක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය එම හඳුනා ගැනීම් නිර්ණායකය සපිරේ නම්, පිරිවැය දරන ලද අවස්ථාවේදී හඳුනා ගනියි. ප්‍රතිස්ථාපනය කරන ලද එම කොටස්වල ධාරණ අගය මෙම ප්‍රමිතයෙහි හඳුනානොගන්නා ප්‍රතිපාදන වලට අනුව හඳුනානොගනියි.

19අ. <u>වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් වශයෙන් බදු ගැනුම්කරු විසින් තබාගන්නා ආයෝජන දේපළක් SLFRS 16 අනුව හඳුනාගැනිම කළයුතුයි.</u>

## හඳුනාගැනීමේදී මිණුම්කරණය

**20. අයිතිව ඇති ආයෝජන දේපළක් මුල්වරට එහි පිරිවැය මත මිණුම් කළ යුතුවේ. ගණුදෙනු පිරිවැය මූලික මිණුම්කරණයෙහි අන්තර්ගත කළයුතු වේ.**

21. මිලදී ගන්නා ලද ආයෝජන දේපළක පිරිවැය එහි ගැණුම් මිල සහ සෘජුවම අදාල කළ හැකි වියදම් වලින් සමන්විත වේ. සෘජුව අදාල කළ හැකි වියදම් සඳහා උදාහරණ වශයෙන් නීති සේවා සඳහා වෘත්තිය ගාස්තු, දේපළ හුවමාරු බදු සහ වෙනත් හුවමාරු පිරිවැයෙන් අන්තර්ගත වේ.

22. [ඉවත් කරන ලදි]

23. ආයෝජන දේපළක පිරිවැය පහත දැ හේතුවෙන් ඉහළ නොයයි.

(අ) ආරම්භක පිරිවැය (කළමණාකරණය විසින් අපේක්ෂා කරන ලද මෙහෙයුම් තත්වය දක්වා එම දේපළ රැගෙන ඒම සඳහා අවශ්‍යයෙන්ම දැරිය යුතු එවානම් හැර);

(ආ) එම ආයෝජන දේපලෙහි සැලසුම්ගත පදිංචිකාලය ලඟාකර ගැනීමට පෙර දරන ලද මෙහෙයුම් අලාභ; හෝ

(ඇ) දේපළ ගොඩනැගීමේදී හෝ සංවර්ධනයේදී ද්‍රව්‍ය, ශ්‍රමය හෝ වෙනත් සම්පත්හි දරන ලද අසාමාන්‍ය වටිනාකමින් යුත් අපතේයාම්.

24. ආයෝජන දේපළක් සඳහා ගෙවීම් විලම්භනය කරන්නේ නම්, එහි පිරිවැය වන්නේ අත්පිට මිල හා සමාන දෑ වේ. මෙම වටිනාකම සහ මුළු ගෙවීම් අතර වෙනස ණය කාලසීමාව තුළ පොළී වියදම ලෙස හඳුනාගැණේ.

25. [ඉවත් කරන ලදි]

26. [ඉවත් කරන ලදි]

27. මුල්‍ය නොවන වත්කමක් හෝ වත්කම් හෝ මුල්‍ය සහ මුල්‍ය නොවන වත්කම් හි සංයෝජනයක් හුවමාරු කිරීමේදී ආයෝජන දේපළ එකක් හෝ කිහිපයක් අත්පත් කරගනු ලැබිය හැකිය. පහතින් දැක්වෙන සාකච්ජාව එක් මුල්‍ය නොවන වත්කමක් තවත් එකකට හුවමාරු කිරීමට යොමු වන නමුත්, පෙර වාක්‍යයෙහි සියළුම හුවමාරු කිරීම් සඳහාත් එය අදාළ වේ. එවැනි ආයෝජන දේපළක පිරිවැය පහත කරුණු හැර අනෙක් අවස්ථාවලදී සාධාරණ වටිනාකම මත මිණුම් කෙරේ. (අ)හුවමාරු ගණුදෙනුව තුළ වාණිජ හරයක් අඩුවිට, හෝ (ආ) ලැබුනු වත්කම හෝ අත්හරින ලද වත්කමෙ හි සාධාරණ වටිනාකම විශ්වාසදායි ලෙස මැනිය නොහැකි විට. අත්පත් කරගන්නා ලද වත්කම අස්තිත්වයට අත්හරින ලද වත්කම වහාම හඳුනා නොගැනීම කළ නොහැකි වුවත් මෙම ආකාරයට මිණුම් කළයුතු වේ. අත්පත් කරගන්නා ලද වත්කම සාධාරණ වටිනාකමට මිණුම් නොකරන ලද්දේ නම් අත්හරින ලද වත්කමෙහි ධාරණ අගයට පිරිවැය මිණුම් කෙරේ.

28. හුවමාරු ගණුදෙනුවට වාණිජමය හරයක් ඇද්දැයි ගණුදෙනුවෙහි ප්‍රතිඵලයක් වශයෙන් වෙනස් වනු ඇතැයි අපේක්ෂිත අනාගත මුල්‍ය ප්‍රවාහයන් හි ප්‍රමාණය සැලකිල්ලට ගනිමින් අස්තිත්වයක් තීරණය ගනියි. පහත අවස්ථා වලදී හුවමාරු ගණුදෙනුවට වාණිජමය හරයක් පවතී.

(අ) ලැබෙන වත්කමෙහි මුල්‍ය ප්‍රවාහ ආකෘතීන්හි (අවදානම, කාලය සහ වටිනාකම) හුවමාරු කරන ලද වත්කමෙහි එම අකෘතීන්වල මුල්‍ය ප්‍රවාහයන්ගෙන් වෙනස් නම්,

(ආ) හුවමාරුවෙහි ප්‍රතිඵලයක් වශයෙන් ගනුදෙනුවෙහි වෙනස්වීම මඟින් බලපෑමට ලක්වන අස්තිත්වයේ මෙහෙයුම්වල කොටසෙහි වටිනාකම ව්‍යාපාරය නිශ්චය කරයි නම්, සහ

(ඇ) හුවමාරු කරන ලද වත්කමෙහි සාධාරණ වටිනාකමට සාපේක්ෂව (අ) හෝ (ආ) හි වෙනස වැදගත් නම්,

හුවමාරු ගණුදෙනුවට වාණිජමය හරයක් තිබේද යන්න තීරණය කිරීමේ කාර්යයේදී එම ගණුදෙනුව මඟින් අස්තිත්වයෙහි මෙහෙයුම් වලට නිශ්චිත වශයෙන් බලපාන ප්‍රමාණය බද්දෙන් පසු මුල්‍ය ප්‍රවාහයන් මඟින් නිරූපණය කළයුතුය. මෙම විශ්ලේෂණයන්හි ප්‍රතිඵලය විස්තරාත්මක ගණනය කිරීම් වලින් තොරව පැහැදිලි විය හැකිය.

29. සංසන්දනාත්මක වෙළඳපොළ ගණුදෙනු නොපවතින වත්කමක සාධාරණ වටිනාකම විශ්වාසදායි ලෙස මෙම අවස්ථාවලදී මිණුම් කළ හැකිවන්නේ (අ) එම වත්කම සඳහා විය හැකි සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු පරාසයෙහි විචලතාවය වැදගත් නොවන විට හෝ (ආ) එම පරාසය තුළ විවිධ ඇස්තමේන්තුවල සම්භාවිතාවය සාධාරණ වටිනාකම ඇස්තමේන්තු කිරීමේදී, සාධාරණ ලෙස ඇස්තමේන්තු කිරීමට හෝ භාවිතයට ගැනීම. ලැබෙන වත්කම හෝ අත්හරින ලද වත්කමෙහි සාධාරණ වටිනාකම විශ්වාසදායක ලෙස නිශ්චය කිරීමට අස්තිත්වයකට හැකිනම් ලැබෙන වත්කමෙහි සාධාරණ වටිනාකම වඩාත් පැහැදිලි ලෙස තහවුරු වන්නේ නම් හැර පිරිවැය මැනීමට අත්හරින ලද වත්කමෙහි සාධාරණ වටිනාකම භාවිතා කරයි.

29අ. වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් වශයෙන් බදුගැනුම්කරු විසින් තබාගන්නා ආයෝජන දේපළක් SLFRS 16 අනුව මුල්වරට පිරිවැයට මැනිය යුතුවේ.

## හදුනාගැනීමෙන් පසු මිණුම්කරණය

### ගිණුම්කරණ ප්‍රතිපත්තිය

**30. 32 (අ) ~~සහ 34~~ ඡේද වල දක්වන ලද ව්‍යාතිරේක සමග 33-35 ඡේදයන්හි දක්වන ලද සාධාරණ වටිනාකම් ආකෘතිය හෝ ඡේද 56 හි පිරිවැය ආකෘතිය අස්තිත්වයක් එහි ගිණුම්කරණ ප්‍රතිපත්තිය වශයෙන් තෝරාගත යුතු අතර එහි සියළුම ආයෝජන දේපළ සඳහා එම ප්‍රතිපත්තිය භාවිතා කළයුතුය.**

31 LKAS 8 *ගිණුම්කරණ ප්‍රතිපත්ති, ගිණුම්කරණ ඇස්තමේන්තුවල වෙනස්කම් හා වැරදි* මගින්, ගිණුම්කරණ ප්‍රතිපත්තීන්හි ස්වෙච්ඡාවෙන් වෙනස්කමක් සිදුකළ හැක්කේ එම වෙනස් කිරීම නිසා ගනුදෙනුවල, වෙනත් සිදුවීම්වලින් බලපෑම හෝ අස්තිත්වයේ මූල්‍ය තත්වය, මූල්‍ය කාර්යසාධනය හෝ මුදල් ප්‍රවාහ පිළිබඳව මූල්‍ය ප්‍රකාශ විශ්වාසදායක සහ වඩා අදාල තොරතුරු ලබාදීම ප්‍රතිඵලය වන්නේ නම් පමණක් ලෙස දක්වා තිබේ. සාධාරණ වටිනාකම් ආකෘතියේ සිට පිරිවැය ආකෘතියට මාරුවීම මගින් වන ප්‍රතිඵලය වඩාත් අදාල ඉදිරිපත් කිරීමක් ඇතිකරන්නේ ඉතාම කලාතුරකිනි.

32. මෙම ප්‍රමිතය මගින් මිණුම් කිරීමේ (අස්තිත්වය සාධාරණ වටිනාකම් ආකෘතිය භාවිතා කරයි නම්) හෝ හෙළි කිරීමේ (අස්තිත්වය පිරිවැය ආකෘතිය භාවිතා කරයි නම්) කාර්යය සඳහා සියළුම අස්තිත්වයන් ආයෝජන දේපළවල සධාරණ වටිනාකම නිර්ණය කිරීම අවශ්‍ය කෙරේ. පිළිගත් සහ අදාළ වෘත්තීයමය සුදුසුකම් ඇති සහ එම ප්‍රදේශයේ සහ වර්ගයේ ආයෝජන දේපළ තක්සේරු කිරීමේ මෑතකාලීන පළපුරුද්ද සහිත තක්සේරුකරුවකුගේ තක්සේරු කිරීමක් පදනම්කර අස්තිත්වයක ආයෝජන දේපළක සාධාරණ අගය නිර්ණය කිරීම දිරිගන්වන නමුත් එසේ නිර්ණය කිරීම අවශ්‍යම නොවේ.

**32අ. අස්තිත්වයකට;**

**(අ) සියළුම ආයෝජන දේපළ සඳහා සාධාරණ වටිනාකම් ආකෘතිය හෝ පිරිවැය ආකෘතිය එම ආයෝජන දේපළ ඇතුලත්ව නිශ්චිත වත්කම් සාධාරණ වටිනාකමට හෝ ප්‍රතිඵල වලින් වගකීම් වලට ඍජුව සම්බන්ධ දෑ සඳහා තෝරා ගැනීම; සහ**

**(ආ) ඉහත (අ) හි කැමැත්ත පිළිබඳව නොසලකමින් එහි අනෙකුත් සියළුම ආයෝජන දේපළ සඳහා සාධාරණ වටිනාකම ආකෘතිය හෝ පිරිවැය ආකෘතිය තෝරා ගත හැකිය.**

32ආ. සමහර රක්ෂකයන් සහ වෙනත් අස්තිත්ව, නාමික ඒකක නිකුත් කරන, ඉන් සමහර ඒකක සම්බන්ධිත ගිවිසුම් ඇති ආයෝජකයින් දරන සහ අනෙක් දෑ අස්තිත්වය දරන අභ්‍යන්තර දේපළ අරමුදල් මෙහෙයවයි. අරමුදල මගින් පවත්වා ගන්නා දේපළ කොටසක් පිරිවැයටද කොටසක් සාධාරණ වටිනාකමටද මැනීමට 32 (අ) ඡේදයේ ඉඩනොදෙයි.

32ඇ. අස්තිත්වයක් 32 (අ) ඡේදයේ විස්තර කරන ලද ප්‍රභේද දෙක සඳහා එකනෙකට වෙනස් ආකෘති තෝරා ගනියි නම් එම වෙනස් ආකෘතීන් භාවිතයෙන් මිණුම්කරන ලද වත්කම් සමූහය ආයෝජන දේපළ විකිණීමේදී සාධාරණ වටිනාකමට හඳුනාගත යුතු අතර සාධාරණ වටිනාකමෙහි සමුච්චිත වෙනස්කම් ලාභය හෝ අලාභය තුළ හඳුනාගත යුතුය. ඒ අනුව පිරිවැය ආකෘතිය යොදා ගන්නා ලද සමූහයක් තුළ පිහිටි සාධාරණ වටිනාකම ආකෘතිය යොදා ගන්නා ලද ආයෝජන දේපළක් විකුණනු ලබයි නම්, එම දේපොළෙහි සාධාරණ වටිනාකම විකුණනු ලබන දිනයට එහි සලකනු ලබන පිරිවැය වේ.

### සාධාරණ වටිනාකම් ආකෘතිය

**33. මූලික හඳුනාගැනීමෙන් පසුව සාධාරණ වටිනාකම් ආකෘතිය තෝරා ගන්නා අස්තිත්වයක්, 53 ඡේදයේ හි දක්වෙන අවස්ථාවලදී හැර සියලුම ආයෝජන දේපළ, සාධාරණ වටිනාකම් ආකෘතිය මත මිණුම් කළයුතුය.**

**34.** [ඉවත්කරන ලදි]

**35. ආයෝජන දේපළක සාධාරණ වටිනාකමෙහි වෙනස්කම් තුලින් පැන නගින ලාභ හෝ අලාභ එය පැන නැගුණු කාලපරිච්ඡේදයෙහි ලාභය හෝ අලාභය තුළ හඳුනාගත යුතුවේ.**

36 - [ඉවත්කරන ලදි]

39. [ඉවත්කරන ලදි]

40. ආයෝජන දේපළක සාධාරණ වටිනාකම SLFRS 13ට අනුව මැණීමේදි, වර්තමාන වෙළෙඳපොළ තත්වයන් යටතේ ආයෝජන දේපළ මිළ කරන විට වෙළෙඳපොළ සහභාගිවන්නන් භාවිතා කරන වර්තමාන කල්බදු සහ උපකල්පිත තුලින් බදුකුලී ආදායම අනෙකුත් දෑ අතුරින් සාධාරණ වටිනාකම පිළිබිඹු කරන බව අස්තිත්වයක් සහතික කළයුතු වේ.

40අ. වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් වශයෙන් තබාගන්නා ආයෝජන දේපළක් මැණීමට බදු ගැනුම්කරුවෙක් විසින් සාධාරණ වටිනාකම ආකෘතිය භාවිතා කරන විට, පදනම් වූ වත්කම නොව වත්කම පාවිච්චි කිරීමේ හිමිකම සාධාරණ වටිනාකමට මිණුම් කළයුතුය.

41. වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් වශයෙන් බදු ගැනුම්කරු විසින් තබාගන්නා ආයෝජන දේපළක ~~කල්බදු දේපළක දේපළ~~ පිරිවැයෙහි මූලික හඳුනාගැනීම සඳහා ~~25 වන ඡේදයේ~~ SLFRS 16 අනුව පදනමක් විශේෂයෙන් නියම කරයි. සාධාරණ වටිනාකමට අවශ්‍ය නම් අස්තිත්වයක් සාධාරණ වටිනාකම ආකෘතිය තෝරා ගන්නේ නම් ,33 වැනි ඡේදය මගින් ~~කල්බදු දේපළක්~~ වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් වශයෙන් බදු ගැනුම්කරු විසින් තබාගන්නා ආයෝජන දේපළක් නැවත මිණුම් කළයුතු බව නියම කරයි. කල්බදු ගෙවීම් වෙළඳපොළ අනුපාතයන්ට වන විට ,~~කතිකා කරගන්නාලද කල්බද්දක~~, අත්පත් කරගැනීමේදී වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් වශයෙන් බදු ගැනුම්කරු විසින් තබාගන්නා ආයෝජන දේපළක සාධාරණ වටිනාකම, අපේක්ෂිත කල්බදු ගෙවීම්වල ශුද්ධ අගය (හඳුනාගත් වගකීම් වලට අදාල දෑ ද ඇතුලත්ව) ශූන්‍යයන් විය යුතුය. මෙසේ සාධාරණ වටිනාකම වෙනස් වෙලාවක මැණීමේදි හැර, 33 වැනි ඡේදය අනුව සාධාරණ වටිනාකමට SLFRS 16 පිරිවැයට වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් (50 ඡේදයේ අවශ්‍යතා සලකා ගෙන) නැවත මැනිමේදි කිසිදු ලාභයක් හෝ අලාභයක් ජනිත නොකළ යුතුයි. මුලින් හඳුනාගැනීමෙන් පසුව සාධාරණ අගය ආකෘතිය යොදා ගැනීමට තෝරාගත් කල්හි මෙය ඇතිවෙයි.

42-47. [ඉවත් කරන ලදි]

48. විශේෂ අවස්ථාවලදී, අස්තිත්වයක් මුල්වරට ආයෝජන දේපළක් අත්පත් කරගන්නා විටදී (හෝ පවත්නා දේපළක් මුල්වරට භාවිතය වෙනස්වීමෙන් ආයෝජන දේපළක් බවට පත්වීමේදී) සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු පරාසයෙහි විවිධත්වය ඉතා ඉහල වන බවට පැහැදිලි සාක්ෂි පවතින අතර, විවිධ ප්‍රතිඵලයන්හි සම්භාවිතාවය ඇගයීම අපහසු විටදී, සාධාරණ වටිනාකමට එක් ඇස්තමේන්තුවක ප්‍රයෝජනවත්භාවය නොමැති වේ. මෙයින් අඛණ්ඩ පදනමක් මත දේපොළෙහි සාධාරණ වටිනාකම විශ්වාසදායී ලෙස මිනුම් කළ නොහැකි බව පෙන්නුම් කරයි. ( 53 වැනි ඡේදය බලන්න.)

49. [ඉවත් කරන ලදි]

50. සාධාරණ වටිනාකම් ආකෘතිය යටතේ ආයෝජන දේපළක ධාරණ වටිනාකම තීරණය කිරීමේදී අස්තිත්වයක් වෙනම වත්කම් හෝ වගකීම් වශයෙන් හඳුනාගන්නා ලද වත්කම් හෝ වගකීම් දෙවරක් ගැනීම නොකරයි. උදාහරණ වශයෙන් :

(අ) සෝපාන හෝ වායුසමීකරණ වැනි උපකරණ බොහෝ විට ගොඩනැගිල්ලක අත්‍යාවශ්‍ය අංග බැවින් සාමාන්‍යයෙන් වෙනමම දේපළ පිරියත හා උපකරණ වශයෙන් හඳුනාගැනීමට වඩා ආයෝජන දේපලෙහිම අන්තර්ගත කරමින් හඳුනාගැනේ.

(ආ) කාර්යාලයක් ගෘහභාණ්ඩ සහිත පදනමින් කල්බදු කරන්නේ නම්, කාර්යාලයෙහි සාධාරණ වටිනාකමට සාමාන්‍යයෙන් ගෘහභාණ්ඩවල අගයද අන්තර්ගත වන අතර එය එසේ වන්නේ බදුකුලී ආදායම ගෘහභාණ්ඩ සහිත කාර්යාලයට අදාල වන නිසාය. ආයෝජන දේපලෙහි සාධාරණ වටිනාකම තුළ ගෘහභාණ්ඩ ද අන්තර්ගත වන විට, අස්තිත්වය විසින් එම ගෘහභාණ්ඩ වෙනම වත්කම් ලෙස හඳුනා නොගනියි.

(ඇ) ආයෝජන දේපොළෙහි සාධාරණ වටිනාකම කලින් ගෙවූ හෝ උපචිත මෙහෙයුම් කල්බදු ආදායම බැහැර කරයි. මක් නිසාද යත් අස්තිත්වය එය වෙනමම වගකීමක් හෝ වත්කමක් ලෙස හඳුනා ගන්නා බැවිනි.

(ඈ) කල්බදු යටතේ වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් වශයෙන් බදු ගැනුම්කරු විසින් තබාගන්නා ආයෝජන දේපලෙහි සාධාරණ වටිනාකම_පවත්නා ආයෝජන දේපළ වල සාධාරණ වටිනාකම මගින් අපේක්ෂිත මුදල් ප්‍රවාහයන් (ගෙවීමට විය හැකි යැයි අපේක්ෂිත ~~අසම්භාව්‍ය කුළිය~~ විචල්‍ය කල්බදු ගෙවීම් ඇතුලත්ව) පිළිබිඹු කරයි. ඒ අනුව දේපළක් සඳහා ලබාගන්නා තක්සේරු කිරීමත් ගෙවීමට සිදුවෙතැයි අපේක්ෂිත සියළුම ගෙවීම් වලින් ශුද්ධ වේනම්, ගිණුම්කරණ කාර්යය සඳහා ආයෝජන දේපොළෙහි ධාරණ අගයට

ලබා ගැනීම හඳුනාගන්නා ලද සියළුම කල්බදු වගකීම් සාධාරණ අගය ආකෘතිය භාවිතාකර නැවත එකතුකිරීම අවශ්‍ය විය හැකිය.

51. [ඉවත්කරන ලදි]

52 ඇතැම් අවස්ථාවලදී, අස්තිත්වයක් ආයෝජන දේපළකට අදාල ගෙවීම්වල වර්තමාන අගය (හඳුනාගන්නා ලද වගකීම් වලට අදාල ගෙවීම්වලට අමතරව) අදාල මුදල් ලැබීම්වල වර්තමාන අගය ඉක්මවා යනු ඇතැයි අපේක්ෂා කරයි. අස්තිත්වයක වගකීම් හඳුනාගන්නේද යන තීරණය කිරීමට සහ, එසේ නම් එය මිණුම් කරන්නේ කෙසේද යන්න තීරණය කිරීමට LKAS 37 - *ප්‍රතිපාදන, අසම්භාව්‍යය වත්කම් සහ අසම්භාව්‍ය වගකීම්* යොදාගනී.

## සාධාරණ වටිනාකම විශ්වාසදායී ලෙස මිණුම්කිරීමට නොහැකියාව

**53. අස්තිත්වයකට ආයෝජන දේපළක සාධාරණ වටිනාකම අඛණ්ඩ පදනමක් මත විශ්වාසදායී ලෙස තීරණය කළ හැකි බවට උපමර්ධනීය කළ හැකි විශ්වාසයක් පවතී. කෙසේ වෙතත්, විශේෂ අවස්ථාවලදී අස්තිත්වයක් මුල්වරට අඛණ්ඩ පදනමක් මත විශ්වාසදායී ලෙස මැනිය නොහැකි සාධාරණ වටිනාකමක් ඇති ආයෝජන දේපළක් අත්පත් කර ගන්නා විට ( හෝ පවත්නා දේපළක් මුල්වරට භාවිතය වෙනස්වීමෙන් ආයෝජන දේපළක් බවට පත්වන විට) පැහැදිලි සාක්ෂි පවතී. මෙය, සන්සන්දනය කළහැකි වෙළඳපොල ගණුදෙනු නිතර සිදු නොවන (උදාහරණ වශයෙන් මෑතක සිදු වූ ගනුදෙනු අඩුවීම, මිල කියුම් වත්මන් නොවීම හෝ නිරීක්ෂණය කළ ගනුදෙනු මිල ගණන් විකුණුම්කරුට බලපෑම් කර විකුණා ඇති බව පෙනීයෑම්) සහ විකල්ප සාධාරණ වටිනාකම් ඇස්තමේන්තු නොපවතින (උදාහරණ වශයෙන් වට්ටම් කළ මුදල් ප්‍රවාහ ප්‍රක්ෂේපනය මත පදනම්ව) අවස්ථා වලදී පමණක් පැන නගියි. අස්තිත්වයකට ඉදිවෙමින් පවතින ආයෝජන දේපළක සාධාරණ අගය විශ්වාසදායී ලෙස තීරණය කළ නොහැකි බවට නිර්ණය කරන නමුත්, ඉදිකිරීම් නිමවූවාට පසුව, එහි සාධාරණ අගය විශ්වාසදායක ලෙස නිර්ණය කළහැකියයි බලාපොරොත්තු වේ නම් දේපලෙහි සාධාරණ අගය විස්වාසදායී ලෙස තීරණය කළහැකි වනතෙක් හෝ ඉදිකිරීම් නිමවන තෙක් (කලින් සිදුවිය හැකි දෙය අනුව) නිමවෙමින් පවතින ආයෝජන දේපළක් එහි පිරිවැයට මිනුම් කළයුතුය. අස්තිත්වයක් ආයෝජන දේපළක (නිමවෙමින් පවතින ආයෝජන දේපළක් හැර) සාධාරණ අගය අඛණ්ඩ පදනමක් යටතේ විශ්වාසදායී ලෙස නිර්ණය කළ නොහැකියැයි, නිර්ණය කරන්නේ නම් <u>අයිතිව ඇති ආයෝජන දේපළ</u> සඳහා LKAS 16 හෝ <u>වත්කම පාවිච්චි කිරීමේ</u> <u>හිමිකමක් වශයෙන් බදු ගැනුම්කරු විසින් තබාගන්නා ආයෝජන දේපළ</u> <u>සඳහා SLFRS 16</u> පිරිවැය ආකෘතිය අනුගමනය කරමින් ආයෝජන දේපළ මිණුම් කළයුතුය. ආයෝජන දේපලෙහි අවශේෂ වටිනාකම ශුන්‍ය බවට උපකල්පනය කළයුතුය. අස්තිත්වය විසින් ආයෝජන දේපළ බැහැර කරන තෙක්ම LKAS 16 හෝ <u>SLFRS 16</u> <u>නොකඩවා</u> අනුගමනය කළයුතුය.**

53අ. මීට පෙර පිරිවැයට මිණුම්කර ඇති, ඉදිවෙමින් පවතින ආයෝජන දේපළක් විශ්වාසීය ලෙස සාධාරණ අගයට මිණුම් කිරීමට හැකි වූ කල්හි, එම දේපළ එහි සාධාරණ වටිනාකමට මිණුම් කළයුතුය. දේපලෙහි ඉදිකිරීම් කටයුතු නිමවූ විට, එහි සාධාරණ වටිනාකමට විශ්වාසදායී ලෙස මිණුම් කළ හැකි යැයි අනුමාන කෙරෙයි. 53 ඡේදයට අනුව, තත්ත්වය මීට වෙනස්නම් <u>අයිතිව ඇති</u> දේපළ සඳහා LKAS 16 ට අනුකූලව හෝ <u>වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් වශයෙන් බදු ගැනුම්කරු විසින් තබාගන්නා ආයෝජන දේපළ</u> <u>සඳහා SLFRS 16 අනුකූලව</u> පිරිවැය ආකෘතිය භාවිතා කරමින් ගිණුම්ගත කළයුතුය.

53ආ. පළමු හඳුනාගැනීමේදී පමණක් ඉදිවෙමින් පවත්නා ආයෝජන දේපළක සාධාරණ අගය විශ්වාසදායී ලෙස මිණුම් කළහැකිය යන අනුමානය උපමර්දනීය කළ හැකිය. ඉදිවෙමින් පවතින ආයෝජන දේපළක්, අස්තිත්වයක් විසින් සාධාරණ අගයට මිණුම්කර ඇත්නම්, පසුව නිම වූ ආයෝජන දේපළ සාධාරණ අගයට විශ්වාසදායී ලෙස මිණුම් කළ නොහැකියයි නිගමනය කළ නොහැකිය.

54. ඉතා සුවිශේෂ අවස්ථා වලදී යම් අස්තිත්වයක් 53 ඡේදයෙහි දක්වන ලද හේතු අනුව LKAS 16 හෝ <u>SLFRS 16</u> හි පිරිවැය ආකෘතිය අනුව එහි ආයෝජන දේපළ මිණුම් කිරීමට බලකෙරෙන විට, එම අස්තිත්වය එහි අනෙකුත් සියළුම ආයෝජන දේපළ නිමවෙමින් පවතින ආයෝජන දේපළ ඇතුළුව ඒවායේ සාධාරණ වටිනාකමට මිණුම් කරයි. මෙම අවස්ථාවලදී අස්තිත්වයක් එහි එක් ආයෝජන දේපළක් සඳහා පිරිවැය ආකෘතිය භාවිතා කළත්, එම අස්තිත්වය අඛණ්ඩව එහි ඉතිරි එක් එක් දේපළ සඳහා ගිණුම්කරණය කිරීමේදී සාධාරණ වටිනාකම් ආකෘතිය භාවිතා කළයුතුය.

**55. යම් අස්තිත්වයක් ආයෝජන දේපළ මින් පෙර සාධාරණ වටිනාකම මත මිණුම්කර ඇත්නම්, එම අස්තිත්වය එහි සන්සන්දනය කළ හැකි වෙළඳපොළ ගණුදෙනු අඩු වාරගණනක් බවට පත්වූවත් හෝ වෙළඳපොළ මිල නිතර නොපවතින්නේ වුවත් අඛන්ඩව එම දේපළ ඉවත් කිරීම දක්වා (හෝ දේපළ අයිතිකරු පදිංචිගත දේපළක් බවට පත්වන තුරු, හෝ අස්තිත්වය පසුව එම දේපළ සාමාන්‍ය ව්‍යාපාරික කටයුත්තකදී විකිණීම සඳහා දේපළ සංවර්ධනය කිරීම අරඹනතෙක්) සාධාරණ වටිනාකම මත මිණුම් කළයුතුය.**

### පිරිවැය ආකෘතිය

56. ~~මුල් අවස්ථාවේ හඳුනාගැනීමෙන් අනතුරුව, පිරිවැය ආකෘතිය තෝරා ගන්නා අස්තිත්වයක් LKAS -16 හි එම ආකෘතිය සඳහා අවශ්‍ය කෙරෙන අවශ්‍යතා අනුව විකිණීම සඳහා තබාගන්නා දෑ වශයෙන් වන නිර්ණායක අනුව වර්ගීකරණය කරන ලද දෑ(හෝ ඉවත් කිරීමේ සමූහය තුළ අන්තර්ගත කොට විකිණීම සඳහා තබාගන්නා) හැරෙන්නට එහි සියළුම ආයෝජන දේපළ මිණුම් කළයුතුය. SLFRS 5 විකිණීම සඳහා තබාගන්නා ජංගම - නොවන වත්කම් හා අසන්තතික මෙහෙයුම් අනුව, විකිණීම සඳහා තබාගන්නා වත්කම් වශයෙන් වර්ගීකරණය කළ නිර්ණායකයන් තෘප්තකරන ආයෝජන දේපළ (හෝ ඉවත් කිරීමේ සමූහය තුළ අන්තර්ගත කොට විකිණීමට තබාගන්නා) SLFRS 5 අනුව මිනුම් කළයුතුය.~~

මුල්වරට හඳුනාගත් පසුව, පිරිවැය ආකෘතිය තෝරා ගන්නා අස්තිත්වයක්, ආයෝජන දේපළ;

අ. විකිණීම සඳහා තබා ගන්නා දෑ වශයෙන් වර්ගීකරණයට, නිර්ණායක සපුරන SLFRS 5 *විකිණීම සඳහා තබාගන්නා ජංගම නොවන වත්කම් සහ අසන්තතික මෙහෙයුම්* (හෝ ඉවත් කිරීමේ සමූහය තුළ අන්තර්ගත කොට විකිණීමට තබා ගන්නා) අනුව මිනුම් කළයුතුය.

ආ. SLFRS 5 අනුව විකිණීම සඳහා තබා නොගන්නා නමුත් වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් වශයෙන් බදු ගැනුම්කරු විසින් තබාගන්නේ නම් SLFRS 16 අනුව මිනුම් කළයුතුය.

ඇ. අනෙකුත් සියලුම අවස්ථාවල LKAS -16 හි පිරිවැය ආකෘතිය සඳහා අවශ්‍යතාවයන් අනුව මිනුම් කළයුතුය.

### මාරුකිරීම

57. ආයෝජන දේපළකට හෝ ආයෝජන දේපළකින් මාරුකිරීම් කළ යුත්තේ භාවිතයෙහි ඇති වටිනාකමේ වෙනසක් ඇති බවට පහත සඳහන් දෑ වලින් සාක්ෂි සපයන විටදී පමණි:

(අ) ආයෝජන දේපළක් අයිතිකරු පදිංචිගත දේපළක් බවට මාරුකිරීම සඳහා අයිතිකරුගේ පදිංචිය ආරම්භ කිරීම ;

(ආ) ආයෝජන දේපළකින් තොගවලට මාරුකිරීම සඳහා විකිණීමේ අරමුණින් සංවර්ධනය ආරම්භ කිරීම;

(ඇ) අයිතිකරු - පදිංචිගත දේපළකින් ආයෝජන දේපළක් බවට මාරුකිරීම සඳහා අයිතිකරු පදිංචිගතය අවසන් කිරීම ; හෝ

(ඉ) තොගයෙන් ආයෝජන දේපළක් බවට මාරුකිරීම සඳහා වෙනත් පාර්ශවයකට මෙහෙයුම් කල්බද්දක් ආරම්භ කිරීම ;

(ඊ) [ඉවත් කරන ලදී]

58. 57 (ආ) ඡේදය අනුව යම් අස්තිත්වයක් විකිණීමේ අරමුණින් සංවර්ධනය කිරීම ආරම්භ කළ බවට සාක්ෂි සපයන භාවිතයෙහි වෙනසක් පවතින විටදී පමණක් දේපළක්, ආයෝජන දේපළකින් තොගයට මාරුකිරීම අවශ්‍ය කෙරේ. අස්තිත්වයක් ආයෝජන දේපළක් සංවර්ධනය කිරීමෙන් තොරව ඉවත් කිරීමට තීරණය කරන විට එම දේපළ හඳුනානොගන්නා තෙක් (මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් ඉවත් කරන තෙක්) දිගින් දිගටම ආයෝජන දේපළක්, වශයෙන් සලකන අතර තොගය වශයෙන් නොසලකයි. එමෙන්ම, අස්තිත්වයක් පවතින ආයෝජන දෙපළක්, ආයෝජන දේපළ වශයෙන් අඛණ්ඩ අනාගත භාවිතයක් සඳහා ප්‍රතිසංවර්ධනය කිරීම ආරම්භ කරයි නම්, එම දේපළ ප්‍රතිසංවර්ධිත කාලය තුලදී ද ආයෝජන දේපළක් වශයෙන්ම පවතින අතර එය අයිතිකරු පදිංචිගත දේපළක් වශයෙන් නැවත වර්ගීකරණය නොකෙරේ.

59. ආයෝජන දේපළ සඳහා සාධාරණ වටිනාකම් ආකෘතිය යම් අස්තිත්වයක් යොදාගන්නා විට මතුවන ප්‍රශ්ණ හඳුනාගැනීමේ සහ මිණුම් කිරීමේ ප්‍රශ්න සඳහා 60-65 දක්වා ඡේද යොදා ගැනේ. අස්තිත්වයක් පිරිවැය ආකෘතිය යොදාගන්නා විට, ආයෝජන දේපළ, අයිතිකරු පදිංචිගත දේපළ හා තොගය අතර හුවමාරු කිරීමේදී හුවමාරු කරන දේපොළෙහි ධාරණ වටිනාකම වෙනස් නොවන අතර, මැණීමේ හා හෙළිදරව් කිරීමේ කාර්යය සඳහා එම දේපොළෙහි පිරිවැය වෙනස් නොවේ.

**60. සාධාරණ වටිනාකමට පවත්වාගන්නා ලද ආයෝජන දේපළකින් අයිතිකරු - පදිංචිගත දේපළකට හෝ තොගයට මාරු කිරීමක් සඳහා එම දේපොළෙහි සලකා බලන පිරිවැය ලෙස පසුකාලීනව LKAS 16, SLFRS 16 හෝ LKAS 2 අනුව ගිණුම්කරණය සඳහා භාවිතයෙහි වෙනස සිදු වූ දිනයට සාධාරණ අගය ගත යුතුය.**

**61. සාධාරණ වටිනාකම මත පවත්වාගන්නා ලද ආයෝජන දේපළක් බවට අයිතිකරු පදිංචිගත දේපළක් පවත්වන්නේ නම් භාවිතයෙහි වෙනස සිදුවන දිනය තෙක් අස්තිත්වය LKAS 16 අයිතිව ඇති දේපළ සඳහා සහ වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් වශයෙන් බදු ගැනුම්කරු විසින් තබාගන්නා දේපළ සඳහා SLFRS 16 භාවිතා කළයුතුය. අස්තිත්වය එම දිනට LKAS 16 හෝ SLFRS 16 අනුව දේපොළෙහි ධාරණ අගය සහ LKAS 16 යටතේ ප්‍රත්‍යාගණනය සඳහා වන ආකාරයටම සාධාරණ වටිනාකම අතර වෙනසක් සැලකිය යුතුවේ.**

62. සාධාරණ වටිනාකම මත පවත්වාගන්නා ලද ආයෝජන දේපළක් බවට අයිතිකරු පදිංචිගත දේපළක් පවත්වන දිනය දක්වා අස්තිත්වයක් එම දේපළ (වත්කම පාවිච්චි කිරීමේ හිමිකම) ක්ෂය කිරීම සහ සිදු වී ඇති ඕනෑම හානිකරණ අලාභයක් හඳුනා ගැනීම සිදුකරයි. අස්තිත්වය එම දිනට SLFRS 16 අනුව දේපොළෙහි ධාරණ අගය සහ LKAS 16 යටතේ ප්‍රත්‍යාගණනය සඳහා වන ආකාරයටම සාධාරණ වටිනාකම අතර වෙනසක් සැලකිය යුතු වේ. වෙනත් වචනවලින් කිවහොත්,

(අ) ප්‍රතිඵලය වන දේපොළෙහි ධාරණ වටිනාකම තුළ ඇතිවන ඕනෑම අඩුවීමක් ලාභය හෝ අලාභය තුළ හඳුනාගැනේ. කෙසේ වෙතත් එම දේපළ සඳහා ප්‍රත්‍යාගණනය අතිරික්තය තුළ අන්තර්ගත ප්‍රමාණය දක්වා අඩුවීම් වෙනත් විස්තීර්ණ ආදායම් තුළ හඳුනාගැනීම සහ ස්කන්ධය තුළ ප්‍රත්‍යාගණනය අතිරික්තය පහත හෙළීමක් සිදුවේ.

(ආ) ධාරණ අගයෙහි ඇතිවන ඕනෑම ප්‍රතිඵලාත්මක වැඩිවීමක් පහත පරිදි සැලකේ.

(i) එම දේපළ සඳහා පෙර හානිකරණ අලාභයක් ප්‍රතිවර්ත වැඩිවීමේ ප්‍රමාණයට වැඩිවීම ලාභය හෝ අලාභය තුළ හඳුනා ගනී. හානිකරණ අලාභයක් නොතිබූ බව නිර්ණය කර (ක්ෂය අඩුකර) තිබූ ධාරණ අගයට, ධාරණ අගය ප්‍රතිවර්ත කිරීමට අවශ්‍ය ප්‍රමාණය ලාභය හෝ අලාභය තුල හඳුනාගත් ප්‍රමාණය නොඉක්මවයි.

(ii) වැඩිවීමේ ඉතිරි කොටසක් වෙනත් විස්තීර්ණ ආදායම් වැඩිවීමක් ලෙස හඳුනා ගන්නා අතර ස්කන්ධය තුල ප්‍රත්‍යාගණන සංචිතය වැඩිකරයි. ආයෝජන දේපොළෙහි පසුව බැහැර කිරීම මත, හිමිකම් තුල අන්තර්ගත ප්‍රත්‍යාගණන අතිරික්තය රඳවාගත් ඉපැයුම් වලට මාරුකළ හැකිය. ප්‍රත්‍යාගණන අතිරික්තයෙන් රඳවාගත් ඉපැයුම් වලට මාරුකිරීම් ලාභය හෝ අලාභය හරහා සිදු නොකෙරේ.

**63. තොග වලින් සාධාරණ අගයට පවත්වාගත හැකි ආයෝජන දේපළකට මාරුකිරීමක් සඳහා එම දිනයට වත්කමේ සාධාරණ වටිනාකම සහ එහි පෙර ධාරණ අගයත් අතර ඕනෑම වෙනසක් ලාභය හෝ අලාභය තුල හඳුනාගත යුතුය.**

64. සාධාරණ අගයට පවත්වාගත හැකි ආයෝජන දේපළක්ම තොගයෙන් මාරු කිරීමකට සලකනු ලබන ආකාරය තොගය විකිණීමකදී සලකනු ලබන ආකාරය හා සංගත වේ.

**65. සාධාරණ අගයට පවත්වාගෙන යන අස්තිත්වය විසින්ම ඉදිකරන ලද ආයෝජන දේපළක ඉදිකිරීම හෝ සංවර්ධනය කිරීම සම්පූර්ණ කළවිට, එම දිනයට දේපොළෙහි සාධාරණ අගයත් පෙර ධාරණ අගයත් අතර ඕනෑම වෙනසක් ලාභය හෝ අලාභය තුල හඳුනාගත යුතුය.**

## බැහැර කිරීම්

**66. ආයෝජන දේපළක් බැහැර කිරීමේ දී හෝ ආයෝජන දේපළ ස්ථිරවම භාවිතයෙන් අස්කරගත් විට සහ එය ඉවත් කිරීමේ දී අනාගත ආර්ථික ප්‍රතිලාභ අපේක්ෂා නොකරන විට හඳුනානොගත යුතුය. (මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයෙන් ඉවත් කළයුතුය.)**

67. ආයෝජන දේපළක් ඉවත් කිරීම විකිණීමෙන් හෝ මූල්‍ය කල්බද්දකට ඇතුළත් වීමෙන් සිදුවිය හැකිය. අස්තිත්වයක් SLFRS 15 තෘප්ත කිරිමේ බැඳීමක් සම්පූර්ණ වන විට නිශ්චය කිරීමේ අවශ්‍යතාවලට අනුව ආයෝජන දේපළවල පාලනය ලබාගන්නා දිනය විකුණන ලද ආයෝජන දේපළක් ඉවත්කළ දිනයයි. ~~LKAS 17~~ SLFRS 16 මූල්‍ය කල්බදුවලට ඇතුළත්ව හෝ ප්‍රතිකල්බදුකරණයක් මගින් ඉවත් කිරීමේ දී අදාළ වේ.

68. 16 වැනි ඡේදයෙහි හඳුනා ගැනීමේ මූලධර්මයට අනුව අස්තිත්වයක් ආයෝජන දේපළක කොටසක් ප්‍රතිස්ථාපනය කිරීමේ පිරිවැය වත්කමෙහි ධාරණ අගය තුළ හඳුනාගනියි නම්, එය ප්‍රතිස්ථාපිත කොටසෙහි

ධාරණ අගය හඳුනානොගනියි. පිරිවැය ආකෘතිය භාවිතයෙන් ගිණුම්කරණය කරන ලද ආයෝජන දේපළ සඳහා, ප්‍රතිස්ථාපිත කොටස වෙනමම ක්ෂය කරන කොටසක් නොවේ. ප්‍රතිස්ථාපිත කොටසෙහි ධාරණ වටිනාකම තීරණය කිරීම ප්‍රායෝගික නොවන්නේ නම්, එය අත්පත් කරගත් හෝ ඉදිකරන ලද අවස්ථාවේ දී පිරිවැය දැක්වීමක් වශයෙන් ප්‍රතිස්ථාපනයේ පිරිවැය භාවිතා කරයි. සාධාරණ වටිනාකම් ආකෘතිය යටතේ, වටිනාකම අහිමි වූ ප්‍රතිස්ථාපනය කළයුතු කොටස් දැනටමත් පෙන්නුම් කරනවා විය හැකිය. අනෙකුත් අවස්ථාවල දී ප්‍රතිස්ථාපනය කරන කොටස් සඳහා කොපමණ සාධාරණ වටිනාකම අඩු කළයුතු ද යන්න තීරණය කිරීම අපහසු විය හැකිය. ප්‍රතිස්ථාපිත කොටස සඳහා සාධාරණ වටිනාකම අඩු කිරීමට විකල්පයක් ලෙස, එසේ කිරීම ප්‍රායෝගික නොවන්නේ නම් හැර, වත්කමෙහි ධාරණ අගයට ප්‍රතිස්ථාපිතයෙහි පිරිවැය අන්තර්ගත කොට අනතුරුව ප්‍රතිස්ථාපනයට අදාළ නොවූ විට අවශ්‍ය කෙරෙන පරිදි සාධාරණ වටිනාකම නැවත තක්සේරු කිරීම කෙරේ.

**69.** **ආයෝජන දේපළක් විශ්‍රාම ගැනීමෙන් හෝ ඉවත් කිරීමෙන් පැන නගින ප්‍රතිලාභය හෝ අලාභය බැහැර කිරීමේ ශුද්ධ ලැබීම් හා වත්කමේ ධාරණ අගය අතර වෙනස ලෙස නිශ්චය කළයුතු අතර, ලාභය හෝ අලාභය (~~LKAS 17~~ SLFRS 16 අනුව විකුණා ප්‍රතිකල්බදුකරණයක් මත අවශ්‍ය කරන්නේ නම් හැර) විශ්‍රාම ගැන් වූ හෝ ඉවත් කළ කාලපරිච්ඡේදයෙහි හඳුනාගත යුතුය.**

70. ආයෝජන දේපළක් ඉවත් කිරීම මත පැන නැගෙන ප්‍රතිලාභය හෝ අලාභය තුල ඇතුලත්ව ඇති ප්‍රතිෂ්ඨාවේ ප්‍රමාණය SLFRS 15 හි 47 - 72 ඡේදවල ගණුදෙණුකරණ මිල නිශ්චය කිරීම සඳහා අවශ්‍යතා අනුව නිශ්චය කරයි. ප්‍රතිලාභය හෝ අලාභය තුල ඇතුලත්ව ඇති ඇස්තමේන්තුගත ප්‍රතිෂ්ඨාවේ ප්‍රමාණය පසු කාලීන වෙනස්වීම් වලට SLFRS 15 හි අවශ්‍යතා අනුව ගණුදෙණුකරණ මිලෙහි වෙනස්වීම් සඳහා ගිණුම්ගත කළයුතුය.

71. ආයෝජන දේපළක් බැහැර කිරීමෙන් පසු අස්තිත්වය තබාගන්නා ඕනෑම වගකීමකට LKAS 37 හෝ වෙනත් ප්‍රමිත අදාළ පරිදි භාවිතා කරයි.

**72.** **හානිකරණ වූ ආයෝජන දේපළක් සඳහා තුන්වන පාර්ශවයකින් ලැබෙන වන්දියක්, අලාභයක් හෝ අත්හැර දැමීමක් එම වන්දිය ලැබීමක් බවට පත්වන විට දී ලාභය හෝ අලාභය තුළ හඳුනාගත යුතුය.**

73. ආයෝජන දේපළක හානිකරණයක් හෝ අලාභයන්, තුන්වන පාර්ශවයකින් ලැබෙන සම්බන්ධිත ඉල්ලීම් හෝ වන්දි ගෙවීමක් සහ ඕනෑම ප්‍රතිස්ථාපිත වත්කමක පසුව මිල දී ගැනීමක් හෝ ඉදිකිරීමක් යනාදිය වෙන වෙනම ආර්ථික ක්‍රියාකාරකම් වන අතර වෙන වෙනම පහත පරිදි ගිණුම්කරණය කෙරේ:

(අ) ආයෝජන දේපළක හානිකරණ සඳහා LKAS 36 ප්‍රකාරව හඳුනාගැනේ;

(ආ) ආයෝජන දේපළක් විශ්‍රාම ගැන්වීම් හෝ ඉවත් කිරීම මෙම ප්‍රමිතියෙහි 66 -71 ඡේද අනුව හඳුනාගැනේ;

(ඇ) හානිකරණය වූ ආයෝජන දේපළක් සඳහා තුන්වන පාර්ශවයකින් ලැබෙන වන්දියක්, අලාභයක් හෝ අත්හැර දැමීමක් එය ලැබීමක් බවට පත්වන විට ලාභය හෝ අලාභය තුළ හඳුනාගැනේ

(ඈ) ප්‍රතිසංස්කරණය කරන ලද, මිල දී ගත් හෝ ප්‍රතිසම්පාදනයක් ලෙස ගොඩනගන ලද වත්කම් ප්‍රතිසම්පාදනයක් ලෙස, පිරිවැය මෙම ප්‍රමිතයේ 20 - 29 ඡේද ප්‍රකාර ව නිර්ණය කළයුතුය.

## හෙළිදරව් කිරීම

### සාධාරණ වටිනාකම් ආකෘතිය සහ පිරිවැය ආකෘතිය

74. පහත සඳහන් කර ඇති හෙළිදරව් කිරීම් ~~LKAS 17~~ SLFRS 16 හි ඇති දැවලට අමතරව අදාළ වේ. ~~LKAS 17~~ SLFRS 16 ට අනුව ඇතුලත් වූ කල්බදු පිළිබඳව කල්බදු බදු දීමනාකරුවන්ගේ හෙළිදරව් කිරීම ආයෝජන දේපළක හිමිකරු සපයනු ලබයි. ~~මූල්‍ය හෝ මෙහෙයුම් කල්බදු යටතේ~~ වත්කම පාවිච්චි කිරීමේ හිමිකම වශයෙන් ආයෝජන දේපළක් තබාගන්නා ~~අස්තිත්වයක්~~ බදු ගැනුම්කරුවෙක් SLFRS 16 න් නියම කළ බදු ගැනුම්කරුගේ හෙළිදරව් කිරීම් දෙනු ලබන අතර, එළඹ ඇති ඕනෑම මෙහෙයුම් කල්බද්දක් සඳහා බදු දීමනාකරුගේ හෙළිදරව් කිරීම සපයනු ලබයි.

**75.** **අස්තිත්වයක් පහත දෑ හෙළිදරව් කළයුතුය :-**

**(අ)** **භාවිතා කරනුයේ සාධාරණ වටිනාකම් ආකෘතිය ද, පිරිවැය ආකෘතිය ද යන වග ;**

**(ආ)** [ඉවත් කරන ලදී]

(ඈ) වර්ගීකරණය කිරීම අපහසු වන විට (14 වැනි ඡේදය බලන්න) ආයෝජන දේපළක් අයිතිකරු පදිංචිගත දේපළකින් සහ විකිණීමට තබාගෙන ඇති දේපළවලින් සාමාන්‍ය ව්‍යාපාරික කටයුතුවලදී වෙන් කොට දැක්වීමේදී අස්තිත්වය විසින් උපයෝගී කරගන්නා ලද නිර්ණායකයන් ;

(ඇ) [ඉවත් කරන ලදී]

(ඉ) ආයෝජන දේපළක සාධාරණ වටිනාකම් ( මුල්‍ය ප්‍රකාශන තුළ මනින ලද හෝ හෙළි කරන ලද) පිළිගත් සහ අදාළ වෘත්තීය සුදුසුකම් දරන සහ අගය කෙරෙන ආයෝජන දේපොළෙහි ස්ථානය හා කාණ්ඩය පිළිබඳ මෑතකාලීන පළපුරුද්දක් සහිත ස්වාධීන තක්සේරුකරුවෙකුගේ අගය කිරීමක් මත පදනම් වූ ප්‍රමාණය වේ. එවැනි තක්සේරු කිරීමක් නොමැත්තේ නම් එම කරුණ හෙළි කළයුතු වේ ;

(ඊ) ලාභය හෝ අලාභය තුළ හඳුනාගත් පහත දෑ සඳහා වටිනාකම් -

(i) ආයෝජන දේපොළෙන් බදුකුලී ආදායම;

(ii) කාලපරිච්ඡේදය තුළ බදුකුලී ආදායම් ඉපද වූ ආයෝජන දේපළකින් පැන නගින සෘජු මෙහෙයුම් වියදම් (නඩත්තු සහ අළුත්වැඩියා ඇතුලත්ව)

(iii) කාලපරිච්ඡේදය පුරා බදුකුලී ආදායම් නොඉපදවූ ආයෝජන දේපළකින් පැන නගින සෘජු මෙහෙයුම් වියදම් (නඩත්තු සහ අළුත්වැඩියා ඇතුලුව) ; සහ

(iv) සාධාරණ වටිනාකම් ආකෘතිය යොදා ගැනෙන රැස්කිරීමක, පිරිවැය ආකෘතිය යොදාගන්නා වත්කම් එකතුවකින් ආයෝජන දේපළ විකිණීම තුළින් ලාභය හෝ අලාභය තුල හඳුනාගන්නා ලද සාධාරණ වටිනාකම් සමුච්චිතයේ වෙනස (32 (ඇ) ඡේදය බලන්න.);

(උ) ආයෝජන දේපළක් උපලබ්ධි කළ හැකි බව මත පවතින සහ සීමාකිරීම්වල ප්‍රමාණය හෝ බැහැර කිරීම් මත ආදායම් ප්‍රේෂණයන් ;

(ඌ) ආයෝජන දේපළක ගැණුම්, ඉදිකිරීම් හෝ සංවර්ධනයට වන හෝ අළුත්වැඩියා, නඩත්තු හෝ වැඩිදියුණු කිරීම්වලට වන ගිවිසුම්මය බැඳීම.

## සාධාරණ වටිනාකම් ආකෘතිය

76. 75 වැනි ඡේදයෙන් අවශ්‍ය කෙරෙන හෙළිදරව් කිරීම්වලට අමතරව 33-35 දක්වා වන ඡේද සාධාරණ වටිනාකම් ආකෘතිය අදාළ කරගන්නා අස්තිත්වයක් පහත දෑ පෙන්වමින් කාලපරිච්ඡේදයේ ආරම්භයේ දී සහ අවසානයේ දී ආයෝජන දේපොළෙහි ධාරණ අගයෙහි සන්සන්දනයක් ද හෙළිදරව් කළයුතුය :-

(අ) අත්පත් කරගැනීම සහ වත්කමක ධාරණ අගයෙහි හඳුනාගන්නා ලද පසුකාලීන වියදම් වලින් ඇතිවන එකතුවීම් වෙනමම හෙළිදරව් කරමින් එකතු කිරීම් ;

(ආ) ව්‍යාපාර සංයෝජනයන් තුළින් ප්‍රතිඵලය වන අත්පත් කරගැනීම් වලින් ඇතිවන එකතු කිරීම් ;

(ඇ) SLFRS 5 ට අනුව විකිණීම් සඳහා තබාගන්නා ලද ලෙස වර්ගීකරණය කරන ලද හෝ විකිණීම සඳහා තබාගන්නා ලද ලෙස වර්ගීකරණය කොට බැහැර කිරීම් සමූහය තුළ අන්තර්ගත කරන ලද වත්කම් සහ වෙනත් බැහැර කිරීම් ;

(ඈ) සාධාරණ වටිනාකම් ගැලපීම් වලින් ශුද්ධ ලාභ හෝ පාඩු;

(ඉ) මුල්‍ය ප්‍රකාශන විවිධ ඉදිරිපත් කිරීමේ ව්‍යවහාර මුදල්වලට සහ විදේශ මෙහෙයුම් වාර්තා කරන අස්තිත්වයේ ව්‍යවහාර මුදලට පරිවර්තනය කිරීම තුළින් ඇතිවන ශුද්ධ විනිමය වෙනස්කම් ;

(ඊ) තොග සහ අයිතිකරු පදිංචිගත දේපළ වලින් සහ ඒවා වෙතට මාරු කිරීම්; සහ

(උ) වෙනත් වෙනස්වීම්

77. ලබාගන්නා ලද ආයෝජන දේපළක තක්සේරුව මුල්‍ය ප්‍රකාශන සඳහා සැලකිය යුතු අන්දමකින් ගැලපුවහොත්, උදාහරණයක් වශයෙන්, වත්කම් හෝ වගකීම් දෙවරක් ගණන් ගැනීම මගහැරවීම සඳහා 50 වැනි ඡේදය ප්‍රකාර වෙනම හඳුනාගත් වත්කම් සහ වගකීම් නැවත එකතු කරන ලද හඳුනාගත් කල්බදු වගකීම්වල සමාහාර අගය

සහ වෙනත් සැලකිය යුතු ගැලපීම් වෙන වෙනම පෙන්වමින්, අස්තිත්වය විසින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් කර ඇති ලබාගත් තක්සේරුව හා ගලපන ලද තක්සේරුව අතර වෙනස සංසන්දනය කර පෙන්විය යුතුය.

78. 53 ඡේදයට යොමුවේ විශේෂ අවස්ථාවලදී, අස්තිත්වයක් ආයෝජන දේපළ LKAS 16 පිරිවැය ආකෘතිය හෝ SLFRS 16 ප්‍රකාරව මනිනු ලබන විට, 76 වැනි ඡේදය මගින් අවශ්‍ය කරන සංසන්දනය එම ආයෝජන දේපළට අදාළ වටිනාකම් වෙනත් ආයෝජන දේපළ වලට අදාළ වටිනාකම්වලින් වෙන්කොට හෙළිකළ යුතු ය. ඊට අමතරව අස්තිත්වයක් පහත දෑ අනාවරණය කළයුතුය :

(අ) ආයෝජන දේපොළෙහි විස්තරයක් ;

(ආ) සාධාරණ වටිනාකම විශ්වාසදායී ලෙස මැනිය නොහැක්කේ මන්ද යන්නට පැහැදිලි කිරීමක් ;

(ඇ) හැකිනම්, සාධාරණ වටිනාකම අයත්වීම වඩාත්ම ඉඩ ඇති ඇස්තමේන්තු පරාසය; සහ

(ඈ) සාධාරණ වටිනාකමට පවත්වා නොගන්නා ලද ආයෝජන දේපළ බැහැර කිරීම මත පහත දෑ අනාවරණය කළයුතුය:

(i) සාධාරණ වටිනාකමට පවත්වා නොගන්නා ලද ආයෝජන දේපළ බැහැර කිරීමට අස්තිත්වයට සිදු වූ කරුණ;

(ii) විකුණනු ලබන අවස්ථාවට එම ආයෝජන දේපොළෙහි ධාරණ අගය; සහ

(iii) හඳුනාගන්නා ලද ප්‍රතිලාභ හෝ පාඩුවල වටිනාකම.

## පිරිවැය ආකෘතිය

79. 75 වැනි ඡේදය මගින් අවශ්‍ය කෙරෙන හෙළිකිරීම්වලට අමතරව 56 ඡේදයේ දැක්වෙන පිරිවැය ආකෘතිය භාවිතා කරන අස්තිත්වයක් පහත දෑ හෙළි කළයුතුය:

(අ) භාවිතා කරන ලද ක්ෂය ක්‍රම ;

(ආ) භාවිතා කරන ලද ක්ෂය අනුපාත හෝ ප්‍රයෝජනවත් ජීවිත කාලයන් ;

(ඇ) කාලපරිච්ඡේදය ආරම්භයේ දී සහ අවසානයේ දී දළ ධාරණ අගය සහ සමුච්චිත ක්ෂය (සමුච්චිත හානිකරණ අලාභයන් සමග එකතුව);

(ඈ) පහත දෑ පෙන්වමින් ආයෝජන දේපළවල කාලපරිච්ඡේදය ආරම්භයේ හා අවසානයේ ධාරණ අගයෙහි සංසන්දනයක් :

(i) අත්පත් කරගැනීම්වලින් සහ පසුකාලීන වියදම්වල ප්‍රතිඵලයක් නිසා වත්කමක් වශයෙන් හඳුනා ගැනීමෙන් ඇතිවන එකතු කිරීම් වෙන්ව අනාවරණය කරමින් එකතු කිරීම්;

(ii) ව්‍යාපාර සංයෝජනයක ප්‍රතිඵලයක් නිසා අත්පත් කරගැනීමෙන් ඇතිවන එකතු කිරීම්;

(iii) SLFRS 5 අනුව විකිණීම සඳහා තබාගන්නා ලද ලෙස වර්ගීකරණය කරන ලද හෝ විකිණීම සඳහා තබාගන්නා ලද පරිදි වර්ගීකරණය කරන ලද ඉවත් කිරීම් සමූහය තුළ අන්තර්ගත කරන ලද වත්කම් හා අනෙකුත් ඉවත් කිරීම් ;

(iv) ක්ෂය කිරීම් ;

(v) LKAS 36 ප්‍රකාරව කාලපරිච්ඡේදය තුළ හඳුනාගන්නා ලද හානිකරණ අලාභයේ ප්‍රමාණය සහ හානිකරණ අලාභ ප්‍රතිවර්තනය කරන ලද ප්‍රමාණය ;

(vi) මූල්‍ය ප්‍රකාශන වෙනත් ව්‍යවහාර මුදලකින් ඉදිරිපත් කිරීමක් බවට පරිවර්තනය කිරීමේදී සහ විදේශීය මෙහෙයුම් වාර්තාකරණය අස්තිත්වයේ විනිමය බවට පරිවර්තනය කිරීමෙන් පැන නගින ශුද්ධ විනිමය වෙනස්කම්

(vii) තොග සහ අයිතිකරු පදිංචිගත දේපළවලින් සහ ඒවා වෙතට කරන මාරුකිරීම්; සහ

(viii) වෙනත් වෙනස්කම් ; සහ

**(ඉ) ආයෝජන දේපොළෙහි සාධාරණ වටිනාකම. 53 වැනි ඡේදයෙහි විස්තර කරන ලද විශේෂ අවස්ථාවල දී අස්තිත්වයකට ආයෝජන දේපොළෙහි සාධාරණ වටිනාකම විශ්වාසදායීව නිශ්චය කළ නොහැකි විට එම අස්තිත්වය පහත දැ හෙළි කළයුතුය:**

**(i) ආයෝජන දේපොළෙහි විස්තරයක්;**

**(ii) සාධාරණ වටිනාකම විශ්වාසදායී ලෙස මැනිය නොහැක්කේ මන්ද යන්නට කරුණු පැහැදිලි කිරීමක්;**

**(iii) හැකිනම්, සාධාරණ වටිනාකම අයත් වීමට වඩාත්ම ඉඩ ඇති ඇස්තමේන්තු පරාසය.**

## අන්තර්කාලීන ප්‍රතිපාදන

### සාධාරණ වටිනාකම් ආකෘතිය

**80. මින් පෙර LKAS 40 භාවිතා කර ඇති සහ මෙහෙයුම් කල්බදු යටතේ ආයෝජන දේපළ වශයෙන් මුල්වරට ඇතැම් සුදුසු දේපළ හිමිකම් වර්ගීකරණය කිරීමට සහ ගිණුම් තැබීමට තෝරාගන්නා අස්තිත්වයක් එම තෝරා ගැනීම මුල්වරට කරන ලද කාලපරිච්ඡේදය සඳහා රඳවාගත් ලාභයෙහි ආරම්භක ශේෂයට එම තෝරා ගැනීමෙහි බලපෑම ගැලපීමක් ලෙස හඳුනාගත යුතුය. මීට අමතරව -**

**(අ) කලින් කාලපරිච්ඡේදවල දී එහි ආයෝජන හිමිකම්වල සාධාරණ අගය ( SLFRS 13 හි සාධාරණ අගය පිළිබඳ නිර්වචන තෘප්ත කරන පදනමක් මත මිනුම්කර) මීට පෙර ප්‍රසිද්ධියේ හෙළිකර ඇත්නම් (මූල්‍ය ප්‍රකාශන තුළ හෝ වෙනත් ආකාරයකින්) අස්තිත්වය පහත දැ කිරීමට දිරිගන්වනු ලබන නමුත් අවශ්‍ය නොකෙරේ:**

**(i) ප්‍රසිද්ධියේ අනාවරණය කරන ලද එවැනි සාධාරණ වටිනාකමක් සඳහා කලින් කාලපරිච්ඡේදය සඳහා වන රඳවාගත් ඉපැයීම්වල ආරම්භක ශේෂයට ගැලපීමට; සහ**

**(ii) එම කාලපරිච්ඡේද සඳහා සංසන්දනාත්මක තොරතුරු නැවත ස්ථාපනය කිරීමට ; සහ**

**(ආ) අස්තිත්වය (අ) හි විස්තර කරන ලද තොරතුරු මීට පෙර ප්‍රසිද්ධියේ හෙළි කර නැතිනම්, අස්තිත්වය සන්සන්දනාත්මක තොරතුරු නැවත පිහිටුවීමක් නොකළ යුතු අතර එම කරුණ හෙළි කළයුතුය.**

81. මෙම ප්‍රමිතිය මගින් LKAS 8 ට වඩා වෙනස් ආකාරයක සැලකීමක් අවශ්‍ය කෙරේ. LKAS 8 මගින් සංසන්දනාත්මක තොරතුරු නැවත ස්ථාපිත කිරීමක් එසේ කිරීම ප්‍රායෝගික නොවන්නේ නම් හැර අවශ්‍ය කෙරේ.

82. අස්තිත්වයක් ප්‍රථම වරට මෙම ප්‍රමිතිය අනුගමනය කරන විට, රඳවාගත් ඉපැයීම්වල ආරම්භක ශේෂයට සිදුකරන ගැලපීම් තුළ ආයෝජන දේපළ සඳහා ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි ඇති ඕනෑම නැවත වර්ගීකරණ වටිනාකමක් අන්තර්ගත වේ.

### පිරිවැය ආකෘතිය

83. අස්තිත්වයක් ප්‍රථමවරට මෙම ප්‍රමිතිය අනුගමනය කරන විට සහ පිරිවැය ආකෘතිය භාවිතයට තෝරාගන්නා විට සිදුවන ඕනෑම ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස්වීමක් සඳහා LKAS 8 ට අදාළ කෙරේ. ගිණුම්කරණ ප්‍රතිපත්ති වෙනස් කිරීමේ බලපෑම තුළ ආයෝජන දේපළ සඳහා ප්‍රත්‍යාගණන අතිරික්තයෙහි ඇති ඕනෑම නැවත වර්ගීකරණ වටිනාකමක් අන්තර්ගත වේ.

**84. 27-29 ඡේද මගින් දැක්වෙන වත්කම් හුවමාරු ගණුදෙනුවක දී අත්පත් කරගන්නා ලද ආයෝජන දේපළක මූලික මිණුම්කිරීම අතීතානුයෝගීව ව්‍යවහාර කළ යුත්තේ අනාගත ගණුදෙනුවලට පමණි.**

**ව්‍යාපාර සංයෝජන**

**84අ. 2014 සැප්තැම්බර් නිකුත් කළ SLFRs වල වැඩිදියුණුවීම්, 14අ ඡේදය සහ 6 ඡේදයට පෙර මතෘකාවක් එකතු කර ඇත. අස්තිත්වයක් එම සංශෝධනය අනුගමනය කරන ආරම්භ පළමු කාලපරිච්ඡේදය සිට ආයෝජන දේපළවල අත්පත්කර ගැනීම සඳහා එම සංශෝධනය ඉදිරිකාලිනව ව්‍යවහාර කළයුතු වේ. ප්‍රතිඵලයක් වශයෙන් පෙර කාලපරිච්ඡේද තුල ආයෝජන දේපළවල අත්පත්කර ගැනීම සඳහා ගිණුම්කරණය ගැලපිය යුතු නොවේ. කෙසේ නමුත් අස්තිත්වයකට පවතින එම කලින් ගණුදෙණුවලට සංශෝධනය ව්‍යවහාර කිරිමට අවශ්‍යවන තොරතුරු ඇත්නම් නම් පමණක් සහ බලපවත්වන දිනයට හෝ ඊටපසු සිදුවන පළමු වාර්ෂික කාලපරිච්ඡේදයෙන් ආරම්භක දිනට පෙර ඇති වූ තනි තනි ආයෝජන දේපළවල අත්පත්කර ගැනීම්වලට සංශෝධනය ව්‍යවහාර කිරිමට තෝරා ගත හැකිය.**

## <u>SLFRS 16</u>

<u>**84ආ. අස්තිත්වයක් මුල්වරට SLFRS 16 සහ මෙම ප්‍රමිතයට සම්බන්ධ සංශෝධනය ව්‍යවහාර කිරිමේදී වත්කම පාවිච්චි කිරීමේ හිමිකම වශයෙන් තබාගන්නා ආයෝජන දේපළකට SLFRs 16 හි ඇ පරිශිෂ්ඨය සංක්‍රාන්ති අවශ්‍යතාවයන් ව්‍යවහාර කළයුතු වේ.**</u>

## බල පැවැත්වෙන දිනය

85. අස්තිත්වයක් විසින් මෙම ප්‍රමිතය 2012 ජනවාරි 01 හෝ ඉන්පසුව ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේද සඳහා ව්‍යවහාර කළයුතුය. කලින් ව්‍යාවහාරය උනන්දු කෙරේ. අස්තිත්වයක් විසින් 2012 ජනවාරි 01 ට පෙර ආරම්භ වන කාලපරිච්ඡේදයක් සඳහා මෙම ප්‍රමිතය ව්‍යවහාර කරන්නේ නම්, එම කරුණ හෙළිදරව් කළයුතුය.

85අ. [ඉවත් කරන ලදී]

85ආ. [ඉවත් කරන ලදී]

85ඇ. 2013 අප්‍රේල් නිකුත් කළ SLFRS 13, 5 ඡේදයේ සාධාරණ වටිනාකම නිර්වචනය සංශෝධනය කළ අතර 26, 29, 32, 40, 48, 53, 53ආ, 78-80 සහ 85ආ ඡේද සංශෝධනය කළ අතර 36-39, 42-47, 49, 51 සහ 75ඇ ඉවත් කරන ලදී. අස්තිත්වයක් SLFRS 13 ව්‍යවහාර කරන විට එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

85ඇ. 2014 සැප්තැම්බර් නිකුත් කළ SLFRS වල වාර්ෂික වැඩිදියුණුවීම්, 6 ඡේදයට පෙර සහ 84 ඡේදයට පසු මතෘකාව එකතු කර ඇති අතර 14අ සහ 84 අ ඡේද එකතු කර ඇත. අස්තිත්වයක් 2014 ජුලි 01 දින හෝ ඊට පසු ආරම්භ වන වාර්ෂික කාලපරිච්ඡේදය සඳහා එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ. කලින් ව්‍යවහාර කිරිම්වලට ඉඩ දේ. අස්තිත්වයක් පෙරකාලපරිච්ඡේද සඳහා මෙම සංශෝධනය ව්‍යවහාර කරන්නේ නම්, එම කරුණ හෙළිදරව් කළයුතුය.

85ඉ. 2014 ජුනි නිකුත් කළ SLFRS 15 ගණුදෙණුකරුවන් සමඟ ඇතිකරගත් ගිවිසුම් වලින් අයහාරය, 3(ආ), 9, 67, සහ 70 ඡේද සංශෝධනය කර ඇත. අස්තිත්වයක් SLFRS 15 ව්‍යවහාර කරන විට එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

85ඊ. 2016 අප්‍රේල් නිකුත් කළ SLFRS 16, අයිතිව ඇති දේපළ සඳහා සහ වත්කම පාවිච්චි කිරීමේ හිමිකමක් වශයෙන් බදු ගැනුම්කරු විසින් තබාගන්නා දේපළ යන දෙකම ඇතුලත් කිරිමට ආයෝජන දේපළ නිර්වචනය මඟින් LKAS 40 හි විෂය පථය සංශෝධනය කර ඇත. SLFRS 16හි 5, 7, 8, 9, 16, 20, 30, 41, 50, 53, 53අ, 54, 56, 60, 61, 62, 67, 69, 74, 75, 77 සහ 78 සංශෝධනය කර ඇති අතර 19අ, 29අ, 40අ, සහ 84ආ ඡේද ඒ සම්බන්ධ ශීර්ෂ සමඟ අළුතින් එකතු කර ඇත. 3, 6, 25, 26 සහ 34 ඡේද ඉවත් කරන ලදී . අස්තිත්වයක් SLFRS16 ව්‍යවහාර කරන විට එම සංශෝධනය ව්‍යවහාර කළයුතු වේ.

09-680

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.